සීමාසහිත
ලංකා විදුලි (පෞද්ගලික) සමාගම



# 2019
## වාර්ෂික වාර්තාව

# සංවර්ධනය සඳහා අපගේ මඟ

ලංකා විදුලි සමාගම එහි බෙදාහැරීම් සේවාවන්හි ඉල්ලුම සැපයුම යන අංශ දෙක පිළිබඳ කාර්යසාධනයෙහිලා සැලකිය යුතු වර්ධනයක් හා ව්‍යාපාරය පෙර වර්ෂයන්ට වඩා ගුණාත්මක සැපයුම ඒකාකාරී මිනුම් හා එහි ආරම්භයේ සිට කිසිදු ඉකුත් වර්ෂයක නොවූ විරූ ලෙස ඉහළ ගනුදෙනුකරු තෘප්තිමත්භාවය ළඟා කර ගත් බව සාඩම්බරව ප්‍රකාශ කෙරේ.





## අපගේ මෙහෙවර

අඛණ්ඩ නව්‍යකරණය මගින් වඩාත් යහපත් බලශක්ති විසඳුම් සමාජයට අත්කරදීම.

## අපගේ වටිනාකම

ඵලදායිත්වය වර්ධනයට තුඩුදෙන පරිසර විද්‍යාත්මක තිරසාර වටපිටාවක් තුළ බෙදුම් සේවා නව්‍යකරණය කරමින් හා වැඩිදියුණු කරමින් නිරත්තර කුතුහලය නිසා ලබාදෙන නව්‍ය සේවා මඟින් අපගේ පාරිභෝගිකයින් විස්මිත කිරීම හා හැකියාවන් සහිත හා තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් මඟින් ලාභදායිත්වය ඇති කිරීම.

## අපගේ දැක්ම

නව්‍ය පරිසර හිතකාමී ව්‍යාපාරය තුළින් ජන ජීවිතය එළිය කරමින් සතුට දැනවීම.


MB 116A
B16

# පටුන


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 06 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 07 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය | 08 |
| ඩිජිටල්කරණයට පරිවර්තනය වීම | 09 |
| ඩිජිටල්කරණ ක්‍රියාවලිය | 11 |
| සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 13 |
| ඉංජිනේරු අංශය | 20 |
| ජාල ඩිජිටල්කරණය | 23 |
| මෙහෙයුම් අංශය | 24 |
| මානව සම්පත් හා පරිපාලනය | 28 |
| මූල්‍ය සමාලෝචනය | 30 |
| අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | 32 |
| පාරිභෝගික සම්බන්ධතාවය ඩිජිටල්කරණය | 34 |
| විගණකාධිපති වාර්තාව | 35 |
| ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 40 |
| වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය | 41 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 42 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 43 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 45 |
| මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 46 |
| පසුගිය වර්ෂ 10 සඳහා කාර්යසාධන අවධානයන් | 90 |
| වාර්ෂික මහසභා රැස්වීම | 93 |
| පෙර කලාසි ආකෘතිය | 95 |

# ආයතනික තොරතුරු

**නෛතික ආකෘතිය**

1982 අංක 17 දරන සමාගම් පනතේ හා 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ වගකීමෙන් සීමිත පුද්ගලික සමාගමක් ලෙස 1983 වර්ෂයේදී සංස්ථාපනය කරන ලදී.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සංයුතිය**
එම්. පී. ඩී. පී ද සිල්වා මයා (සභාපති)
එච්. එම්.ටී. හේරත් මයා
ඩී. ඩී. කේ. කරුණාරත්න මයා
පී. අල්ගම මයා
එන්. පී. කේ. රණවීර මයා
ජේ. එස්. විදානගේ මයා
ආර්. එම්. ඩී. ලක්ෂ්මන් මයා

**පරිපාලිත සමාගම්වල වර්තමාන සංයුතිය**

**සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම**
එම්. පී. ඩී. පී. ද සිල්වා මයා (සභාපති)
ඩී. ඩී. කේ. කරුණාරත්න මයා
ලිව් ජියාන් වූ මයා
ෂෙන් ඩින්කින් මයා
ආචාර්ය පී. එස්. නරේන්ද්‍ර ද සිල්වා මයා

**සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම**
එම්. පී. ඩී. පී. ද සිල්වා මයා (සභාපති)
එස්. එල්. ජයසේකර මයා

**සමාගමේ ලේකම්වරු**
පී.ඩබ්ලිව්.කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්ගලික) සමාගම
නො.3/17, කින්සි පාර, කොළඹ 08

**ලියාපදිංචි කාර්යාලය**
411, ගාලු පාර
ඊ එච් කුරේ ගොඩනැගිල්ල
කොළඹ 03

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
කොමර්ෂල් බැංකුව පීඑල්සී
හැටන් නැෂනල් බැංකුව පීඑල්සී
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී
මහජන බැංකුව
සම්පත් බැංකුව පීඑල්සී
සෙලාන් බැංකුව පීඑල්සී
ස්ටෑන්ඩ් චාටඩ් බැංකුව පීඑල්සී
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැංකුව පීඑල්සී
හොංකොං ඇන්ඩ් ෂැංහයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් (එච්එස්බීසී)
ජාතික ඉතිරිකිරීමේ බැංකුව (එන්එස්බී)
ඩී එෆ් සීසී වර්ධන බැංකුව පීඑල්සී
සිටි බෑන්ක් එන්ඒ
පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී (පීඒබීසී)
යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පණි ලිමිටඩ්

# සභාපතිතුමාගේ පණිවුඩය



සමාගමේ 36 වන වාර්ෂික මහා සභා රැස්වීමට අපගේ වටිනා කොටස් හිමියන් පිළිගැනීමට ලැබීම මට මහත් සතුටක් හා වරප්‍රසාදයක් සේ හැඟේ.

අපගේ සමාගම ආරම්භයේ සිට වසර 37 ක කාලයක් තුළ රළු මුහුදේ මෙන්ම නිසල මුහුදක ගමන් ගන්නා යාත්‍රාවක් සේ විවිධ අභියෝගයන්ට මුහුණ දී පරිණත වී ඇති අතර විදුලි බෙදාහැරීම් අංශයේ ඉහළ තාක්ෂණික, නවෝත්පාදන හා මිණුම් සලකුණු කරන ලද උපයෝගීතාවයන් බවට පත්ව ඇත. පාරිභෝගිකයන්ට වටිනා සහ අත්‍යාවශ්‍ය සේවාවක් සැපයීමෙන් නවීන, කාර්යක්ෂම, පාරිභෝගික නැඹුරුවක් සහිත රාජ්‍ය ව්‍යවසායක් වීම තුළින් සමාගමට තම අපේක්ෂාවන්ට අනුව කටයුතු කිරීමට හැකි වී තිබේ.

සමාලෝචිත වර්ෂය තුළ, ලංකා විදුලි සමාගමේ සමස්ථ කාර්ය සාධනය සතුටුදායක වී ඇත. සමූහය විසින් උත්පාදනය කරන ලද සමස්ත ආදායම රු. බිලියන 33.71 ක් වූ අතර සමස්ත ශුද්ධ ලාභය රු. බිලියන 2.735 ක් විය. අනුමත කරන ලද මෙහෙයුම් වියදම ඇතුළත මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට සමාගමට හැකි වී ඇති අතර අනුමත නියාමනය කරන ලද ලාභය රු. බිලියන 195.74 ක් උත්පාදනය කිරීමට ද හැකි විය. මෙම කාර්යය උදෙසා සහාය සහ සහයෝගීතාවය දැක් වූ අපගේ පාරිභෝගිකයන්ට, කොටස් හිමියන්ට සහ සියලුම පාර්ශවකරුවන්ට මාගේ ස්තූතිය පිරිනමමි.

වසර පුරා ලබා ගන්නා ලද ජයග්‍රහණ සඳහා ලබාදී ඇති මග පෙන්වීම සහ නායකත්වය පිළිබඳව විදුලිබල අමාත්‍යාංශයට මාගේ අවංක අගය කිරීම පිරිනැමීමට කැමැත්තෙමි. ඊට අමතරව අපගේ ප්‍රධාන කොටස් හිමියා මෙන් ම කර්මාන්තයේ ප්‍රධානියා වන ලංකා විදුලි බල මණ්ඩලයට මාගේ අවංක කෘතවේදීත්වය පළ නොකරන්නේ නම් මාගේ රාජකාරියේ පැහැර හැරීමක් වේ. මෙම සාර්ථකත්වයට මග සකස් කරන නියාමක, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවට ද මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි. තව ද, මෙම සාර්ථකත්වය සිතා ගත නොහැකි පරිදි දැනුමෙන් හා පළපුරුද්දෙන් සමාගමට මග පෙන්වීම සඳහා උපරිම සහයෝගය ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලය අගය කිරීමට කැමැත්තෙමි.

අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්, බැංකුකරුවන්, සමාගම් ලේකම්වරු හා විගණකවරු ඔවුන්ගේ සහාය සැපයීම වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය ඔවුන්ට පිරිනැමේ.

තව ද මෙම සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට හා කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කැපවීම, බැඳීම හා උද්යෝගය දැක්වීම කෙරෙහි මාගෙ කෘතඥතා පූර්වක අගය කිරීම පළ කරමි.

අතුල ද සිල්වා
සභාපති

# සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවුඩය



අප තවත් වසරක සතුටුදායක කාර්ය සාධනයක් හා සාර්ථකත්වයක් වාර්තා කර ඇති බව ප්‍රකාශ කිරීම අභිමානයට කරුණක් වේ. සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම සහ එහි පරිපාලිතයන්ගේ (සමූහය) රු. බිලියන 33.71 ක ආදායමක් වාර්තා කර ඇති අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 6% ක වර්ධනයක් විය. සීමාසහිත වෙස්ට්කෝස්ට් පවර් පුද්ගලික සමාගමේ ආයෝජනයෙන් ලද ලාභාංශයන් ඇතුළුව රු. බිලයන රු. 2.73 ක් වූ ඉහළ ශුද්ධ ලාභයක් වාර්තා කිරීමට අපට හැකි විය.

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන අපගේ විදුලි බල බෙදා හැරීමේ ප්‍රධාන ව්‍යාපාරය කාර්ය සාධනයෙන් ප්‍රශස්ථ මට්ටමක පවතී. අප නියාමන ඉලක්ක අභිබවා ගොස් අපගේ ගනුදෙනුකරුවන්ට විශිෂ්ට සේවාවක් ලබාදී ඇත.

අපගේ විදුලිය බෙදාහැරීමේ හානි අවම වීම හා ප්‍රශස්ථ කළමනාකරණය හේතුවෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ අනුකූලතා මට්ටම් සහ ඉහළ ලාභයක් අප වාර්තා කර ඇත. නියාමනය කරන ලද අනුමත පිරිවැය තුළ අප මෙහෙයුම් කිරීම ඉහළ අනුකූලතාවයෙන් යුතුව සිදු කිරීම ද මෙයට දායක වී ඇත.

අපගේ පාරිභෝගික සේවා සාම්ප්‍රදායික කඩදාසි පදනම් කරගත් පද්ධතිවල සිට නවීන ඩිජිටල්කරණය කළ වේදිකාවට සංක්‍රමණය වීම ආරම්භ කර ඇත. අපගේ ජාලය ආසියානු සංවර්ධන බැංකු අරමුදල් සපයන ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය හරහා ප්‍රාග්ධනයේ විශාල පරිවර්තනීය මුදල් සම්භාරයක් අපේක්ෂා කරයි.

ක්‍රියාවලි නවීකරණය කිරීම සඳහා වූ අපගේ මෙහෙවර අපගේ ජාලය තියුණු කිරීම සහ අපගේ පාරිභෝගිකයන්ට උසස් ඩිජිටල්කරණ සේවාවන් ලබා දීම උසස් ප්‍රගතියක් ලබා ඇත. සමාගම සිය උසස් කාර්ය සාධනය මහජනතාවට ලබා දෙන අතර විවිධ ව්‍යාපෘති මගින් සමාජ ආයතනික වගකීම භාර ගෙන ඇත.

අපගේ කළමනාකරණය පාරිභෝගික සහභාගිත්ව, විනිවිද පෙනෙන ක්‍රියාවලියක් බවට පරිවර්තනය වනු ලබන පරිවර්තනීය යුගයක් සඳහා අපි බලාපොරොත්තු වෙමු. අතිශය පීඩන හා සංකූලතා යටතේ අප මේ වසරේ පෙන්නුම් කර ඇති ආදර්ශමත් ප්‍රගතිය, මෙම අභියෝගාත්මක පරිවර්තනය සඳහා අපට ශක්තිය හා විශ්වාසය ලබාදී ඇත.



ආචාර්ය පී. එස්. එන්. ද සිල්වා
වැඩබලන සාමාන්‍යාධිකාරී



# ඩිජිටල්කරණයට පරිවර්තනය වීම

අපගේ සමාගම ආරම්භයේ සිටම සංසිද්ධිමය සේවාවක් සැපයීම සඳහා සමාගමක් ලෙස සැමවිටම ඉදිරියට වර්ධනය වෙමින් පවතින අතර ගෝලීයකරණය හා එහි ප්‍රවණතාවලට අනුගත වෙමින් කටයුතු කරනු ලබයි. අතීතයට සාපේක්ෂව තාක්ෂණය දිනෙන් දින වේගයෙන් වර්ධනය වේ. ජනයාගේ දිනපතා කාර්යයන් සඳහා ස්මාර්ට් දුරකථන අත්‍යවශ්‍ය ජීවන මෙවලමක් බවට පත්වෙමින් පවතී. අපගේ ව්‍යාපාරය මෙම ප්‍රවණතා ප්‍රග්‍රහණය කිරීම නොව අනාගත වර්ධනය සිතන සමාගමක් ලෙස එය අප ව්‍යාපාරයට අනුගත කර ගැනීම කේන්ද්‍ර කර ගනිමින් පහත වැටීම වෙනුවට මෙම තරඟකාරී ව්‍යාපාර ලෝකය ශක්තියෙන් වර්ධනය කර ගැනීමට අපට හැකි වේ.

පාරිභෝගික හැසිරීම ප්‍රකාරව මෑත කාලයේදී ඇති වූ වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ අප හොඳින් හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ මෙන්ම විශාල වශයෙන් ලෝකයේ පසුගිය වසර කිහිපය තුළ සමාජ මාධ්‍ය යොදා ගැනීම පිළිබඳ ප්‍රබෝධමත් ඉහළ යාමක් දක්නට ලැබේ. මාර්ගගත ක්‍රම හරහා මාර්ගගත සාප්පු සවාරි හා බිල් ගෙවීම් සිදු කිරීම සඳහා ජනයා පෙර කාලයට වඩා පුරුදු වෙමින් සිටී.

ජනතාව විශේෂයෙන් කරුණ පරම්පරාව සාමාන්‍යයෙන් ඕනෑම දිනයක කාල වේලාවෙන් වැඩි ප්‍රතිශතයක් අන්තර් ජාලය පරිහරණය කිරීමේ යෙදේ. සෑම දිනකම පාහේ නව ජංගම යෙදුම් හඳුන්වා දෙන අතර ඒවා බාගත කිරීම සඳහා සහ ජනයාගේ ජිවන කාර්යයන් සරල කර ගැනිම සඳහා ඒවා යොදා ගැනීමට ජනතාවට අවකාශ ලැබී ඇත. බැරපත්/ හරපත් යොදාගැනීම සඳහා ජනතාව දිරිමත් කිරීමට පෙර වසර කිහිපයට වඩා බොහෝ විට මුදල් නොමැති ගනුදෙනු අවස්ථා සඳහා ආරක්ෂක යටිතල පහසුකම් බැංකු විසින් හඳුන්වා දී ඇත. එබැවින් උපයෝගීතා සමාගමක් ලෙස අප සඳහා මෙම ප්‍රවණතා නිර්මාණය කිරීමේ අභියෝගය හා අවස්ථා අප අවබෝධ කරගෙන ඇත. අපගේ සමාගමේ අනාගතය සඳහා අපගේ උපාය මාර්ග ික සැලසුම් සංවර්ධනය කිරීමේදී මෙම සමාජ ආර්ථික වෙනස්කම් සැලකිල්ලට ගැනීම අපට නොවැළැක්විය හැක.

ඩිජිටල්කරණය විධිමත්ව ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිලාභ රාශියක් අපගේ සමාගමට අත් කර ගැනීමට හැකි වේ යැයි අප විශ්වාස කරන හෙයින් ඩිජිටල්කරණය අප අවධානය යොමු කරන වර්තමාන කේන්ද්‍රස්ථානයකි. ඒ සඳහා උපරිම ඵලදායීතා ප්‍රමාණය නිෂ්පාදනය කිරීමේ අරමුණින් ඩිජිටල්කරණය අපගේ ව්‍යාපාරයේ කුමන අංශයක් සඳහා අඩංගු විය යුතුද යන්න ප්‍රවේශම්ව අප විසින් විශ්ලේෂණය කර යුතුව ඇත. නව තාක්ෂණය සමඟ නිවැරදි කළ යුතු ව්‍යාපාර අංශයන් හෝ නිවැරදි කළ යුතු විශේෂිත ගැටලු හඳුනාගත් පසු ඒවා සඳහා ඩිජිටල්කරණ උපාය මාර්ග ඇතුළු කිරීම මඟින් අපගේ සැලසුම් සංවර්ධනය කරගනු ලැබේ.

සමාගමක ඩිජිටල්කරණය සඳහා පරිවර්තනය වීම හා එහි සාර්ථකත්වය සඳහා ඩිජිටල්කරණ උපාය මාර්ග ප්‍රවේශම්ව සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රධාන විසඳුම් බව අප අවබෝධ කරගෙන ඇත.

අපගේ ව්‍යාපාර ඉලක්කයන් සමඟ අනුකූල වන බවට අප විශ්වාස කරන ප්‍රධාන ඩිජිටල්කරණ සංකල්ප 3 ක් සඳහා මේ අවස්ථාවේදී අප ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. එම සංකල්ප “පෙරසැරි ඩිජිටල්කරණය”, “ජාල ඩිජිටල්කරණය” සහ පාරිභෝගික සම්බන්ධතා ඩිජිටල්කරණය (CRD) ලෙස සම්පිණ්ඩනය කළ හැක. අප සිතන ආකාරයට ප්‍රතිඵල සාර්ථකව ඉටු කරගැනීම තෙක් අපගේ සියලු පරිශ්‍රමයක් ඉදිරියට ගෙන යාමට උපරිම ආකාරයෙන් කටයුතු කරන අතර අපගේ ඩිජිටල්කරණ සැලසුම් ඉටුකරගැනීම පිළිබඳ කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබේ.

ඩිජිටල්කරණ උපාය මාර්ග පසු පරිච්ඡේදයන්හි විස්තරාත්මක සාකච්ඡා කර ඇත.



කඩදාසි නොමැති කාර්යාලය - Paperless office
භෞතික නියෝජනය අඩු - Less Physical presence
ඩිජිටල් සුරක්ෂිතභාවය සහිත - Digital security

# ඩිජිටල්කරණ ක්‍රියාවලිය

අපගේ ප්‍රධාන ඉලක්කය වූයේ ඩිජිටල්කරණය ක්‍රියාවට නැංවීමේදී කැපී පෙනෙන ආයෝජන මත ප්‍රතිලාභය (ROI) ජනනය කිරීමට බෙහෙවින් කැපවන අපගේ සමාගමේ අංශයන් කෙරෙහි අවධානය යොමු කිරීමටයි. ඩිජිටල්කරණය තුළින් අපගේ ඵලදායිතාවය වැඩි දියුණු කිරීමට අප උත්සාහ කළ එක් ප්‍රධාන අංශයක් වන්නේ අපගේ අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලිය යි. උපයෝගිතා සේවා සමාගමක් වශයෙන් අපගේ සේවාවේ ගුණාත්මක බව අපගේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය මත රඳා පවතී. මේ සම්බන්ධයෙන් අපගේ ඩිජිටල් තාක්ෂණය පදනම් කරගත් උපයෝගිතා මෙහෙයුම් පද්ධතියක් බවට පරිවර්තනය කර ගැනීමෙන් අපගේ කාර්යක්ෂමතා ඉලක්ක වෙත පහසුවෙන් ළඟා විය හැක. එම අභිප්‍රාය මනසේ තබා ගනිමින්, අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලියේදී අපගේ ඩිජිටල් පරිවර්තනය සඳහා වඩාත් සුදුසු යැයි පහත සඳහන් ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත.

අපගේ සමාගමට ඩිජිටල්කරණය යෙදිය හැකි එක් ක්‍රමයක් වන්නේ, කඩදාසි රහිත කාර්යාල සංකල්පය සාක්ෂාත් කර ගැනීමයි. සාමාන්‍යයෙන් සාමාන්‍ය කාර්යාලයක් ප්‍රමුඛතමව කඩදාසි භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය කාර්යක්ෂමතාවය අතින් බලන කල අති විශාල විය හැක. කඩදාසි භාවිතය අවම කිරීමට සහ එම සියලු ක්‍රියාවලීන් ඩිජිටල් වේදිකාවලට මාරු කිරීමට ඇති හැකියාව සමාගමට මෙන් ම පාරිභෝගිකයන්ට ද විශාල ශක්තියක් ලබා දෙයි.

කඩදාසි රහිත සංස්කෘතිය මගින් විවිධ අංශවලින් අප සමාගමට බලපෑම් ඇති කරයි. අභ්‍යන්තර කාර්යාලයට පාරිභෝගික විමසුම් මගින් ලියකියවිලි පරිපාටි මගින් සියලුම දේ මගින් විශාල වශයෙන් ප්‍රතිලාභ ලබා දේ. සාමාන්‍යයෙන් කඩදාසි භාවිතා කරන කාර්යාලයක තත්ත්වයක, අවශ්‍ය “භෞතික පිටපත්” නියමිත වේලාවට නියමිත ස්ථානයේ නොමැති විට, ලියකියවිලි හේතුවෙන් අකාර්‍යක්ෂමතාවය ඇති වේ. අනෙක් අතට, ඩිජිටල්කරණය කරන ලද කාර්යාලයක, තත්ත්පර කිහිපයකින් අත්‍යාවශ්‍ය ලියකියවිලි පහසුවෙන් ලබා ගත හැක. තව ද “සෙවුම් කාලය” අඩු කිරීම තුළින් කඩදාසි රහිත සංස්කෘතිය මගින් සමාගම සඳහා විශාල කාලයක් ඉතිරි කර ගත හැකි ය.

කඩදාසි රහිත කාර්යාල සංකල්පය ක්‍රියාත්මක කිරීමෙන් අභ්‍යන්තර ක්‍රියාවලීන් බොහෝ ගුණයකින් වේගවත් විය හැකි බව අපට විශ්වාසයි. එසේ ම කඩදාසි මත පදනම් වූ කාර්යාල සංස්කෘතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් සම්බන්ධයෙන් එයට ඇතුළත් වන පිරිවැය අවධාරණය කිරීම වැදගත් වේ. කඩදාසි සඳහා වන පිරිවැය, කඩදාසි සඳහා ගබඩා පිරිවැය ඒවා නඩත්තු කිරීම සඳහා ශ්‍රම පිරිවැය අනවශ්‍ය පිරිවැය කිහිපයක් ලෙස නම් කළ හැකි අතර ඒවා කඩදාසි රහිත කාර්යාලයකදී කපා හැරිය හැකි වියදම් ය. එය ඉතිරි කර ගත හැකි කාලය පමණක් නොව, එය ප්‍රත්‍යක්ෂ ප්‍රතිලාභවලින් එකක් වන අතර, ඒ නිසා කාර්යාලයක ඉතිරිවන සැබෑ භෞතික අවකාශය ද අප මතකයේ තබා ගත යුතු ය. ගොඩ ගැසී නොමැති කාර්යාල අවකාශය ඵලදායිතාවය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරයි.

අපගේ සමාගම තුළ කාර්යාල ක්‍රියිවලින් ඩිජිටල්කරණය කිරීමේ යෝග්‍යතාවය තව දුරටත් සහතික කිරීම සඳහා කඩදාසි රහිත කාර්යාලයක් ක්‍රියාත්මක කිරීම තුළින් වඩා හොඳ ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා නව කාර්ය සාධන ඇගයීම් පද්ධතියක් සහ ලියකියවිලි ලබා ගැනීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම මගින් අප ඒ සඳහා අපගේ ප්‍රවේශය මනාව සකස් කරමු. මේ අතර අපගේ කඩදාසි රහිත කාර්යාල සංස්කෘති උපාය මාර්ග සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. එබැවින් අපි අවශ්‍ය සහාය දක්වන දෘඩාංග සම්පත් සමග අපගේ කාර්යාල අවකාශය ප්‍රසම්පාදනය කරමු. අපගේ අභ්‍යන්තර ක්‍රියාදාමයන් තුළ අප විසින් සිදු කිරීමට නියමිත මෙම වෙනස්කම් සඳහා අප සම්පූර්ණයෙන් ම කැපවී සිටින බැවින්, අපගේ කඩදාසි රහිත සංස්කෘතිය ගොඩනැගෙන සියලු පදනම් ශක්තිමත් කිරීමෙන්, අපගේ මාර්ගයට පැමිණිය හැකි ඕනෑ ම බාධකයක් අපට සම්පූර්ණයෙන්ම වළක්වා ගත හැකි බව විශ්වාස කරමු.

වෙනසක් සිදු කිරීම සඳහා අපගේ සමාගම විසින් ගනු ලබන සෑම පියවරකදී ම අපගේ සේවකයින්ගේ සම්බන්ධීකරණය එය සාර්ථක වීමට ප්‍රධාන සාධකයකි. ඔවුන් එකම පිටුවක සිටින බවත්, මෙම නව උපාය මාර්ග සමග නිවැරදි දිශාවට ගමන් කිරීමට කැමැත්තෙන් මෙන් ම දක්ෂ බවත් සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩලයට ශූන්‍ය කඩදාසි සහිත කාර්යාල පරිසරයකට අනුවර්තනයවී විකාශනය වන්නේ කෙසේ ද යන්න පිළිබඳව පුහුණුව ලබා දෙනු ඇත.

අභ්‍යන්තර ඩිජිටල්කරණය යටතේ අප සලකා බැලිය යුතු තවත් වැදගත් ක්‍රියාමාර්ගයක් වන්නේ “පද්ධති ඒකාබද්ධ කිරීමයි.” නොපැහැදිලි බව පදනම් වූ තොරතුරු වේදිකාවේ සහාය ඇතිව අපගේ අභ්‍යන්තර ක්‍රියාවලි ආශ්‍රිත පද්ධති තුළින් සංස්කරණය වන අපගේ තොරතුරුවල අඛණ්ඩතාවය හා විනිවිද භාවයේ සීමාවන් පුළුල් කිරීමට අපි අපේක්ෂා කරමු. ඊට අමතරව, දත්ත විශ්ලේෂණ සහ සැකසීමේ කාලය අඩු කිරීම තුළින් අපගේ සමාගමේ අනවශ්‍ය ලෙස ගත කරන කාලය තව දුරටත් අවම කර ගැනීමට ඒකාබද්ධ පද්ධතියක් උපකාරී වේ.

## ඩිජිටල්කරණ ක්‍රියාවලිය (සම්බන්ධිතයි...)

අප දන්නා පරිදි, ප්‍රසම්පාදනය අපගේ මෙහෙයුම්වල වැදගත් අංගයකි. අපගේ ඩිජිටල්කරණ උපාය මාර්ග තුළ එම මෙහෙයුම් සම්පූර්ණයෙන් ම ඊ-ප්‍රසම්පාදන වේදිකාවලට, ගෙන යාමට අපි අදහස් කරමු. එය සියලු ජාතික හා ජාත්‍යන්තර ලංසුකරුවන්ට තරඟ කිරීමේ මට්ටමේ වාතාවරණයක් වනු ඇති අතර, එසේම වඩාත් වැදගත් ලෙස, කඩදාසි ඉදිරිපත් කිරීම් ඉවත්වීම නිසා, කඩදාසිවල භෞතික ඉදිරිපත් කිරීමක් ශූන්‍ය වනු ඇත. එබැවින් අපගේ ඩිජිටල්කරණ අරමුණු ඉටු කර ගැනීම සඳහා අපගේ කඩදාසි රහිත කාර්යාල සංස්කෘති උපාය මාර්ගවලට අනුගත වේ.

අපගේ පද්ධති ඒකාබද්ධ කිරීමේ පරිශ්‍රමයන් විවිධ ක්ෂේත්‍ර ගණනාවකට විහිදේ. එම ක්ෂේත්‍ර වන්නේ ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම් (ERP) පද්ධතිය, බිල් කිරීම් පද්ධතිය, මානව සම්පත් තොරතුරු පද්ධතිය (HIRS) පොදු ලෙජරය, බලශක්ති කළමනාකරණ පද්ධතිය (EMS) බෙදා හැරීම් කළමනාකරණ පද්ධතිය (ADMS), මෝටර් වාහන කළමනාකරණ පද්ධතිය, කළමනාකරණ තොරතුරු පද්ධතියයි. (MIS) ඉහත සඳහන් සියලු පද්ධති සංවිධානය කර සම්බන්ධීකරණය කරන මොළකරු වන API පිවිසුම් මාර්ගයක් සංවර්ධනය කිරීමට පියවර ගන්නා අතරතුර අප ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ක්ෂේත්‍ර වේ.

පද්ධති ඒකාබද්ධතාවය සමග තවත් පියවරක් ඉදිරියට තැබීමට අපි අදහස් කරන්නේ IOT (Internet of Things) වැනි වඩා දියුණු තාක්ෂණික පියවරයන් හඳුන්වා දීමටයි. අන්තර්ජාලය (IOT) කේන්ද්‍රගත දත්ත ගබඩාවක කාර්යභාරයක් ඉටුකරනු ඇති අතර කිසිදු ගැටලුවක් හෝ දෝෂයක් නොමැතිව විශාල දත්ත ප්‍රමාණයක් පෙරළා ඉදිරියට ගෙන යාමට පහසුකම් සපයන සියලුම පද්ධති සමමුහුර්ත කරයි.

ඩිජිටල්කරණය තුළින් අපගේ මානව සම්පත් තොරතුරු පද්ධතිවල විශිෂ්ඨත්වය ළඟා කර ගැනීම සඳහා අපි අපගේ අඛණ්ඩ අවධානය යොමු කරමු. මානව සම්පත් තොරතුරු ලංකා විදුලි සමාගමෙහි වැදගත් කාර්ය භාරයක් ඉටුකරන බව පිළිගත යුතු අතර, මානව සම්පත් තොරතුරු සම්බන්ධයෙන් නිසි ඩිජිටල්කරණ ක්‍රියාමාර්ග ගනු ලැබුවහොත්, සමාගමට එය ඇති කළ හැකි ධනාත්මක බලපෑම අපි හඳුනා ගනිමු. ඒ සඳහා හොඳ ආරම්භයක් වන්නේ අපගේ මානව සම්පත් හා පරිපාලන මෙහෙයුම් නැවත අර්ථ දැක්වීමයි. මානව සම්පත් අංශයේ ඩිජිටල්කරණ පරිවර්තනය බිම් මට්ටමේ සිට සිදුවිය යුතු යැයි අප විශ්වාස කරමු. එබැවින් නව මානව සම්පත් හා පරිපාලන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම ඉදිරියට යා යුතු මාර්ගය යි. මානව සම්පත් තොරතුරු හා පරිපාලන ප්‍රතිපත්තිවල සම්ප්‍රදායික ක්‍රමවල ඇති අඩුපාඩු එයින් ඉවත් කළ හැකි වේ. ඊට අමතරව නව ප්‍රතිපත්තියක් මගින් මානව සම්පත් ඩිජිටල්කරණ ක්‍රියාමාර්ග සඳහා ශක්තිමත් පදනමක් තැබිය හැකි අතර ඒවා විශාල ලෙස ප්‍රගතියක් ලබා ගැනීම සඳහා සාදනු ලැබේ.

අපගේ පාර්ශවකරුවන්ට පක්ෂපාතීව සිටීමට සහ ඔවුන්ගේ යහපත උදෙසා අපි හැමවිටම කැප වී සිටිමු. එබැවින් අපගේ පාර්ශවකරුවන්ට ඩිජිටල්කරණ ක්‍රියාවලීන් හරහා ඔවුන්ගේ අදාල තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශම්ව අපි පියවර ගන්නෙමු. දත්ත ප්‍රවාහයක් සන්නිවේදනය කිරීම සහතික කිරීම සඳහා අපි යාවත්කාලීන කිරීම සහ තොරතුරු ප්‍රවේශ කළ හැකි ලෙස අඛණ්ඩව කටයුතු කරමු. තව ද, එය අපගේ පාර්ශවකරුවන් කෙරෙහි අපගේ අඛණ්ඩතාව සහ විනිවිදභාවය ප්‍රදර්ශනය කිරීමට සහ පවත්වා ගැනීමට උපකාරී වේ.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා සමූහයේ විගණිත මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

මෙහි දක්වා ඇති තොරතුරු මඟින් 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව අවශ්‍ය වැදගත් තොරතුරු සපයන අතර නිර්දේශිත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල මඟ පෙන්වීම් වලටද අනුකූල වේ.

**සමාගම පිළිබඳව**

**සමාගම හා පරිපාලිතයන්හි මූලික කර්තව්‍යයන්**

පාරිභෝගිකයන් සඳහා අවශ්‍ය විදුලි බලය සැපයීම නොවෙනස්ව අඛණ්ඩව සිදු කිරීම මෙම වර්ෂය තුළද අපගේ මූලික ව්‍යාපාරික කාර්යය විය. ලංකා විදුලි බල මණ්ඩලයට අයත් හා එමඟින් කළමනාකරණය කරන ජාතික පද්ධතියෙන් විදුලිබලය තොග වශයෙන් සමාගම විසින් මිලදී ගනු ලබන අතර සමාගම විසින් පවත්වාගෙන යනු ලබන නවීන බෙදාහැරීම් පද්ධතියක් මඟින් සමාගම විසින් පාරිභෝගිකයන්ට විදුලි බලය බෙදා හරිනු ලැබේ.

පරිපාලිත සමාගම් හා එහි ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

**සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම**

රට තුළ විදුලි බලය බෙදාහැරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා වන මෙම සමාගමේ මෙහෙයුම් දැනට අවම මට්ටමක පවතී.

**සීමාසහිත අන්වෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම**

ශ්‍රී ලංකාවේ සහ අපනයන වෙළඳපොලෙහි ඉලෙක්ට්‍රොනික මීටර් අවශ්‍යතාවයන් සඳහා බලශක්ති මීටර් නිෂ්පාදන පහසුකම පවත්වා ගෙන යනු ලැබේ.

**දැක්ම හා දිගුකාලීන ඉලක්ක**

සමූහයේ දැක්ම, මෙහෙවර හා වටිනාකම මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 2 හා 3 හි දක්වා ඇත.

**කොටස් හිමියන්ගේ තොරතුරු හා වැදගත් කොටස් අයිතිය**

2019 දෙසැම්බර් 31 දිනට සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ කොටස් හිමියන්ගේ තත්ත්වය පහත පරිදි වේ.

| කොටස් හිමියා | කොටස් හිමිකම % |
|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලය | 54.80% |
| මහා භාණ්ඩාගාරය | 43.60% |
| නාගරික සංවර්ධන අධිකාරිය | 0.80% |
| පළාත් පාලන ආයතන | 0.80% |

**කොටස් හිමියන් කෙරෙහි සාධාරණත්වය හා යුක්ති සහගත බව**

අධ්‍යක්ෂ මණ්ඩලය සියලු කොටස් හිමියන් කෙරෙහි සාධාරණත්වය හා යුක්ති සහගත බව තහවුරු කෙරේ.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (සම්බන්ධිතයි...)

**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**
අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමිකම් වෙනස්වීම

2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ ධූර දරන අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| එස්. ටී. නානායක්කාර මයා | - | සභාපති | (2019 - 01 - 30 සිට 2019 - 12 - 02 දක්වා) |
| ඩබ්ලිව්.බී.ගනේගල මයා | - | සභාපති | (2019 - 01 - 01 දක්වා) |
| රඛිත ජයවර්ධන මයා | - | අධ්‍යක්ෂ | (2019 - 01 - 30 සිට 2019 - 11 - 21 දක්වා) |
| එන්. ජේ. වීරකෝන් මයා | - | අධ්‍යක්ෂ | (2019 - 11 - 29 දක්වා) |
| කේ. ඩී. එම්. සිල්වා මයා | - | අධ්‍යක්ෂ | (2019 - 01 - 16 දක්වා) |
| එස්. ඩී. ඩබ්ලිව් ගුණවර්ධන මයා | - | අධ්‍යක්ෂ | (2019 - 01 - 30 සිට 2020 - 01 - 25 දක්වා) |
| එන්. ජේ. වීරකෝන් මයා | - | අධ්‍යක්ෂ | (2019 - 01 - 30 සිට 2019 - 11 - 29 දක්වා) |
| ඩබ්ලිව්.බී. ගනේගල මයා | - | අධ්‍යක්ෂ | (2019 - 01 - 01 දක්වා) |
| එස්. කේ. සමරසිංහ මයා | - | අධ්‍යක්ෂ | (2019 - 01 - 15 දක්වා) |
| වී. එස්. දික්වැල්ල මයා | - | අධ්‍යක්ෂ | (2019 - 02 - 21 දක්වා) |

**2020 ජනවාරි 01 දින සිට මේ දක්වා සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වෙනස්වීම්**

| | | | |
|---|---|---|---|
| වී. එස්. දික්වැල්ල මයා | - | අධ්‍යක්ෂ | (2020 - 06 - 11 දක්වා) |
| පී. අල්ගම මයා | - | අධ්‍යක්ෂ | (2020 - 01 - 16 දක්වා) |
| ඇන්ටන් පෙරේරා මයා | - | අධ්‍යක්ෂ | (2020 - 01 - 16 සිට 2020-03-11 දක්වා) |

**අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සංයුතිය**

| | | | |
|---|---|---|---|
| එම්. පී. ඒ. පී. ද සිල්වා මයා | - | සභාපති | (2020 - 01 - 17 සිට) |
| එච්. එම්. වී. හේරත් මයා | - | අධ්‍යක්ෂ | (2020 - 01 - 17 සිට) |
| ඩී. ඩී. කේ. කරුණාරත්න මයා | - | අධ්‍යක්ෂ | (2020 - 01 - 28 සිට) |
| පී. අල්ගම මයා | - | අධ්‍යක්ෂ | (2020 - 03 - 11 සිට නැවත පත් කරන ලදී.) |
| එන්. පී. කේ. රණවීර මයා | - | අධ්‍යක්ෂ | (2020 - 02 - 12 සිට) |
| ජේ. එස්. විදානගේ මයා | - | අධ්‍යක්ෂ | (2020 - 02 - 11 සිට ඉදිරියට) |
| ආර්. එම්. ඩී. ලක්ෂ්මන් මයා | - | අධ්‍යක්ෂ | (2020 - 06 - 11 සිට ඉදිරියට) |

**2018 දෙසැම්බර් 31 දිනට පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය**

**සීමාසහිත අන්වෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම**

2019 දෙසැම්බර් 31 දිනට ධූර දරන සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ටී. එන්. නානායක්කාර මයා | - | සභාපති | (2019 - 12 - 02 දක්වා) |
| බී. එස්. ජේ. පෙරේරා මයා | - | අධ්‍යක්ෂ | (2019 - 12 - 31 දක්වා) |
| එච්. එන්. ගුණසේකර මයා | - | අධ්‍යක්ෂ | (2019 - 10 - 01 දක්වා) |
| ලිව් ජිඅන්වු මයා | | | |
| ශෙන් ඩින්ග්කින් මයා | | | |

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (සම්බන්ධිතයි...)

**අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සංයුතිය**

එච්. පී. ඒ. පී. ද සිල්වා මයා - සභාපති (2020 - 02 - 10 සිට)
ඩී. ඩී. කේ. කරුණාරත්න මයා - අධ්‍යක්ෂ (2020 - 02 - 10 සිට)
ලිව් ජිඅන්වූ මයා
ශෙන් ඩින්ග්කින් මයා
ආචාර්ය පී. එස්. නරේන්ද්‍ර සිල්වා මයා - අධ්‍යක්ෂ (2020 - 02 - 10 සිට)

ශෙන් ඩින්ග්කින් මයා ලියු ජිඅන්වූ මයා වෙනුවෙන් ද කටයුතු කරයි.

**සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම**

2019 දෙසැම්බර් 31 දිනට ධූරය දරන සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය පහත දැක්වේ.

එස්. ටී. නානායක්කාර මයා - සභාපති (2019 - 12 - 02 දක්වා)
එච්. එන්. ගුණසේකර මයා - අධ්‍යක්ෂ (2019 - 10 - 01 දක්වා)
එස්. එල්. ජයසේකර මයා -

**අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සංයුතිය**

එම්. පී. ඒ ද සිල්වා මයා - සභාපති (2020 - 02 - 10 සිට)
එස්.එල්.ජයසේකර මයා

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික**

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශනවල සටහන් 07 හි හෙළිදරව් කර ඇත.

**බැඳීම් ලේඛනය**

2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති පරිදි සමාගම හා පරිපාලිතයන් බැඳීම් ලේඛන පවත්වා ගනු ලැබේ.

**අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම් ලේඛනය**

සමාලෝචිත ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළදී සමාගම සමඟ කොන්ත්‍රාත්තුවක සෘජුව හෝ වක්‍රව බැඳී ඇති හෝ සමාගම සමඟ සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවක යෙදී ඇති අධ්‍යක්ෂවරුන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් 28 හි දක්වා ඇත.

**අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම**

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 14 ක් පවත්වා ඇති අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් යෝජනාවක් පමණක් බෙදා හැරීම මගින් පිළිගන්නා ලදී.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම්**

කිසිඳු අධ්‍යක්ෂවරයෙකුට සමාගමේ/ හෝ සමූහයේ කොටස් හිමිකම් නොමැත.

**සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

අධ්‍යක්ෂවරුන් විසින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් කර ඇති අතර එවැනි ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල සටහන් 28 හි දක්වා ඇත.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (සම්බන්ධිතයි...)

## මූල්‍ය සමාලෝචනය

### වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල සටහන් 01 සිට 03 හි දක්වා ඇත.

### මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගමේ ව්‍යාපාරය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කිරීම සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කරන ලදී.

2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයේ සමාගම හා සමූහය සඳහා ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මඟින් පිළිවෙලින් සමාගමේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි.

### ආදායම

සමූහයේ ආදායම රු.බිලියන 33.71 ක් විය. විවිධ පාරිභෝගික වර්ගයන්ගේ දායකත්වයෙන් හඳුනා ගන්නා ලද සමූහයේ පිරිවැටුම පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් 04 හි දක්වා ඇත. සමූහයේ සමාගම් අතර වෙළඳාම සාධාරණ වෙළඳපොල අගයට සිදුකරන ලදී.

### වියදම

පෙර වර්ෂයට සාපේක්ෂව සමූහයේ මුළු මෙහෙයුම් හා පරිපාලන වියදම් 12% කින් වැඩි වී ඇත. ශුද්ධ ගිණුකම්රණය / ශුද්ධ ගෙවීම් වැඩි වීම්වලින් ලංකා විදුලි බල මණ්ඩලයේ ලැබිය යුතු ශේෂ සඳහා රු. මිලියන 548 ක අතිරේක බොල් ණය ප්‍රතිපාදනයක් සිදු කිරීම සහ වෙනත් පොදු කාර්ය ගාස්තුවල සුළු වැඩි වීම පොදු කාර්ය පිරිවැය වැඩිවීම කෙරෙහි හේතු වී තිබුණි.

### ලාභය

සමූහයේ දළ ලාභ අනුපාතය 16%ක මට්ටමේ පවත්වාගෙන යනු ලැබේ. බදුවලට පෙර ලාභය 26% කින් එනම් රු. බිලියන 4.0 කින් වැඩිවී ඇත. මෙම වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක වූයේ සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ලාභාංශ හා දළ ලාභයේ වැඩිවීමයි. කෙසේ වුවද, ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් බදු හා විලම්භිත බදු ප්‍රතිපාදන හේතුවෙන් බදුවලට පසු ලාභය පෙර වර්ෂයට වඩා 7.2%කින් අඩුවිය. එනම් රු. බිලියන 2.74ක ශුද්ධ ලාභයකි.

### බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එයට කරන ලද සංශෝධනවල විධිවිධානවලට අනුකූලව බහුකාර්ය සඳහා ගැලපීම් කරන ලද පරිදි වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය මත පදනම් ව බදු සඳහා ප්‍රතිපාදන සලසන ලදී. සියලුම මෙහෙයුම් සමාගම් 28% ක ආදායම් බදු ගෙවීමට බැඳී ඇත.

මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා වාර්තාකරන දිනයට වත්කම් හා වගකීම් පිළිබඳ බදු පදනම් හා ඒවායේ වාරණ අගයන් අතර තාවකාලික වෙනස්කම් පිළිබඳව වගකීම් ක්‍රමය යොදා ගනිමින් විලම්භිත බදු සඳහා ප්‍රතිපාදනය කර ඇත.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (සම්බන්ධිතයි...)

### ලාභාංශ

වර්ෂය තුළ මුළු ලාභාංශ ගෙවීම රු. බිලියන 1.15 කි.

### කොටසකට ඉපැයුම

වර්ෂය තුළ නිකුත් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ බර තැබූ සාමාන්‍ය මඟින් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වර්ෂයට අදාළ ශුද්ධ ලාභය බෙදීම මඟින් කොටසකට මූලික ඉපැයුම ගණනය කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල සටහන් 9 ට යොමු වේ.

### ප්‍රකාශිත ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රකාශනවල සටහන් 21.1 ට යොමු වේ.

### සංචිත

සංචිත හා මුළු හිමිකම් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

| රු.000 | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ආදායම් සංචිත | ප්‍රත්‍යාගණන අතිරික්තය | සාධාරණ අගය සංචිත | රඳවාගත් ඉපැයුම් | සුළු කොටස් හිමියන්ගේ අයිතීන් | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| සමූහය | 1,145,067 | 340,642 | 1,854,817 | 8,752,517 | 21,725,353 | 150,631 | 33,969,027 |
| සමාගම | 1,145,067 | 340,642 | 1,784,965 | 8,752,517 | 21,513,410 | - | 33,536,601 |

### ණය

සටහන් අංක 22 දැක්වෙන පොලී සහිත ණය හා ණය ගැනීම්වල දැක්වෙන පරිදි රු. මිලියන 141.6 ක් වූ කල් බදු වගකීම් හැර සමාගම හෝ සමූහයට අදාළව දිගු කාලීන ණය නොමැත. 2019 ජනවාරි සිට ක්‍රියාත්මක කරන ලද නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ශ්‍රී ලං මු ව, ප්‍ර 16 - කල් බදු ප්‍රකාරව ඇ. එ. ජ. ඩොලර් 5000 ට වැඩි සියලු කොන්ත්‍රාත් දිගු කාලීන කල් බදු ලෙස සැලකිය යුතු අතර ඒ අනුව ගිණුම් තැබීම අවශ්‍ය වේ. එබැවින්, ඉඩම් හා ගොඩනැගිලි පරිශ්‍රයන් 20 කට අදාළ කුලී ගිවිසුම් කල්බදු ලෙස සලකන ලද අතර නව ශ්‍රී ලං මු වා ප්‍ර 16 ප්‍රකාරව ගිණුකම්කරණය කරන ලදි.

ඉඩම් හා ගොඩනැගිලි කුලී ගෙවීම් උදෙසා ඉදිරි මුදල් ප්‍රවාහ බැඳීම් දැක්වීම සඳහා ඇතුළත් කරනලද මෙම පොලී දරන ණය නාම මාත්‍රික සටහනකි. මාසික/අර්ධ/වාර්ෂික/ වාර්ෂික කුලී ගෙවීම හැර වෙන ම මුදල් පිටතට ගලා යෑමක් නොමැත.

### දේපල, පිරියත හා උපකරණ

සමූහයේ පෙර වර්ෂයේ රු.බිලියන 13.17 ක්වූ දේපල, පිරියත හා උපකරණවලට සාපේක්ෂව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එය රු.බිලියන 13.62 ක් විය. සමාගමේ පසුගිය වර්ෂයේ රු.බිලියන 12.87 ක දේපල, පිරියත හා උපකරණවල වටිනාකම මෙම වර්ෂයේදී රු.බිලියන 13.28 ක් විය.

### ජංගම වත්කම්

පෙර වර්ෂයේ රු. බිලියන 19.17 ක් වූ සමූහයේ මුළු ජංගම වත්කම් 2019 වර්ෂය අවසානයට රු.බිලියන 21.94 ක් ලෙස වාර්තා විය. පෙර මූල්‍ය වර්ෂයේ රු.බිලියන 18.75 ක්වූ සමාගමේ මුළු ජංගම වත්කම් වටිනාකමට සාපේක්ෂව මෙම වර්ෂයේ මුළු ජංගම වත්කම් වල වටිනාකම රු.බිලියන 21.28 ක් විය. ජංගම වත්කම්වල වර්ධනය කෙරෙහි හේතු වූයේ කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය කිරීමයි.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (සම්බන්ධිතයි...)

**ව්‍යාවස්ථාපිත ගෙවීම්**

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීමට අනුව රජය හා සේවක මණ්ඩලය වෙනුවෙන් කරන සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි පරිදි සිදු කර ඇති බව හා ඒ වෙනුවෙන් අදාළ වෙන්කිරීම් නිසි පරිදි සිදු කර ඇති බවට සෑහීමකට පත් වී ඇත.

**ශේෂපත්‍ර දිනට පසු සිදුවීම**

වාර්තා කරන දිනයට ගැලපීම් සඳහා අවශ්‍ය වන හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වන සැලකිය යුතු අසම්භාව්‍ය බැරකම් නොමැත.

**වෙනත් නීති හා රෙගුලාසි වලට අනුකූල වීම**

ශ්‍රී ලංකාවේ අදාළ වන නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිඳු කාර්යයක් සඳහා සමූහය යෙදී නොමැති බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ උපරිම දැනීමේ හා විශ්වාසය පරිදි තහවුරු කරයි.

**තීරණය සඳහා ඇති නෛතික කරුණු**

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ දැනීම අනුව, සමාගමට එරෙහිව තීරණය සඳහා පවතින අධ්‍යක්ෂවරුන්ගේ නීතිමය කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට බලපෑමක් නොවේ. අසම්භාව්‍ය බැරකම් හා ප්‍රාග්ධන වියදම් බැඳීම් සම්බන්ධයෙන් වූ බැඳීම් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් 26 හා හෙළිදරව් කර ඇත.

**අඛණ්ඩ පැවැත්ම**

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මතා පදනම මත පිළියෙල කරන ලදී.

**අවදානම් කළමනාකරණය**

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ ආයතනික අරමුණු ඉටුකර ගැනීම තහවුරු කරගැනීම සඳහා සමාගමේ හා සමූහයේ අවදානම් කළමනාකරණය අඛණ්ඩව සමාලෝචනය කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල සටහන් 29 මූල්‍ය ආයෝජන අවදානම් කළමනාකරණය මගින් මෙම කරුණු තවදුරටත් දක්වා ඇත.

**විගණකවරු**

සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභ හෝ පාඩු ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයන් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර විගණකාධිපතිවරයාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම විගණනය කරගෙන යාමේදී වරලත් ගණකාධිකාරී ආයතනයක් වන අර්නස්ට ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරී ආයතනය විසින් විගණකාධිපතිවරයාට සහාය වන ලදී.

## සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (සම්බන්ධිතයි...)

| සමාගමේ නම | විගණකගේ/ බදු උපදේශකගේ නම | ගෙවීම් වර්ගය | මුදල (රු) |
|---|---|---|---|
| සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම | විගණකාධිපති | සේවා ගාස්තු | රු. 375,000/- |
| | අර්නස්ට් ඇන්ඩ් යන්ග් ගණකාධිකාරීවරු සහාය වන ලදී. | විගණන ගාස්තු | රු. 2,500,000/- (VAT බදු හැර) |
| සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම | විගණකාධිපති | සේවා ගාස්තු | රු. 45,000/- |
| | අර්නස්ට් ඇන්ඩ් යන්ග් ගණකාධිකාරීවරු සහාය වන ලදී. | විගණන ගාස්තු | රු. 300,000/- (VAT බදු හැර) |
| සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම | විගණකාධිපති | සේවා ගාස්තු | |
| | අර්නස්ට් ඇන්ඩ් යන්ග් ගණකාධිකාරීවරු සහාය වන ලදී. | විගණන ගාස්තු | රු. 120,000/- (VAT බදු හැර) |

**පාරිසරික ආරක්ෂාව**

පරිසරයට හානි වන කිසිදු කටයුත්තක සමාගම නිරත වනු නොලැබේ.

**වෘත්තීය ප්‍රතිපත්ති**

සමූහයේ වෘත්තීය ප්‍රතිපත්ති පුළුල් දැනුමක් ඇති පුද්ගලයින් බඳවා ගැනීම් මත පදනම් වන අතර ඔවුන්ගේ කුසලතා හැකියාවන් වැඩි දියුණු කරගැනීම සඳහා අවස්ථාවන් සලසා දෙනු ලැබේ. තවද ස්ත්‍රී - පුරුෂ බව, ජාතිය හෝ ආගම නොසලකා සැමවිටම සමාන වෘත්තීය අවස්ථාවන් සමූහය විසින් ලබා දෙයි. එසේම සේවකයන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාවට සැමවිටම ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. වර්ෂය අවසානයට සමාගම හා එහි පරිපාලිතයන් විසින් සේවයේ යොදවන ලද පුද්ගලයින් සංඛ්‍යාව 1535 ක් විය.

**වාර්ෂික මහා සභා රැස්වීම**

චර්යාගත කර්තව්‍ය සිදු කිරීමේ අරමුණ සඳහා 36 වන වාර්ෂික මහ සභා රැස්වීම සමාගමේ ලියාපදිංචි කාර්යාලය වන කොළඹ 03, ගාලු පාර, තෙවන මහල ඊ.එච්.කුරේ ගොඩනැගිල්ල නො.411 හිදී 2020 ඔක්තෝබර් 22 බ්‍රහස්පතින්දා දින පස්වරු 3.30 ට පවත්වනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් වාර්ෂික වාර්තාව සභාපති හා අධ්‍යක්ෂවරයකු විසින් අත්සන් තබනු ලැබේ.

**සභාපති** **අධ්‍යක්ෂ**

**සීමාසහිත පී.ඩබ්ලිව්.කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්ගලික) සමාගම**

ලේකම්වරු

2019 ඔක්තෝබර් 31

කොළඹ 10

# ඉංජිනේරු අංශය

2019 වර්ෂය ඉංජිනේරු අංශය සඳහා වඩාත් ඵලදායි වසරක් ලෙස සැලකිය හැකි ය. විදුලිබලය බෙදා හැරීම් අංශයේ මෙම වේගයෙන් වෙනස්වන හා අභියෝගාත්මක අවස්ථාවේ දී දිනෙන් දින වර්ධනය වන පාරිභෝගික අපේක්ෂාවන් ක්‍රමානුකූලව සපුරාලීම සඳහා ඉංජිනේරු අංශය එහි ප්‍රධාන අංශයන් තුන එනම් ජාලය සැලසුම් කිරීම හා සංවර්ධනය තොරතුරු තාක්ෂණ වේදිකාවන් හා පද්ධති සංවර්ධනය සහ සේවක මඩුල්ලේ ධාරිතා සංවර්ධනය හරහා ක්‍රියාත්මක වේ. ඉංජිනේරු අංශය යටතේ මෙහෙයුම් කෙරෙන දෙපාර්තමේන්තු වන්නේ පද්ධති සැලසුම් දෙපාර්තමේන්තුව, නියාමන දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුවයි. පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙහෙයුම් කෙරෙන තොරතුරු තාක්ෂණය, සැපයුම් පරීක්ෂණ රසායනාගාරය හා පුහුණු මධ්‍යස්ථානය උප දෙපාර්තමේන්තු වන අතර වසර පුරා මෙම ප්‍රගතිය ළඟා කර ගැනීම උදෙසා වෙහෙස නොබලා කාර්යයන් සිදු කරන ලදී.

මීට වසර තිහකට පෙර අර්ධ නාගරික ප්‍රදේශයන් සඳහා නිර්මාණය කරන ලද දැනට පවතින ජාල සැකැස්ම සමග ධාරිතාවය සහ විශ්වසනීයත්වය පිළිබඳ බොහෝ ගැටලුවලට ලංකා විදුලි සමාගම මුහුණ දී තිබේ. එබැවින් පවත්නා ගැටලු සඳහා තිරසාර විසඳුම් සොයා ගැනීමේ අරමුණින්, ලංකා විදුලි සමාගම විසින් ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව අධ්‍යයනයක් කරන ලද අතර එහිදී ලං වි ස ජාල සැකැස්ම 33kv සහ 11kv ඒකාබද්ධ වෝල්ටීයතා මට්ටම් සහිත ජාලයකට පරිවර්තනය කළ යුත බව අනාවරණය විය. ඒ අනුව, සැලසුම් නිර්ණායක සංශෝධනය කිරීමේ කාර්යය පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරන ලදි. මිශ්‍ර වෝල්ටීයතා පද්ධතිය හඳුන්වා දීමත් සමග ඉහළ ධාරිතාවයකින් යුත් ස්ථාන 33kv ජාල වෙත මාරු කිරීමේ හැකියාව ලබා ගැනිමට ලංකා විදුලි සමාගම සැලසුම් කර ඇත. තව ද 132/33kv උපපොළවල්වලින් හෝ ඉහළ විශ්වාසදායක 33kv ඉන්ජෙක්ෂන් ස්ථානවලින් අනාගත ධාරිතා ඉන්ජෙක්ෂන් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර, අතරමැදි ප්‍රාථමික උපපොළවල් සඳහා අමතර පරිවැය මඟ හැරේ. තව ද, දැනට පවත්නා උඩු රැහැන් ජලය භූගත කේබල් සහ ඉහළ විශ්වසීයත්වයෙන් ඉල්ලා සිටින ඒරියල් බන්ඩල් කේබල් සහිත ජාලයක් බවට පරිවර්තනය කිරීමට යෝජනා කර ඇත. මෙම නව සැලසුම්කරණ නිර්ණායක මත පදනම්ව 2019-2028 සැලසුම් සීමාව සඳහා ලංකා විදුලි සමාගම සිය පළමු වෝල්ටීයතා සංවර්ධන සැලැස්ම නිකුත් කරන ලදී.

පසුගිය දශක කිහිපය තුළ නාගරික ක්‍රියාකාරකම් මට්ටම් ඉහළ යාම හා ආයෝජන හිඟකම හේතුවෙන් බලපෑමට ලක් වූ ප්‍රධාන වශයෙන් උඩු රැහැන් බෙදා හැරීමේ ජාලයට පැවරිය හැකි වන පසුගිය වසර කිහිපය තුළ ජාල විශ්වාසනීයත්වය පහත වැටීම හේතුවෙන් කැළණිය, කෝට්ටේ, නුගේගොඩ, මොරටුව සහ කලුතර ප්‍රදේශ සඳහා ජාල නවීකරණ ව්‍යාපෘතියක් පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘති සැකසුම් තාක්ෂණ සහාය උපදේශකවරුන්ගේ සහාය ඇතිව පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුවට 2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ ආරම්භක නිර්මාණ හා සැලසුම් සිදුකර ගැනීමට හැකි විය. තව ද ලංකා විදුලි සමාගමේ විකාශනයේ නව සංධිස්ථානයක් ආරම්භ කරමින් එය 2021 වන විට සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය තව දුරටත් ශක්තිමත් කරමින් ආසියානු සංවර්ධන බැංකුව විසින් කැළණිය ප්‍රදේශයේ යෝජිත ජාල සංවර්ධනයට මූලාශ්‍රකයේ ලබා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ දළුගම ප්‍රදේශයේ 132/33kv ග්‍රිඩ් උපපොළකට අරමුදල් සැපයීමට එකඟ වී ඇත. මෙය ලංකා විදුලි සමාගමේ බෙදා හැරීම් ජාලයට පළමුවරට සෘජු පාලක ධාරිතාව එකතු කිරීමක් වන අතර, මෙම එකතු කිරීම හේතුවෙන් මෙම ප්‍රදේශයට දැඩි සහනයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පුළුල් ජාල විශ්වසනීයත්වයක් පිළිබඳ අධ්‍යයනයක් කිරීමට පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකි වූ අතර ව්‍යාපෘතිය ආර්ථික වශයෙන් ප්‍රායෝගිකව කළ හැකි බව සොයා ගන්නා ලදී.

පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ දී පිරිවැය අත්පොත හා අනෙකුත් සැලසුම් ලේඛන නිකුත් කරමින් සිය සුපුරුදු ප්‍රසම්පාදන හා පද්ධති සංවර්ධන කාර්යයන් අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබූ අතර, එකතුව රු. බිලියන 1කට ආසන්න පිරිවැයක් දරමින් මුළු ප්‍රසම්පාදන 217ක් මෙහෙයවා ඇත. පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් GSM සංගමයේ මූල්‍ය සහාය සහ ඩයලොග් ඇක්සියාටා පීඑල්සී ආයතනය හා මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික සහාය කෝට්ටේ හරිත කලාප ප්‍රදේශයේ ස්මාර්ට් මීටරින් නියමු ව්‍යාපෘතිය සාර්ථකව සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ස්මාර්ට් මීටර් 3200 ක විදුලි පෙර ගෙවුම් පහසුකම් සහිත වත්මන් ප්‍රගතියක් අත්කර දෙන නවීන 10T ස්මාර්ට් මීටර් පද්ධතියක් සහ බෙදා හැරීමේ සේවා රෙගුලාසිවල දක්වා ඇති බෙදා හැරීමේ වෝල්ටීයතා අධීක්ෂණ අවශ්‍යතා සඳහා නිර්මාණය කර ඇති විදුලි නියාමන උපකරණ 150ක් ඇතුළත් වේ.

ලංකා විදුලි සමාගමේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු පද්ධතිය හා කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමත්

## ඉංජිනේරු අංශය (සම්බන්ධිතයි...)

සමග 2019 වර්ෂය ඵලදායී වර්ෂයක් ලෙස පෙන්නුම් කර ඇත. ISO 27000 මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් මෙම ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති ලේඛන හා පටිපාටි සංග්‍රහයක් සංවර්ධනය කර ඇත. තව ද ක්‍රියාත්මක කිරීම් සිදු කරන උපදේශකවරුන් විසින් හඳුනාගන්නාලද සියලු නිර්දේශයන් සම්පූර්ණ කිරීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් MYLECO, ජංගම යෙදුම දියත් කරන ලද අතර එය සිය පාරිභෝගිකයන්ට ලංකා විදුලි සමාගම සමග අන්‍යෝන්‍ය ක්‍රියා කිරීමට ඉතා ඵලදායී මෙවලමක් ලෙස සැලකේ. මෙ යෙදුම මගින්, විමසුම් සිදු කිරීමට හෝ විදුලි බිඳ වැටීම් පැමිණිලි කිරීමට, විදුලි බිල්පත් ගෙවීම් හා ගෙවීම් ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ලංකා විදුලි සමාගමේ පාරිභෝගිකයන්ට හැකියාව ලැබේ. මීට අමතරව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බිඳ වැටීම් අනතුරු ඇඟවීම් සහ ප්‍රතිචාර ලබා ගැනීමට යෙදවුම් පද්ධතියක් දියත් කර ඇත.

පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ලංකා විදුලි සමාගමේ තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය විසින් පුහුණු වැඩසටහන් 55 ක් පවත්වා තිබෙන අතර මුළු කාර්යය මණ්ඩලයෙන් 80%ක් වන පුද්ගලයින් 1225 ක් අවම වශයෙන් මධ්‍යස්ථානයේ එක් වරක් හෝ පුහුණුවක් ලබා ඇත. 2019 වර්ෂයේ අභ්‍යන්තර පුහුණු සැලැස්මේ 100% ක කාර්ය සාධනයක් ඔවුන් විසින් අත්කර ගෙන ඇත.

සමාගමේ ආදායමෙන් 40%කට ආසන්න ප්‍රමාණයකින් දායක වන ලංකා විදුලි සමාගමේ තොග පාරිභෝගිකයින් 1945 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් සුපුරුදු පරිදි පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා ඔවුන්ගේ පරීක්ෂණ චක්‍රයන් සාර්ථකව සම්පූර්ණ කර ඇත. එසේ ම 2019 වර්ෂය සඳහා කාර්ය සාධන සැලැස්ම 100% ක් ඔවුන් විසින් සපුරා ගෙන ඇත.

මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් නියම කරන ලද පරිදි නියාමන දෙපාර්තමේන්තුව විසින් විදුලි බලය බෙදා හැරීමේ කාර්ය සාධන ප්‍රමිතීන් වර්තමානයේ ක්‍රියාත්මක කරමින් පවතී. තවද, පාරිභෝගික අත්දැකීම් පිළිබඳ තත්ත්වය වැඩි දියුණු කිරීමට හා වර්තමාන තෘප්ති මට්ටම් පිළිබඳ හා අනාගත පාරිභෝගික අපේක්ෂාවන් දැකීමේ හැකියාවක් ලබා ගැනීමට නියාමන දෙපාර්තමේන්තුව විසින් ලංකා විදුලි සමාගමේ සමස්ථ ප්‍රදේශ ආවරණය වන පරිදි පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණයක් සිදු කරයි. තව ද මහජන උපයෝගිතා කොමිෂන් සභාවට අවශ්‍ය සියලු දත්ත කාලීනව ඉදිරිපත් කර ඇති අතර නියාමන තොරුතුරු පද්ධතිය (RIS - Regulatory Information System) ප්‍රසිද්ධ කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි.

බෙදා හැරීම් ජාල ප්‍රතිසංස්කරණයේ දී ඉහත සැලසුම් ව්‍යාපෘති දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. රු. මිලියන 508කට වැඩි ව්‍යාපෘති ආරම්භ කර ඇති අතර ලංකා විදුලි සමාගමේ ශාඛා 7 අතර රු. මිලියන 274කට වැඩි සංවර්ධන ව්‍යාපෘති සඳහා වියපැහැදම් කර ඇත.



ජාලය ස්වයංක්‍රීයකරණය (Network Automation)
ස්මාර්ට් මීටර් ක්‍රමය (Smart Metering System)
භූගෝලීය තොරතුරු පද්ධති වේදිකාව (GIS Platform)

# ජාල ඩිජිටල්කරණය

ජාල ඩිජිටල්කරණය හඳුන්වාදීම තුළින් උපයෝගීතා සමාගමක් ලෙස ලංකා විදුලි සමාගමට ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා විශාල හැකියාවක් ඇත. මෙය අපගේ සමාගමේ එදිනෙදා ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී වඩාත් උසස් කාර්යක්ෂමතාව, නිරවද්‍යතාවය සහ පැහැදිලිකම සඳහා මගපාදනු ඇත.මේ සම්බන්ධයෙන් ජාල ඩිජිටල්කරණය සාක්ශාත් කර ගැනීම සඳහා වන අපගේ උපාය මාර්ග ආරම්භ වන්නේ අපගේ ව්‍යාපාර ආකෘතිය පිළිබඳව පුළුල් ලෙස සොයා බැලීම සහ අපගේ එදිනෙදා මෙහෙයුම්වල අත්දැකීම් වැඩි දියුණු කිරීම උත්සාහ කිරීම සහ එසේ කිරීමෙන් අපගේ ව්‍යාපාරය සහ අපගේ පාර්ශවකරුවන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා ය. ලංකා විදුලි සමාගමේ ජාල ඩිජිටල්කරණය අනුව අප ගැනීමට අදහස් කරන  ප්‍රධාන පියවරයන්ගෙන් කිහිපයක් පහත පරිදි වේ.

අත්‍යාවශ්‍යයෙන් ම ජාල ඩිජිටල්කරණය පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක වීමට ක්‍රියාකාරී හා විශ්වාසදායක ජාල ස්වයංක්‍රීයකරණය තිබිය යුතු ය. එය යතාර්ථයක් වීමට නම් ජාල යටිතල ව්‍යුහයේ යම් මූලික මට්ටමේ වෙනස්කම් සිදු විය යුතු ය. එය මනසේ තබා ගනිමින් දුරස්ථව ක්‍රියාකළ හැකි සහ අපගේ මූලික ජාල ස්වයංක්‍රීයකරණ වේදිකාව සමග කාර්යක්ෂමව හා විශ්වාසදායක ඒකාබද්ධතාවයක් ඇති කළ හැකි ස්වයංක්‍රීය ස්විච සහ මීටර සහ පාලකයන් සමග අපගේ ජාලය ශක්තිමත් කිරීමට අපි අපේක්ෂා කරමු.

උපයෝගීතා සේවා සමාගමක් ලෙස, අපගේ පාරිභෝගිකයන්ට සෑම විට ම අඛණ්ඩ හා කාර්යක්ෂම සේවාවක් සැපයීම අපගේ මූලික ඉලක්කය යි. විදුලිබල සැපයුම බිඳ වැටීම්, අළුත්වැඩියා කිරීමේ කාලය අවම වශයෙන් තබා ගැනීම ඊට ඇතුළත් ය. අපගේ සේවාව තරඟකාරී මෙන් ම තෘප්තිමත් වීමට නම් අපගේ පාරිභෝගිකයින්ගේ එදිනෙදා ජීවිතයේ ගලා යාම අපහසුතාවයට පත් නොවන පරිදි අපගේ තාක්ෂණික සහාය කඩිසරව ලබා දීමට අපට හැකි විය යුතුය. එය අර්ථයෙන් ගත් කළ, අපගේ ජාලයේ කාර්යක්ෂමතාවය සහ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා ස්වයංක්‍රීය මාරු වීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අප අදහස් කරමු. තාක්ෂණික බිඳ වැටීමක් හෝ දෝෂයක් සිදු වූ සෑම අවස්ථාවක ම ජාලයේ දෝෂ ස්ථාන හඳුනා ගැනීමට මෙය අපට ඉඩ ලබා දේ. මෙම නව ක්‍රමය ක්‍රියාත්මක වීමත් සමග අපට ජාලයේ සෙසු කොටස්වලට බාධාවක් නොමැතිව දෝෂ සිදුවී ඇති ස්ථානය හුදකලා කර ගැනීමට හැකි වේ.

ක්‍රියාත්මක කිරීම කෙරෙහි අප අවධානය යොමු කර ඇති ස්මාර්ට් මිනුම් සංකල්පය සාර්ථකවීමට බොහෝ හේතු ඇත. එයින් පහසු සහ නිවැරදි පද්ධති අධීක්ෂණයක් සහ පාරිභෝගික බිල්පත් ක්‍රමයක් ගොඩනැගීමේ හැකියාව ඇත. එයට අමතරව, සාම්ප්‍රදායික ක්‍රම මෙන් අපගේ පාරිභෝගිකයන්ට ඔවුන්ගේ පරිභෝජන හැසිරීම සහ ඒ පිළිබඳ තොරතුරු තථ්‍ය කාලීනව සන්නිවේදනය කිරීමට එය අපට ඉඩ දෙයි. වර්තමානයේදී අප බොහෝ මීටර්, ඩිජිටල්කරණය කරන ලද ස්මාර්ට් මීටර්වලට පරිවර්ථනය කරමින් සිටී. ඒ සමගම ස්මාර්ට් ජංගම දුරකථන පදනම් කරගත් යෙදවුමක් හරහා අපගේ පාරිභෝගිකයින්ට ඔවුන්ගේ උපයෝග්‍යතා සම්බන්ධ තොරතුරු වෙත ඉක්මන් හා පහසුවෙන් ප්‍රවේශ වීමට ඉඩ දෙනු ඇත. මෙම නව ස්මාර්ට් මිනුම්කරණය හඳුන්වාදීමෙන් පාරිභෝගිකයන්ට මෙන් ම සම්ප්‍රදායික මීටර් කියවන ලංකා විදුලි සමාගමේ සේවකයින්ට ද එක් නිවසක සිට තවත් නිවසකට යන කාලය සහ ශ්‍රමය ඉතිරි කර ගත හැකි ය.

පාරිභෝගික ඩිජිටල්කරණ ක්‍රියාමාර්ගයන් තුළින් තිරසාර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අප අඛණ්ඩව නව ක්‍රම සොයන්නෙමු. උපයෝගීතා සමාගමක් ලෙස තිරසාර බව ගැන කතා කිරීම බලශක්ති නාස්තියට විසඳුම් සෙවීම සඳහා ඩිජිටල්කරණය හරහා නව ක්‍රමවේදයන් සකස් කිරීම අපගේ යුතුකම වන අතර වඩා වැදගත් වන්නේ එය දිගුකාලීනව ආරක්‍ෂා කිරීමයි. විශේෂයෙන් වීථි ලාම්පු දැනට ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් අකාර්යක්ෂමතාවයන් ඇති අතර, ඒවා ඩිජිටල්කරණ ක්‍රමවේදයන් නිසිලෙස ක්‍රියාත්මක කිරීමෙන් වළක්වා ගත හැකි ය. වර්තමාන වීථි ආලෝකකරණය ආශ්‍රිත අඩුපාඩු සඳහා වෙනත් විසඳුම් ලබා දිය හැකි ස්වයංක්‍රීය වීථි ආලෝකකරණ පාලන ක්‍රමයක් වැනි නව තාක්ෂණිකව දියුණු ක්‍රමයක් හඳුන්වා දීමට අපි අපේක්ෂා කරමු. ස්වයංක්‍රීය වීථි ආලෝක පාලන පද්ධතිය දිවා ආලෝකයේ තීව්‍රතාවයට සංවේදී වීමෙන් අත්‍යාවශ්‍යයෙන් ම ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වේ. කිසිඳු මිනිස් අධීක්ෂණයකින් තොරව අවශ්‍ය වූ විට පමණක් වීථි ලාම්පු ක්‍රියා කිරීමට ඉඩ ලබා දේ.

අප සොයා ගන්නා ලංකා විදුලි සමාගමේ ඩිජිටල්කරණයේ ධනාත්මක ප්‍රතිඵලය නම් බොහෝ ප්‍රයෝජනවත් ආකාරයේ දත්ත ලබා ගැනීමට ගණනය කිරීමට සහ විශ්ලේෂණය කිරීමට ඒකාබද්ධ පද්ධතිවලට ඇති හැකියාවයි. මෙමගින් ජාලය පිළිබඳ උසස් විශ්ලේෂණයක් කිරීමට සහ අනාගත බලශක්ති සැපයුම සහ ඉල්ලුමේ අනාගතය පුරෝකථනය කිරීමට අපට හැකියාව ලැබේ. මෙම දත්ත පැහැදිලි පදනමක් මත දත්ත කළමනාකරණ වේදිකාව තථ්‍ය කාලීනව ගබඩා කර යාවත්කාලීන කරනු ඇති බව ඉස්මතු කිරීම වටනේ ය. මෙමගින් දත්ත ගබඩා කිරීම හා විශ්ලේෂණය කිරීම සම්බන්ධ අපගේ පිරවැය බෙහෙවින් අඩු කර ගත හැකි ය. තව දුරටත් එය වේගවත් හා විශ්වාසදායක දත්ත ප්‍රවේශය සහ සැකසුම් කාලය ලබා ගැනිමට උපකාරී වේ.

# මෙහෙයුම් අංශය

සමාගමේ සංස්ථාගත අරමුණු ඉටු කර ගැනීමේ දී ලංකා විදුලි සමාගමේ මෙහෙයුම් අංශය 2019 වර්ෂයේ දී එහි පාරිභෝගිකයින් 568,393 කට කාර්යක්‍ෂම සේවාවක් ලබා දෙන ලදී. මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නියාමන මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රමිතීන් හා විදුලිබල රෙගුලාසිවලට අනුකූලව ගිවොපැ 1679 ක් ලංකා විදුලි සමාගම විසින් පාරිභෝගිකයන්ට බෙදා හරින ලදි. 2018 වර්ෂයට සාපේක්‍ෂව පාරිභෝගික පදනමේ 1.7% වාර්ෂික වැඩිවීමක් බෙදා හැරීම් ජාලයට එකතු කර ඇති අතර 3.95% ක හානි ප්‍රතිශතයක් සහිතව නියම කරන ලද ප්‍රමිතීන්ට අනුව සැපයීම් ගුණාත්මක භාවය පවත්වා ගෙන ඇත. මේ අතර, කැළණිය ශාඛාවේ වාර්තා කරන ලද අසාමාන්‍ය පාඩුව හඳුනා ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව 2019 වර්ෂය පුරා සිදු කරන ලද අතර එම පාඩුව වූ ප්‍රදේශය හඳුනා ගැනීමට හැකි විය.

ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ පාරිභෝගික ජනතාවගේ වාර්ෂික පරිභෝජනය ගාස්තු වර්ගය අනුව පහත වගුවේ දක්වා ඇත.

| ගාස්තු වර්ගය | පාරිභෝගික සංඛ්‍යාව | වාර්ෂික පරිභෝජන (කිවොපැ) | වාර්ෂික පරිභෝජන (මෙවොපැ) |
|---|---|---|---|
| ගෘහස්ත | 472,715 | 631,586,701 | 646,824 |
| පොදු කටයුතු හා රජය | 87,100 | 554,534,071 | 644,172 |
| කර්මාන්ත හා හෝටල් | 3,138 | 352,822,584 | 354,580 |
| ආගමික හා පුණ්‍යස්ථාන | 2,614 | 10,927,632 | 11,652 |
| වීථි ආලෝකකරණය | 2,826 | 22,438,418 | 22,704 |
| එකතුව | **568,393** | **1,572,309,406** | **1,679,932** |



## මෙහෙයුම් අංශය (සම්බන්ධිතයි...)

ලංකා විදුලි සමාගම බෙදාහැරීම් පද්ධති වත්කම් පහත පරිදි පවත්වා ගනී.

| වත්කම් වර්ගය | ඒකක | දිග ප්‍රමාණය / ගණන |
|---|---|---|
| 11kV HV OH | කි. මී. | 1017 |
| 11kV HV UG | කි. මී. | 70 |
| LV ABC රැහැන් | ගණන | 4404 |
| උප පොළවල් | ගණන | 2460 |
| විදුලි ස්විච | ගණන | 1844 |
| ස්වයං රික්ලොසස් (Recloses) | ගණන | 18 |

***සැපයීම් විශ්වාසනීයත්වය***

ලංකා විදුලි සමාගමේ ප්‍රධාන කටයුත්ත සැපයුම් විශ්වාසනීයත්වය යි. 2019 වර්ෂයේ දී දුරස්ථ පාලකයෙන් ක්‍රියාකරන "Load Break Switches" 27 ක් ස්ථාපනය කිරීම සැපයුම් විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා දායක විය. සමාගමේ විශ්වාසදායී ආරක්ෂාකාරී බෙදාහැරීම් පද්ධතියක් පවත්වා ගැනීම සඳහා සියලු ජාල මෙහෙයුම් බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානය මගින් නියාමනය කර මෙහෙයුම් කරයි.

විශ්වාසදායකත්වය පිළිබඳ දර්ශක පෙර වර්ෂයේ වාර්තාවලට සාපේක්ෂව පහත දැක්වේ.

| වර්ගය | සාමාන්‍ය ක්‍රියාවිරහිත වීම් දර්ශකය (SAIDI) පැය/ එක් පාරිභෝගිකයෙකුට | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| LV ඇණ හිටීම් | 0.28 | 0.31 | 0.47 | 0.5 | 0.38 | 0.37 |
| 11kV ලංවිස සැලසුම්කරණ ලද | 15.86 | 13.34 | 18.56 | 21.14 | 17.5 | 17.55 |
| 11kV ලංවිස ඇණ හිටීම් | 5.96 | 6.98 | 15.18 | 20.15 | 21.13 | 21.70 |
| 11kV ලංවිම සැලසුම්කරණ ලද | 7.07 | 6.81 | 5.12 | 5.85 | 6.97 | 4.40 |
| 11kV ලංවිම ඇණ හිටීම් | 1.75 | 1.67 | 2.26 | 1.35 | 1.69 | 1.44 |
| 33kV සැලසුම්කරණ ලද | 12.33 | 8.57 | 11.2 | 10.43 | 12.52 | 9.32 |
| 33kV ඇණ හිටීම් | 16.14 | 12.71 | 14.37 | 10.44 | 10.19 | 8.22 |

## මෙහෙයුම් අංශය (සම්බන්ධිතයි...)




***පාරිභෝගික සේවාව***

2019 වර්ෂයේ දී අත්කරගත් සේවා සහතිකවීම්.

| **සේවා විශ්වාසය** | **% ඉටු කරගැනීම** |
|---|---|
| දින 10ක් ඇතුළත ඇස්තමේන්තු නිකුත් කිරීම | 87 |
| ගෙවීම කළ පසු දින 10ක් ඇතුළත නව සම්බන්ධතා ලබාදීම | 89 |
| දින 30 +- 3 සඳහා බිල් කිරීම් කාර්යක්ෂමතාවය | 98 |

ශ්‍රී ලංකාවේ විදුලි බල ජාලකය ස්මාර්ට් ග්‍රිඩ් ජාලකයට පරිවර්තනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගන්නා ලද තීරණයට අනුව, බිල් කිරීම් වැඩි දියුණු කිරීමට හා ස්මාර්ට් මීටර් පහසුකම් ලබා ගැනීමට පාරිභෝගිකයන්ට ඉඩදීමට 2019 වර්ෂයේ දී කෝට්ටේ ප්‍රදේශයේ ස්මාර්ට් මීටර් 3000 ක් යොදවන ලදී. එසේ ම පාරිභෝගික ඉල්ලීම මත දුරස්ථ පාලක මගින් මීටර් කියවීම හා බිල් බෙදාදීම, ඊ බිල් නිකුත් කිරීම ආදී පහසුකම් සමග බිල් කිරීම් කාර්යක්ෂමතාවය මෙයින් වැඩි දියුණු කරන ලදී.

ඇමතුම් මධ්‍යස්ථානය 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා ටෙලිකොම් සමග ස්ථාපිත කරන ලද අතර, මෙම වර්ෂයේ දී එම පහසුකම් භාෂා 3කින් සන්නිවේදනය කරන නියෝජිතයන් 3 දෙනෙකු හඳුන්වාදීම මගින් ඉහළ නංවන ලදී. මෙය ලංකා විදුලි සමාගමේ ඇමතුම් මධ්‍යස්ථානය සඳහා එක් ප්‍රධාන ජයග්‍රහණයක් විය. මෙම ඇමතුම් මධ්‍යස්ථානයේ සේවා තත්ත්වය ඉහළ නැංවීම මගින් මසකට 20,000කට ආසන්න පාරිභෝගික සංඛ්‍යාවකට අන්තර් ක්‍රියාකාරිත්ව පහසුකම් වැඩි දියුණු කර ඇත.

ලංකා විදුලි පාරිභෝගික සේවා පරිසරය සංවර්ධනය කිරීමට අනුව, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සඳහා නව ගොඩනැගිලි 4ක් නිම කර 2019 වර්ෂයේදී පරිහරණයට යොදා ඇත. ඒවා නම් කළුතර ශාඛාවේ පයාගල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය, මීගමුව ශාඛාවේ ජා ඇල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය, කෝට්ටේ ශාඛාවේ කොටිකාවත්ත පාරිභෝගික සේවා මධ්‍යස්ථානය හා ගාල්ල ශාඛාවේ අම්බලන්ගොඩ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය යි.

## මෙහෙයුම් අංශය (සම්බන්ධිතයි...)

ආරම්භයේ සිට ම ලංකා විදුලි සමාගම පාරිභෝගිකයන්ට උපරිම තෘප්තියක් සහිතව සේවා ලබා දෙමින් සිටිය ද, සමාගම විසින් එහි කාර්යයන් වැඩි දියුණු කිරීම සඳහා අලෙවිකරණ කාර්යභාරයක් තුළින් උපයා ගත යුතු වාසි හඳුනාගෙන නොමැත. 2019 වර්ෂයේදී සමාගම සඳහා එම අවශ්‍යතාවයන් හඳුනා ගැනීමෙන් පසු, මාධ්‍ය වැඩසටහනක් සමාගමට හඳුන්වා දුන් අතර මෙහෙයුම් අංශය යටතේ පාරිභෝගික සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ එය ක්‍රියාත්මක කරන ලදී.

ලංකා විදුලි සමාගමෙන් ලබාගත හැකි සේවාවන් පිළිබඳ මහජනයා දැනුවත් කිරීම සඳහා වූ මෙම වැඩසටහන පුවත්පත්, රූපවාහිනී, ගුවන් විදුලි, වෙළඳ දැන්වීම්, ඩිජිටල් මාධ්‍ය සහ දැන්වීම් පුවරුවලින් සමන්විත විය. සමාගමට ජනප්‍රියත්වයක් ලබා ගැනීම සඳහා මෙම වැඩසටහන සීමා කිරීමට සමාගමට අවශ්‍ය නොවූ නමුත්, මෙම ව්‍යාපාරයෙන් බලශක්ති ඉතිරි කිරීමේ ඉඟි පිළිබඳව ජනතාව දැනුවත් කිරීමෙන් රට කෙරෙහි සිය සමාජ වගකීම ඉටු කරන ලදී. සමාජ මාධ්‍යය අලෙවිකරණ වැඩසටහන ද තරුණයින් අතර ජනප්‍රියත්වයට පත් විය. සෑම ශාඛා කාර්යාලයක් ඉදිරිපිටට මෙම අලෙවිකරණ ව්‍යාපාරය මගින් සවිකර ඇති දැන්වීම් පුවරු සහ ලංකා විදුලි සමාගමේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය විසින් පාරිභෝගිකයාට පළමු පියවරේදී ම ලංකා විදුලි සමාගමේ පරිශ්‍රයේදී ලබා ගත හැකි සේවාවන් පිළිබඳ බැලූ බැල්මට අවබෝධයක් ලබා දී ඇත.




පුවත්පත් දැන්වීම




ශාඛාවක දැන්වීම් පුවරුව

# මානව සම්පත් හා පරිපාලනය

මෙම වසරේ සමාගමේ කාර්ය සාධනය මගින් අවධාරණය කරනුයේ, "2019 සඳහා නියම කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයට ප්‍රගතියක් ලබා දීමට අභිප්‍රේරිත, කැප වූ සහ තාක්ෂණිකව දක්ෂ මානව ප්‍රාග්ධනයක් ආයතනයට ලබා දුන් ආකාරය යි." සමාගමේ ඉතා වටිනා වත්කම් සංවර්ධනය හා පෙළඹවීම සඳහා සමාලෝචිත කල පරිච්ඡේදය තුළ පියවර කිහිපයක් ගෙන ඇත.

**පුහුණු සහ සංවර්ධනය**

කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ කුසලතා හා තාක්ෂණික දැනුම සංවර්ධනය කිරීම සඳහා 2019 වර්ෂය තුළ දී දේශීය පුහුණු, විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ සැලසුම් කරන ලද අතර වර්ෂය තුළ දී පවත්වන ලද වැඩසටහන් කිහිපයක් පහත දැක්වේ.

- ★ දකුණු ආසියා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හා බලශක්ති පහසුකම (SAGE) හා ලෝක බැංකුව මගින් සංවිධානය කරන ලද දකුණු ආසියාවේ විදුලි බල අංශයේ වෘත්තීය ජාලයේ කාන්තා නියෝජනය පළමු කලාපීය සමුළුවට ශ්‍රී ලංකා බලශක්ති අංශයේ ආයතනවල සහභාගිත්වය.
- ★ ආසියානු සංවර්ධන බැංකුව විසින් සංවිධානය කරන ලද බංග්ලාදේශයෙහි "ප්‍රජා ප්‍රතිරෝධීතාව පිළිබඳ සම්මන්ත්‍රණය"
- ★ නව බලශක්ති ව්‍යාපාර සම්මන්ත්‍රණය සහ තාක්ෂණික සැරිය - ආසියානු සංවර්ධන බැංකුව - දකුණු කොරියාව
- ★ ආසියානු සංවර්ධන බැංකුව සංවිධානය කරන ලද බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ දැනුම බෙදාගැනීමේ වැඩමුළුව
- ★ KGGTF දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන සහ ආසියානු සංවර්ධන බැංකුව සංවිධානය කරන ලද KGID 2019
- ★ ස්මාර්ට් ජාලකය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සිතියම සංවර්ධනය පිළිබඳ වැඩමුළුව :- සංකල්ප, පරිචයන් සහ තාක්ෂණයන් SAARC හිදී.
- ★ සීමාසහිත ඉංජිනේරු හා තාක්ෂණ උපදේශක (බීපිං) සමාගම (IET) විසින් සංවිධානය කරන ලද පුනර්ජනනීය බලශක්ති උත්පාදනය (RPG) පිළිබඳ IET ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම.

සමාගමේ සියළුම සේවකයන්ට ඔවුන්ගේ අනාගතය සංවර්ධනය කර ගැනීම සඳහා ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට සමාගමේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මූල්‍ය සහාය ලබා ගැනීමට අවස්ථාව ලබාදී ඇත. ඒ අනුව මෙම පහසුකම සේවකයන් 2 දෙනෙකුට ලබා දී ඇති අතර පිළිගත් වෘත්තීය ආයතනවලින් ලබා ගත් වෘත්තීය සුදුසුකම් තිබෙන කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය දීමනා ද මාසිකව ලබා දෙනු ලැබේ. එසේ ම සාමාජික දායක මුදල් ද වාර්ෂිකව ගෙවනු ලැබේ.

**විවිධ ශ්‍රම බලකාය**

සමාගම බඳවා ගැනීමේ අවස්ථාවේ සිට සේවා ස්ථාන විවිධත්වය ප්‍රවර්ධනය කරයි. එසේ ම විවිධත්වය ජනවාර්ගික, ආගමික ලිංග භේදය භෞතික, සංස්කෘතික විවිධත්වයේ කුසලතාවන්ගෙන් සමන්විත වන අතර අප විශ්වාස කරන පරිදි විවිධත්වය, ඉදිරි දර්ශනය, කුසලතා යන අත්දැකීම්වලින් පොහොසත් බවක් ගෙන එනු ඇති අතර එමගින් කුසලතා සංචිතයක් සහ සමාගමේ නිරන්තර නවෝත්පාදන හා වර්ධනය සඳහා සම්පත් පොහොසත් කරයි. එසේ ම සේවකයෙකුගේ ජීවන චක්‍රය ඵලදායි ලෙස කළමනාකරණය කරන ක්‍රියාවලියක් මෙයට ඇතුළත් ය. බඳවා ගැනීමේ සිට තෝරා ගැනීම ප්‍රේරණය, කාර්ය සාධන ඇගයීම, කාර්ය සාධන කළමනාකරණය සහ අවශ්‍යතාවය ඇති වුවහොත් විනය ක්‍රියා පටිපාටි, දුක් ගැනවිලි, හැසිරවීම සහ සුභසාධනය යි.

ලංකා විදුලි සමාගමේ කණ්ඩායමේ බොහෝ දෙනෙක් ආරම්භයේ සිට ම එහි ගමනේ කොටසක් වූ අතර ඔවුන්ගේ වෘත්තීය සමාගමේ වර්ධන මග අනුගමනය කර තිබීම අපගේ ජනතාව සමග සම්බන්ධතාවයකි. මේ අනුව සමාගම කර්මාන්තයේ සාමාන්‍යයට වඩා ඉහළ අගයක් ගන්නා ආරෝපණ අනුගත භුක්ති විඳින අතර සේවක සංඛ්‍යාව සඳහා නව සේවකයින් 15 ක් බඳවා ගන්නා ලදී.

2019 වර්ෂයේදී අලුතෙන් බඳවා ගන්නා ලද සේවකයින් ද ඇතුලත්ව අපගේ මුළු ශ්‍රම බලකාය 1535 ක් වූ අතර, ශාඛා කාර්යාල හත සහ ප්‍රධාන කාර්යාලය අතර ඔවුන් බෙදී සිටියි.

## මානව සම්පත් හා පරිපාලනය (සම්බන්ධිතයි...)




**සේවක සුභ සාධනය**

ප්‍රධාන කාර්යාලයේ වාර්ෂික එකතු වීම කාර්ය මණ්ඩලය 200ක් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සමග උඩවලව සෆාරි හෝටලයේදී 2019 නොවැම්බර් 2 සහ 3 දිනයන් හි දී පැවැත්වුණි. සුභසාධන සංගමයේ සාමාජිකයන් විසින් බොහෝ ක්‍රියාකාරකම් සංවිධානය කර තිබූ අතර, මෙය ඉතා සාර්ථක ප්‍රීතිමත් අවස්ථාවක් විය. සමාගමේ සියලුම සේවකයන්ට 2019 වර්ෂයේ නිවාඩු කාලය ගත කිරීම සඳහා මාස බාගයක වැටුපකට සමාන නිවාඩු දීමනාවක් ලබා දෙන ලදී.

සියලුම සේවකයන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සමාගම විසින් ලබා ගත් ශල්‍ය හා රෝහල් ගත කිරීමේ වියදම් යෝජනා ක්‍රමය මගින් ආවරණය වන අතර, මෙම යෝජනා ක්‍රමය යටතේ බොහෝ සේවකයින්ට ප්‍රතිලාභ ලැබුණි. එසේ ම සමාගම විසින් මෙම සෞඛ්‍ය යෝජනා ක්‍රමය යටතේ එක් සේවකයෙකු සඳහා රු. 800,000.00 බැගින් සේවකයින් 10 දෙනෙකුට බරපතල රෝගාබාධ සඳහා මූල්‍ය ප්‍රදානයන් කරන ලදී.

වර්ෂය තුළ, සමාගමේ සහාය ඇතිව, සුභසාධන සංගමය විසින් ලේ දන්දීමේ ව්‍යාපාරයක් සංවිධානය කරන ලද අතර මෙම අවස්ථාවට සේවකයන් 50 දෙනෙකු පමණ සහභාගී විය.

# මූල්‍ය සමාලෝචනය

වර්ෂය තුළ ලංවිස සමූහයේ ආදායම 5.9% කින් රු. බිලියන 33.71 දක්වා වර්ධනය වී ඇති අතර ඒ සඳහා සමාගමේ විදුලි බල ව්‍යාප්තිය 4.9% කින් වැඩි වීමෙන් සහාය වී ඇත. එසේ ම සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම එහි ආදායම රු. බිලියන 1.25 ක් වූ 42%කින් වර්ධනය කර ඇත. සමූහයේ මුළු ආදායමෙන් 96%ක් දායක වන්නේ විදුලි බලය බෙදා හැරීමෙනි. මෙම ආදායම විවිධ ගාස්තු වර්ගයන්ගෙන් උත්පාදනය කරන අතර මීගමුව සිට ගාල්ල දක්වා වෙරළබඩ ප්‍රදේශ පුරා පැතිරුණු පාරිභෝගිකයන් ආසන්න වශයෙන් 568,250 ඒ සඳහා දායක වේ.




**දළ ලාභය**

වර්ෂය තුළ සමූහයේ දළ ලාභය රුපියල් බිලියන 5.38 දක්වා 9.15%කින් වැඩි වී ඇති අතර ලංකා විදුලි සමාගමේ දළ ලාභය 6.7%කින් වර්ධනයවී ඇත. සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගමේ පෙර වර්ෂයේ දළ පාඩුව වූ රුපියල් මිලියන 7.5 ක් සමග සැසඳීමේදී දළ ලාභය රුපියල් මිලියන 113 දක්වා වර්ධනය වී ඇත. වර්ෂයෙන් වර්ෂය පදනම මත දළ වශයෙන් 16%ක දළ ලාභය ආන්තිකයක් පවත්වා ගැනීමට සමූහයට හැකියාව ලැබී ඇත.

**බදුවලට පසු ලාභය**

දළ ලාභය වැඩිවීමට අමතරව පසුගිය වර්ෂයට සාපේක්ෂව රුපියල් බිලිනය 3.17ක් සිට රුපියල් බිලියන 3.9 දක්වා බදුවලට පෙර ලාභය වැඩිවීම සඳහා සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමෙන් ලද රුපියල් බිලියන 1.99ක ලාභාංශ ආදායම තවත් හේතුවක් විය. කෙසේ වුවද, බදු සඳහා ප්‍රතිපාදන විශේෂයෙන් වර්ෂය තුළ සිදු කරන ලද විලම්භිත බදු ගැලපීම හේතුවෙන් පසුගිය වර්ෂයේ ශුද්ධ ලාභය වූ රුපියල් බිලියන 2.9 ට සාපේක්ෂව වර්ෂය තුළ ශුද්ධ ලාභය රුපියල් බිලියන 2.7 දක්වා අඩු වී තිබුණි. මෙය ශුද්ධ ලාභයෙන් 7%ක අඩුවීමක් විය.

**කොටසකට ඉපැයුම**

2018 වර්ෂය තුළ රුපියල් 25.73 ක් වූ සමූහයේ කොටසකට ඉපැයුම (EPS) සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ රුපියල් 23.76 ක් විය. 2018 වර්ෂයේ රුපියල් 25.94 ක් වූ සමාගමේ කොටසකට ඉපැයුම සමාලෝචිත වර්ෂයේ රුපියල් 23.46 ක් ය.

**ලාභාංශ**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුළ කොටසකට ලාභාංශය රු. 10.04 ක් වශයෙන් සමාගම විසින් රු. බිලියන 1.15 ක් ලාබාංශ ලෙස ගෙවන ලදී.

**හිමිකම් මත ප්‍රතිලාභ**

සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ හිමිකම් මත ප්‍රතිලාභය (ROE) 8.2% ක් වූ අතර, සමාගමේ 2018 වර්ෂයේ 9.8% ක් වූ හිමිකම් මත ප්‍රතිලාභයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ 8.2% ක් විය. එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භයේ හා අවසානයේ මූල්‍ය හිමිකම්වල සාමාන්‍ය කාල පරිච්ඡේදය සඳහා ලාභයෙන් බෙදීම මගින් හිමිකම් මත ප්‍රතිලාභ ගණනය කරනු ලැබේ.

# මූල්‍ය සමාලෝචනය (සම්බන්ධිතයි...)

### මුළු වත්කම්

මුළු වත්කම්වල වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම කාලීන තැන්පතු වැඩිවීම හා ඉන්වෙස්ට්‍රි වැඩිවීම හේතු විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමූහයේ මුළු වත්කම් රු. බිලියන 48.2 දක්වා 8.2%කින් වර්ධනය වී ඇත.

### මුළු වගකීම්

සමූහයේ මූල්‍ය වගකීම්, දිගුකාලීන වගකීම් 50%කින් (2018 වර්ෂයේදී 49%) හා ජංගම වගකීම් 50%කින් (2018 වර්ෂයේ 51%) නියෝජනය වේ. පොලී සහිත ණය ගැනීම් විලම්භිත බදු බැරකම් හා විලම්භිත ආදායම හා පසු කාලීන සේවක ප්‍රතිලාභ බැඳීම්වලින් සමූහයේ දිගුකාලීන වගකීම් වලින් සමන්විත වේ. ශ්‍රී ලං මු වා ප්‍ර - 16- කල්බදු යටතේ හිණුම්ගත කරන ලද කල්බදු බැරකම් පොළී සහිත ණය ගැනීම් තුළ ඇතුළත් වේ.

### මුළු හිමිකම්

මුළු වත්කම් වලින් 70% ක් සමූහයේ කොටස් හිමියන්ගේ හිමිකම් වලින් මූල්‍යයනය වන අතර එය 2019 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 33.97 ක් වූ අතර එහි සුළු කොටස් හිමියන්ගේ හිමිකම් රු. බිලියන 0.150 ක් ඇතුළත් වේ.

### මුදල් ප්‍රවාහය

පෙර කාල පරිච්ඡේදයේ රු. බිලියන 0.684ට සාපේක්ෂව සමූහයේ ඇතුලට ගලා ආ ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය රුපියල් බිලියන 1.8ක් විය. එය ණය ගැතියන්ගෙන් කාර්යක්ෂම මුදල් රැස් කර ගැනීම හා විධිමත් කාරක ප්‍රාග්ධන කළමනාකරණය මීට හේතු විය. සමූහයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් පිටතට ගලා යන ශුද්ධ මුදල් ප්‍රවාහය රු. බිලියන 0.828 ක් වේ. රු. බිලියන 1.05 ක ලාභාංශ ගෙවීමේ හේතුවෙන් රු. බිලියන 1.0 ක් වූ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය පිටතට ගලා යාමක් විය.

### ආයතනික පාලනය

සමූහය / සමාගම ආයතනික පාලනයේ ස්ථාපිත උසස් භාවිතයන් සමග කටයුතු කිරීම සහතික කරන අතර තම ව්‍යාපාරයේ ඉහළම ආචාර ධර්ම ප්‍රමිතීන් සහතික කරයි.

# අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

**කළමනාකරණ සමාලෝචනය**

ලංකා විදුලි සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෘත්තීය සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වන අතර, නිසි වෘත්තීය සැලකිල්ලෙන් රාජකාරී ඉටු කරමින් මහජන උනන්දුවක් දක්වන අවශ්‍යතා සපුරාලන අතර ම සහභාගී වන්නන් සඳහා පුළුල් අර්ථවත් තොරතුරු ලබාදීමෙන් සමාගමෙහි පැහැදිලි බව හා උසස් තත්ත්වයේ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමට ද උපකාරී වේ. එසේ ම 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අධීක්ෂණය යටතේ සමාගම සිටින බැවින් 19 වන සංශෝධනයේ විධි විධානවලට ද අනුකූල වේ.

2019 වර්ෂයේදී අදාළ ප්‍රවීණයන් සමග සවිස්තරාත්මක ව සාකච්ඡා කරමින් අනතුරුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව පුළුල් කිරීමේ වැඩසටහන එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. 2016 වර්ෂයේදී සමාගමේ මෙහෙයුම් හා ක්‍රියාකාරකම්වල ස්වභාවය හා මට්ටමට සාපේක්ෂව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රමාණය කුඩා බව අවධාරණය කරන බාහිර විගණකවරුන් අදහස් දැක්වූ කළමනාකරණ ලිපියේ යෝජනා සමග මෙම වැඩසටහන ආරම්භ කරන ලදී.

ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර සියල්ලම පාහේ ආවරණය වන මූලික වැඩ සැලැස්ම වැඩ ආරම්භ කිරීමට පෙර වර්ෂය අවසානයේ දී විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලදී.

අභ්‍යන්තර විගණන දෙපාතර්තමේන්තුව ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇති අතර එමගින් සියලුම ශාඛා, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ එසේ ම මීටර් පරීක්ෂණ විද්‍යාගාරය, පුහුණු මධ්‍යස්ථානය සහ තොග ගබඩාවක් ආදී වෙනත් ක්‍රියාකාරී ඒකක ද ප්‍රධාන කාර්යාලය ශාඛා - අංශවල රාජකාරී කරන අතරතුර පරීක්ෂා කර බලනු ලැබේ.

ප්‍රධාන කාර්යාලය ශාඛ - අංශ සක්‍රීය පදනමකින් විගණනය කරනු ලැබේ. සංශෝධිත කාල පරිච්ඡේදය තුළ විගණන හා කළමනාකරණ කමිටුව මගින් අනුමත කරන ලද මූලික විගණන සැලැස්ම ප්‍රකාරව තෝරා ගත් ක්‍රියාකාරී ප්‍රදේශ පොකුරු සහ ශාඛා පිළිබඳ විගණනයන් විගණන අංශය විසින් සිදු කරන ලදී.

**යහපාලනය**

**විගණන හා කළමනාකරණ කමිටුව**

රජයේ භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂක විසින් මුලසුන හොබවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් ලංකා විදුලි සමාගමේ විගණන හා කළමනාකරණ කමිටුව සමන්විත වන අතර, එහි මෙහෙයුම්වල ගුණාත්මක ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමේ අරමුණින් රැස්වීම් පැවැත්වීම සහ එමෙන් ම සමාගමේ කාර්යසාධනයන් හි පැහැදිලි භාවය, විනිවිද භාවය සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව රැස්වීම් පවත්වනු ලැබේ. තව ද අපගේ රේඛීය අමාත්‍යාංශයෙන් හා ජාතික විගණන කාර්යාලයෙන් නියෝජිතයන් දෙදෙනෙකු කමිටුවේ නිරීක්ෂකයන් ලෙස ඔවුන්ගේ සහභාගිත්වය සලසනු ලැබේ. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ දී එලදායි රැස්වීම් 4ක් පවත්වන ලදී.

**අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය**

ලංකා විදුලි සමාගමේ කාර්ය සාධනයේ අඛණ්ඩතාවය සහ පැහැදිලිකම වැඩිදියුණු කිරීමේ අරමුණින් 2020 ජුනි සිට බලැපැවැත්වෙන පරිදි "අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය" හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රියාවලිය පුරාම ආශිර්වාදය හා ක්‍රියාකාරී සහභාගිත්වය ලබා දුන් විගණන හා කළමනාකරණ කමිටුවට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විශේෂ ස්තූතිය පිරිනැමේ.


සීආර්ඩී

# පාරිභෝගික සම්බන්ධතාවය ඩිජිටල්කරණය (CRD)

අපගේ ගනුදෙනුකරුවන් සමඟ යහපත් හා ඵලදායී අන්තර් ක්‍රියාකාරීත්වයක් කළමනාකරණය කිරීම සහ අපගේ පාරිභෝගික සම්බන්ධතාවය සැම විටම කලහැකි හොඳම සේවාව ලබාදීම සඳහා අපගේ උපරිම උත්සාහයන් දරන්නේ, අපගේ පාරිභෝගික සම්බන්ධතා ඩිජිටල්කරණය (CRD) මෙවලම් මඟින් අනාගතයේදී තිරසාර වන පාරිභෝගික සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා අපගේ සමාගම ගොඩනඟා අවශ්‍ය කාර්යයන් ඉටුකිරීමට අපට ඉඩ ලබා දේ.

අපගේ අවසාන ඉලක්කය වන්නේ අපගේ පාරිභෝගිකයන්ට අදාළ වන වේගතවත් විශ්වාසදායක සහ පහසු පද්ධති නිර්මාණය කිරීමයි. එවිට ඔවුන්ට සාමාන්‍ය යෙන් ආයෝජන කිරීමට ඇති කාලය සහ උත්සාහය ඉතිරි කරගත හැකිය. අපේ සමාගමේ දෘෂ්ටි කෝණයෙන් බලන කළ, වඩා හොඳ පාරිභෝගික සම්බන්ධතා පද්ධති අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට දෛනික ව්‍යාපාරය හැසිරවීමට ඇති පීඩාව හා ව්‍යාකූලතාවය ලිහිල් කරයි. වඩා හොඳ පාරිභෝගික පහසුවක් ගොඩනැගීම සඳහා "විකුණුම් බල ස්වයංක්‍රීයකරණය" ශක්‍ය විසඳුමක් ලෙස අපි සැබවින්ම සලකන්නෙමු. තම නිවසේ හෝ කලාපයේ ගැටලුවක් හෝ විදුලි බිඳ වැටීමක් වාර්තා කිරීමට පාරිභෝගිකයෙකු අපේ පාරිභෝගික සේවාව සම්බන්ධ කරගැනීමට අදහස් කරන්නේ නම් පාරිභෝගික සේවා කාර්ය මණ්ඩල සාමාජිකයකු සමඟ සම්බන්ධ වීමට බලා සිටිනවාට වඩා ස්වයංක්‍රීය පද්ධතිය හරහා පාරිභෝගිකයාට ඔවුන්ගේ ගැටලුව වාර්තා කිරීමට ඉඩ ලබා දෙන්නෙමු. එම පද්ධතිය මඟින් පාරිභෝගිකයන්ගේ කාලය ඉතිරි කර ගත හැකි වන අතර අපගේ තාක්ෂණික කාර්ය මණ්ඩලයට ගැටලුව නියමිත වේලාවට නිරාකරණය කරගැනීමට අවශ්‍ය වන නිරවද්‍ය තොරතුරු ලබා දිය හැක.

අපගේ පාරිභෝගිකයන්ගේ අත්දැකීම් තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් අපගේ පාරිභෝගිකයන්ට බිල් ගෙවීම් ලියාපදිංචි කිරීම් හෝ වෙනත් විදුලි පරිභෝජන විමසීම් හා තොරතුරු ඔවුන්ගේ නිවාසවල සිටම සුවපහසුව ලබාදීමට ඉඩ සලසන පූර්ණ ක්‍රියාකාරී වෙබ් පහසුකම ලබාගත හැකිය. අපගේ පාරිභෝගිකයන්ට අපගේ වෙබ් අඩවියේ ඇති ඔවුන්ගේම ගිණුම්වලට පිවිසිය හැකි බවත් ඔවුන්ගේ විදුලි පරිභෝජනය සහ ගාස්තු පිළිබඳව දැනගැනීමට අවශ්‍ය සියලු විස්තර දැකගත හැකි බවත් අපි තහවුරු කරමු. කුමන හෝ කාරණයකට පාරිභෝගිකයන්ට තම නිවෙස්වලින් බැහැර යාමට නොහැකි වූ අවස්ථාවක මෙම ආකාරයේ පහසුකම් අතිශයින් ප්‍රයෝජනවත් විය හැකිය.

සෑම කෙනෙකුම කාර්යබහුල ජීවිතයක් ගත කරන බව අපි තේරුම් ගනිමු.  අපගේ පාරිභෝගිකයන්ට ලංවිස පරිපූර්ණ ජංගම යෙදුමක් සමඟ සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීමෙන් ඔවුන්ගේ ජීවිත පහසු කර ගැනීමට අපි උත්සාහ කරමු. එය ඔවුන්ගේ විදුලි පරිභෝජනය පිළිබඳ තොරතුරු ඉක්මන් ප්‍රවේශයක් ලබා දෙන අංගයන්ගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විදුලි ගෙවීම් ක්ෂණිකව සැකසීමේ අවස්ථාවද ඇත.

අපි සෑම විටම උත්සාහ කරන්නේ පාරිභෝගිකයන් වෙත ළඟා වීමට සහ ඔවුන්ගේ ජීවිතවලට වටිනාකමක් එකතු කිරීම සඳහා නව තාක්ෂණයෙන් සහ ප්‍රවණතා වලින් වාසියක් ලබා ගැනීමටයි. වර්තමානයේ සමාජ මාධ්‍ය භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය දිනෙන් දින වේගයෙන් වර්ධනය වේ. මෑත අතීතයේදී සමාජ මාධ්‍ය අලෙවිකරණය ඉහළ යන අලෙවිකරණ මෙවලමක් වී ඇති හෙයින් අපගේ ඉලක්කය වන්නේ අපගේ පාරිභෝගිකයන් සමඟ සන්නිවේදනය කිරීම හා දැනුවත් වීම වන අතර සමාජ මාධ්‍ය දැන්වීම් හරහා අපගේ නවතම උත්සාහයන් සහ යාවත්කාලීන කිරීම් පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමයි.

සමාජ මාධ්‍ය අලෙවිකරණය විසින් වෙළඳ දැන්වීම් හා සන්නිවේදනයේ විභවය විවෘත කර එය නව මට්ටමකට ගෙන එනු ලැබීය. වෙනත් ඕනෑම මාධ්‍ය වේදිකාවක් හා සසඳන විට නිශ්චිත ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත ළඟා වීමට එය විශිෂ්ට මෙවලමක් බවට පත්ව ඇත. එබැවින්, සමාජ මාධ්‍ය භාවිතා කිරීමෙන් අප උපයෝගීතා සමාගමක් ලෙස අපගේ පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවිය හැකිය. එය අපගේ පාරිභෝගිකයන්ට විශාල වටිනාකමක් එක් කළ හැකි බැවින් එය ඔවුන් සමඟ නිරන්තරයෙන් සම්බන්ධතා පවත්වාගෙන යාමට සහ ඊළඟ පරම්පරාවේ පරිශීලක අත්දැකීමක් ලබා දීමට ඉඩ සලසයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඕඊ/ඊ/එල්ඊසීඕ/එෆ්එස්/2019/34    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 අගෝස්තු 31 දින

සභාපති

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

**සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ සහ එහි පරිපාලිතයන්හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ (සමාගම) මූල්‍ය ප්‍රකාශන එහි සමාගම හා එහි පරිපාලිතයන්හි (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය කර ගෙන යාමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය වන ලදී.

2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා සමූහයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං වි ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ

තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**1.3**

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් පැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.■ කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා සහ අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුළත් වේ.

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(1)(ඈ) වගන්තියේ හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ අවශ්‍යතාවයන් ප්‍රකාරව සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන ගොස් තිබුණි.

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 හා 153 වගන්තිවල අවශ්‍යතාවයන්වලට අනුකූල වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ අවශ්‍යතාවයන් ප්‍රකාරව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) ඈ (iv) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද සියලු නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග හා ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බවට,

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස සමාගම ක්‍රියාකර ඇති බව,

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය හා කාර්යයන්වලට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගම සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ,

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

**ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | සමූහය 2019 රු. 000 | සමූහය 2018 රු. 000 | සමාගම 2019 රු. 000 | සමාගම 2018 රු. 000 |
|---|---|---|---|---|---|
| ආදායම | 4 | **33,710,930** | 31,827,090 | **32,460,557** | 30,943,889 |
| විකුණුම් පිරිවැය | | **(28,330,701)** | (26,897,850) | **(27,193,532)** | (26,007,451) |
| **දළ ලාභය** | | **5,380,229** | 4,929,240 | **5,267,025** | 4,936,438 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 5 | **2,733,393** | 1,882,505 | **2,732,010** | 1,885,355 |
| මෙහෙයුම් වියදම් | | **(2,430,040)** | (2,546,817) | **(2,423,086)** | (2,536,063) |
| පරිපාලන වියදම් | | **(3,062,843)** | (2,363,027) | **(3,039,440)** | (2,337,646) |
| **මෙහෙයුම්වලින් ලාභය** | | **2,620,739** | 1,901,901 | **2,536,509** | 1,948,084 |
| මූල්‍ය ආදායම | 6.1 | **1,541,363** | 1,332,554 | **1,536,542** | 1,325,962 |
| මූල්‍ය පිරිවැය | 6.2 | **(162,203)** | (60,624) | **(145,259)** | (56,744) |
| **බදුවලට පෙර ලාභය** | 7 | **3,999,899** | 3,173,831 | **3,927,792** | 3,217,303 |
| ආදායම් බදු වියදම | 8 | **(1,264,513)** | (236,129) | **(1,240,993)** | (247,423) |
| **වර්ෂය සඳහා ලාභය** | | **2,735,386** | 2,937,702 | **2,686,799** | 2,969,879 |
| **ලාභය ආරෝපණය කළ යුතු** | | | | | |
| සමාගමේ හිමිකරුවන්ට | | **2,720,852** | 2,946,320 | | |
| සුළු කොටස් හිමියන්ට | | **14,534** | (8,618) | | |
| **වර්ෂය සඳහා ලාභය** | | **2,735,386** | 2,937,702 | | |
| කොටසකට මූලික ඉපැයුම (රු.) | 9 | **23.76** | 25.73 | **23.46** | 25.94 |

මූල්‍ය ප්‍රකාශනවලට පූර්ණ කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 46 සිට 89 දැක්වේ.

## වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | සමූහය 2019 රු. 000 | සමූහය 2018 රු. 000 | සමාගම 2019 රු. 000 | සමාගම 2018 රු. 000 |
|---|---|---|---|---|---|
| වර්ෂය සඳහා ලාභය | | **2,735,386** | 2,937,702 | **2,686,799** | 2,969,879 |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | | | |
| **පසු කාල පරිච්ඡේදයේ ලාභ හෝ පාඩු ප්‍රකාශනය සඳහා ප්‍රතිවර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම** | | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් උපකරණවල සාධාරණ අගය මත ලාභය | 21.4 | **220,747** | 316,187 | **220,747** | 316,187 |
| වෙනත් විස්තීර්ණ ආදායම් උපකරණවල සාධාරණ අගයෙහි ශුද්ධ වෙනස්වීම් මත විලම්බිත බදු | | **44,419** | (31,619) | **44,419** | (31,619) |
| **පසු කාල පරිච්ඡේදයේ ලාභ හෝ පාඩු ප්‍රකාශනය සඳහා වර්ගීකරණය නොකළයුතු වෙනත් විස්තීර්ණ ආදායම** | | | | | |
| සේවක ප්‍රතිලාභ පසු වගකීම් මත ආයුගණක ලාභ/ (පාඩු) | 24.1 | **(30,595)** | (15,544) | **(29,807)** | (15,544) |
| ආයුගණක පාඩු මත විලම්භිත බදු ප්‍රතිවර්තනය | | **8,567** | 4,352 | **8,346** | 4,352 |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය | 21.2 | **-** | 245,853 | **-** | 245,853 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය මත විලම්භිත බදු අය කිරීම | | **-** | (148,240) | **-** | (148,240) |
| **වෙනත් විස්තීර්ණ ආදායම වර්ෂය සඳහා බදු අය කළ පසු** | | **243,137** | 370,990 | **243,705** | 370,991 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **2,978,523** | 3,308,692 | **2,930,504** | 3,340,870 |
| **ආරෝපණය කළ යුතු** | | | | | |
| සමාගමේ හිමිකරුවන්ට | | **2,963,989** | 3,317,310 | | |
| සුළු කොටස් හිමියන්ට | | **14,534** | (8,618) | | |
| | | **2,978,523** | 3,308,692 | | |

මූල්‍ය ප්‍රකාශනවලට පූර්ණ කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 46 සිට 89 දැක්වේ.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| 2019 දෙසැම්බර් 31 දිනට | සටහන් | සමූහය 2019 රු. 000 | සමූහය 2018 රු. 000 | සමාගම 2019 රු. 000 | සමාගම 2018 රු. 000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 10 | **13,613,721** | 13,168,188 | **13,280,678** | 12,875,186 |
| ආයෝජන දේපල | 11 | **-** | - | **124,538** | 127,847 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | **37,813** | 52,038 | **30,479** | 42,872 |
| පරිපාලිතයන්හි ආයෝජන | 13 | **-** | - | **31,320** | 31,320 |
| වෙනත් විස්තීරණ සාධාරණ අගයට ආදායම් මගින් මූල්‍ය වත්කම් | 14 | **10,806,210** | 10,585,463 | **10,806,210** | 10,585,463 |
| කොටස් සඳහා අත්තිකාරම් | 15 | **-** | - | **47,085** | 47,085 |
| වත්කම් භාවිතය සඳහා අයිතිය | 16 | **145,388** | - | **145,388** | - |
| වෙනත් මූල්‍ය වත්කම් | 19 | **1,751,207** | 1,650,782 | **1,751,207** | 1,650,782 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **26,354,339** | 25,456,471 | **26,216,906** | 25,360,555 |
| **ජංගම වත්කම්** | | | | | |
| වෙළඳ තොගය | 17 | **2,084,383** | 2,001,129 | **1,802,136** | 1,800,123 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු | 18 | **3,331,396** | 3,671,098 | **3,015,604** | 3,494,197 |
| පූර්ව ගෙවීම් හා අත්තිකාරම් | | **249,098** | 430,170 | **249,084** | 425,956 |
| වෙනත් මූල්‍ය වත්කම් | 19 | **15,905,707** | 12,655,916 | **15,865,707** | 12,614,285 |
| මුදල් හා බැංකු ශේෂ | 20 | **366,494** | 416,210 | **347,399** | 411,902 |
| **මුළු ජංගම වත්කම්** | | **21,937,078** | 19,174,523 | **21,279,931** | 18,746,464 |
| **මුළු වත්කම්** | | **48,291,418** | 44,630,994 | **47,496,836** | 44,107,019 |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **මව් සමාගමේ හිමිකම් දරන්නන් සඳහා ආරෝපණය කළ හැකි මුළු හිමිකම්** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 21.1 | **1,145,067** | 1,145,067 | **1,145,067** | 1,145,067 |
| සංචිත | | | | | |
| ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මත ප්‍රත්‍යාගණන සංචිතය | 21.2 | **1,854,817** | 1,854,817 | **1,784,965** | 1,784,965 |
| ආදායම් සංචිත | 21.3 | **340,642** | 340,642 | **340,642** | 340,642 |
| සාධාරණ අගය සංචිත | 21.4 | **8,752,517** | 8,487,351 | **8,752,517** | 8,487,351 |
| රඳවා ගත් ඉපැයුම් | | **21,725,353** | 20,176,529 | **21,513,410** | 19,998,104 |
| **සමාගමේ හිමිකම් දරන්නන් සඳහා ආරෝපණය කළ හැකි මුළු හිමිකම්** | | **33,818,395** | 32,004,404 | **33,536,601** | 31,756,128 |
| **සුළු කොටස් හිමිකම්** | | **150,631** | 136,097 | **-** | - |
| **මුළු හිමිකම්** | | **33,969,027** | 32,140,502 | **33,536,601** | 31,756,128 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පොලී සහිත ණය ගැනීම් | 22 | **87,521** | - | **87,521** | - |
| විලම්භිත බදු වගකීම් | 8.3 | **1,119,750** | 573,810 | **1,117,700** | 583,733 |
| විලම්භිත ආදායම | 23 | **4,759,696** | 4,564,978 | **4,759,696** | 4,564,978 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 24 | **1,144,179** | 1,012484 | **1,141,440** | 1,010,771 |
| | | **7,111,146** | 6,151,272 | **7,106,357** | 6,159,481 |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු | 25 | **6,884,702** | 6,035,620 | **6,527,338** | 5,888,994 |
| ගෙවිය යුතු ආදායම් බදු | | **266,861** | 278,471 | **266,861** | 278,471 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම්වල වර්තමාන කොටස | 22 | **59,679** | 25,128 | **59,679** | 23,956 |
| **මුළු ජංගම වගකීම්** | | **7,211,243** | 6,339,219 | **6,853,878** | 6,191,420 |
| **මුළු වගකීම්** | | **14,322,389** | 12490491 | **13,960,235** | 12,350,902 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **48,291,418** | 44630994 | **47,496,836** | 44,107,019 |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට සහතික කරමි.

**ප්‍රධාන මූල්‍ය නිලධාරී**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර සහතික කරමි.

සභාපති/ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

2020 ජූලි 29, කොළඹ.

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| සමූහය | මව් සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි | | | | | | සුළු කොටස් හිමියන් | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ආදායම් සංචිත | ප්‍රත්‍යාගණන අතිරික්තය | සාධාරණ අගය සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු | | |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,145,067 | 340,642 | 1,757,203 | 8,202,782 | 17,941,409 | 29,387,103 | 146,184 | 29,533,287 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 2,946,320 | 2,946,320 | (8,618) | 2,937,702 |
| වෙනත් විස්තීරණ ආදායම | - | - | 97,613 | 284,569 | (11,200) | 370,982 | 8 | 370,990 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | 97,613 | 284,569 | 2,935,120 | 3,317,302 | (8,610) | 3,308,692 |
| මව් සමාගම විසින් ලාභාංශ | - | - | - | - | (700,000) | (700,000) | - | (700,000) |
| පරිපාලිතයන් විසින් සුළු කොටස් හිමියන්ට ලාභාංශ | - | - | - | - | - | - | (1,476) | (1,476) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,145,067 | 340,642 | 1,854,817 | 8,487,351 | 20,176,529 | 32,004,405 | 136,097 | 32,140,503 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 2720,852 | 2,720,852 | 14,534 | 2,735,386 |
| වෙනත් විස්තීරණ ආදායම | - | - | - | 265,166 | (22,029) | 243,137 | - | 243,137 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | - | 265,166 | 2,698,824 | 2,963,990 | 14,534 | 2,978,523 |
| මව් සමාගම විසින් ලාභාංශ | - | - | - | - | 1,150,000 | (1,150,000) | - | (1,150,000) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,145,067 | 340,642 | 1,854,817 | 8,752,517 | 21,725,353 | 33,818,395 | 150,631 | 33,969,027 |

මූල්‍ය ප්‍රකාශනවලට පූර්ණ කොටසක් වශයෙන් ගිණුම්කරණ හා සටහන් පිටු අංක 46 සිට 89 දැක්වේ.

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 000 | ආදායම් සංචිත රු. 000 | ප්‍රත්‍යාගණන අතිරික්තය රු. 000 | සාධාරණ අගය සංචිත රු. 000 | රඳවාගත් ඉපැයුම් රු. 000 | මුළු හිමිකම් රු. 000 |
|---|---|---|---|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,145,067 | 340,642 | 1,687,352 | 8,202,782 | 17,739,414 | 29,115,257 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 2,969,881 | 2,969,881 |
| වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම | - | - | 97,613 | 284,569 | (11,192) | 370,991 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | 97,613 | 284,569 | 2,958,689 | 3,340,871 |
| ලාභාංශ | - | - | - | - | (700,000) | (700,000) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,145,067 | 340,642 | 174,965 | 8,487,351 | 19,998,072 | 31,756,097 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 2,686,799 | 2,686,799 |
| වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම | - | - | - | 265,166 | (21,461) | 243,705 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | - | 265,166 | 2,665,338 | 2,930,504 |
| ලාභාංශ | - | - | - | - | (1,150,000) | (1,150,000) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,145,067 | 340,642 | 1,784,965 | 8,752,517 | 21,513,410 | 33,536,601 |

මූල්‍ය ප්‍රකාශනවලට පූර්ණ කොටසක් වශයෙන් ගිණුම්කරණ හා සටහන් පිටු අංක 46 සිට 89 දැක්වේ.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | සමූහය 2019 රු. 000 | සමූහය 2018 රු. 000 | සමාගම 2019 රු. 000 | සමාගම 2018 රු. 000 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| බදුවලට පෙර ලාභය | | **3,999,899** | 3,173,831 | **3,927,792** | 3,217,303 |
| ගැලපීම් | | | | | |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය | | **892,193** | 896,603 | **865,273** | 872,398 |
| විලම්භිත ආදායම ක්‍රමක්ෂය | | **(386,846)** | (368,069) | **(386,846)** | (368,069) |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | **12,392** | 16,756 | **12,392** | 14,923 |
| ආයෝජන දේපල ක්ෂය | | **-** | - | **3,309** | 1,817 |
| වත්කම් භාවිතා කිරීමේ අයිතිය-ක්ෂය | | **-** | - | **67,120** | - |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | **191,546** | 142,901 | **190,254** | 142,517 |
| ලැබිය යුතු වෙළඳ ශේෂ හානිකරණ | | **562,230** | (2,026) | **562,230** | 3,710 |
| සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන | | **(74,115)** | 49,898 | **(74,115)** | 49,898 |
| දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ලාභ/ පාඩු | | **20,257** | 14,655 | **20,257** | 14,655 |
| පොලී ආදායම | | **(1,541,363)** | (1,332,554) | **1,536,542** | (1,325,962) |
| පොලී වියදම | | **162,203** | 20,307 | **145,259** | 16,426 |
| ලාභාංශ ආදායම | | **1,993,636** | (1,165,881) | **(1,993,636)** | 1,169,326 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | **1,844,760** | 1,446,420 | **1,802,746** | 1,470,289 |
| තොග (වැඩිවීම)/ අඩුවීම | | **(9,139)** | (515,964) | **72,103** | (515,249) |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම් (වැඩිවීම)/ අඩුවීම | | **181,072** | (247,648) | **176,872** | (243,434) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ වැඩිවීම/ (අඩුවීම) | | **222,529** | (690,352) | **(83,637)** | (544,183) |
| වෙළඳාම හා වෙනත් ගෙවිය යුතු ශේෂ වැඩිවීම/ (අඩුවීම) | | **849,083** | 919,542 | **638,344** | 818,357 |
| විලම්බිත ආදායම වැඩි කිරීම/ (අඩුවීම) | | **581,565** | 627,393 | **581,565** | 627,393 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල්** | | **3,224,811** | 1,539,390 | **3,187,991** | 1,613,173 |
| ගෙවූ ආදායම් බදු | | **(1,197,133)** | (797,030) | **(755,010)** | (746,753) |
| ගෙවූ පොලී වියදම | | **(162,203)** | (20,307) | **(145,259)** | (16,426) |
| ගෙවූ විශ්‍රාම පාරිතෝෂික | | **(59,851)** | (37,179) | **(59,585)** | (37,089) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | **1,805,624** | 684,874 | **2,228,138** | 812,905 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| වෙනත් මූල්‍ය වත්කම්වල ශුද්ධ ආයෝජන | | **(3,350,217)** | (3,298,512) | **(3,351,847)** | (3,352,726) |
| දේපල, පිරියත හා උපකරණ ශුද්ධ අත්කර ගැනීම | | **(1,013,367)** | (1,466,931) | **(1,231,709)** | (1,398,067) |
| වත්කම් භාවිත අයිතිය ශුද්ධ අත්කර ගැනීම | | **-** | - | **(212,508)** | - |
| ආයෝජන දේපල අත්කර ගැනීම | | **-** | - | **-** | (68,943) |
| ලැබූ පොලී ආදායම | | **1,541,363** | 1,332,554 | **1,536,542** | 1,325,962 |
| ලැබූ ලාභාංශ ආදායම | | **1,993,636** | 1,165,881 | **1,993,636** | 1,169,326 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ/ (යෙදවූ) ශුද්ධ මුදල්** | | **(828,585)** | 2,267,007 | **(1,265,885)** | 2,324,448 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| මව් සමාගමේ හිමිකරුවන් සඳහා ලාභාංශ ගෙවීම | | **(1,150,000)** | (700,000) | **1,150,000** | (700,000) |
| වත්කම් භාවිත අයිතිය ශුද්ධ අත්කර ගැනීම මත කල්බදු වගකීම | | **141,679** | - | **141,679** | - |
| සුළු කොටස් හිමියන් සඳහා ලාභාංශ ගෙවීම | | **-** | (1,476) | **-** | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල්** | | **(1,008,321)** | (701,476) | **(1,008,321)** | (700,000) |
| **මුදල් හා මුදල් සමාන ශේෂවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | **(31,282)** | (2,283,609) | **(46,069)** | (2,211,543) |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන ශේෂය** | | **392,255** | 2,675,865 | **387,947** | 2,599,488 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන ශේෂය** | | **360,972** | 392,255 | **341,878** | 387,947 |

මූල්‍ය ප්‍රකාශනවලට පූර්ණ කොටසක් වශයෙන් ගිණුම්කරණ හා සටහන් පිටු අංක 46 සිට 89 දැක්වේ.

## 1 ආයතනික තොරතුරු

### 1.1 පොදු

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම සංස්ථාගත හා ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද සීමිත වගකීම සමාගමකි. එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 03, ගාලු පාරේ ඊ. එච්. කුරේ ගොඩනැගිල්ලේ අංක 411 යන ස්ථානයේ පිහිටා ඇති අතර එය එහි ප්‍රධාන ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය වේ.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යය වූයේ ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලි බලය මිලදී ගෙන ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ හා මීගමුව ප්‍රදේශවල පිහිටා ඇති සමාගමේ ශාඛා මගින් ගෘහාශ්‍රිත හා කර්මාන්ත පාරිභෝගිකයන්ට විදුලි බලය සිල්ලරට සැපයීමයි.

එහි පරිපාලිතයන් වන සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම, රට තුළ විදුලි බලය බෙදා හැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ යෙදී සිටී. තව ද පරිපාලිතයක් වන සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම විදුලි බල මීටර් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ කාර්යයේ යෙදී සිටී.

### 1.3 මව් ආයතනය හා පරම පාලන පාර්ශවය

අධ්‍යක්ෂකවරුන්ගේ මතය අනුව 1969 අංක 17 දරණ විදුලි බල මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත ලංකා විදුලි බල මණ්ඩලය සමාගමේ මව් ව්‍යාපාරය වේ.

### 1.4 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය

2020 ජූලි 29 දින දරණ අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනාවට අනුකූලව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.

## 2. පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලං මු ව ප්‍ර හා ශ්‍රී ලං ගි ප්‍ර (මින් පසු ශ්‍රී ලං මු ව ප්‍ර ලෙස දැක්වෙන) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිඵල වලට අනුකූලව සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් ප්‍රමාණාත්මක විෂයයන් හැර ඓතිහාසික පිරිවැය මත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළයෙල කර ඇත.

- වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සාධාරණ අගයට ගණනය කර ඇත.
- අත්සන් කර ගන්නා අවස්ථාවේ පිරිවැයට ගණනය කරන ලද ඉඩම් හා ගොඩනැගිලි පසුව ප්‍රත්‍යාගණන මුදලට ගණනය කරන අතර ඒවා ප්‍රත්‍යාගණන දිනයට සාධාරණ අගයට වේ.
- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වගකීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම ලෙස හඳුනාගනු ලැබේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර වෙනත් ආකාරයෙන් දක්වා තිබීම හැර, සියලු වටිනාකම් ආසන්නතම දහස (000) දක්වා වටයා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූල වේ.

### 2.1.1 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මකින් සමාගම පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳ ව සමාගමේ කළමනාකරණය විසින් තක්සේරුවක් සිදු කර ඇති අතර දීර්ඝ අනාගත කාලය සඳහා ව්‍යාපාරය පවත්වා ගැනීමට එය සතුව සම්පත් ඇති බවට සෑහීමකට පත්ව ඇත. තව ද අඛණ්ඩ පැවැත්මකින් තබා ගැනීමට සමාගමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කරවන කිසිඳු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට කළමනාකරණය දැනුවත් ව නොමැත. එබැවින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මතා පදනම මත ඉදිරියටත් සකස් කරනු ලැබේ.

### 2.1.2 ඒකාබද්ධ කිරීමේ පදනම

වාර්තා කරන දිනයට සමාගමේ හා එහි පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශනවලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. සමූහය විවෘත වීමේදී පාලනය ඉටු කර ගැනීම හෙවත් ආයෝජන සමග එහි සහභාගිත්වයෙන් විචල්‍ය ලාභය සඳහා අයිතිය ඇති අතර ආයෝජක කෙරෙහි බලය මගින් එම ලාභ සඳහා හැකියාව ඇත. විශේෂයෙන් පහත කරුණු සමූහයට තිබෙන විටෙක පමණක් ආයෝජන පාලනය කරයි.

- ආයෝජක කෙරෙහි බලය (එනම්; ආයෝජකගේ අදාළ කාර්යයන් මෙහෙයවීම සඳහා ප්‍රවර්තන හැකියාව ලබා දෙන පවත්නා හිමිකම්)
- ආයෝජක සමග එහි සහභාගිත්වය සඳහා විචල්‍ය ලාභවලට පාත්‍රවීම සඳහා විවෘත වීම හෝ හිමිකම්
- එහි ලාභවලට බලපෑම සඳහා ආයෝජක කෙරෙහි ශක්තිය සඳහා හැකියාව.

සාමාන්‍යයෙන් පාලනයේ දී වැඩි දෙනෙකුගේ ඡන්දය දීමේ හිමිකම් පූර්ව නිගමනයක් වේ. මෙම පූර්ව නිගමනයට සහාය සඳහා ඡන්දය දීමක් හා ආයෝජකගේ සමාන හිමිකම් වැඩි ප්‍රමාණයක් සමූහයට නොවන විට සමූහය එහි ශක්තිය ආයෝජනය කෙරෙහි තිබේ ද යන්න තක්සේරු කිරීමේදී සමූහය පහත සඳහන් කරුණු ඇතුළත්ව සියලු අදාල කරුණු හා සැලකිල්ලට ගත යුතු කරුණු සලකා බලනු ලැබේ.

- ආයෝජකගේ වෙනත් ඡන්ද හිමිකරුවන් සමග ගිවිසුම්ගත වැඩපිළිවෙල.
- වෙනත් ගිවිසුම්ගත වැඩ පිළිවෙලකින් පැන නගින හිමිකම්.
- සමූහය ඡන්දය දීමේ හිමිකම් හා විභව්‍ය ඡන්දය දීමේ හිමිකම්.

සමූහය, පරිපාලිතයන්හී පාලනය තිබේ ද නැද්ද යන්න යළි තක්සේරු කරන අතර, අදාල කරුණු සැලකිල්ලට ගත යුතු කරුණුවලින් දැක්වෙන්නේ පාලන මූලිකාංග තුනෙන් හෝ එකක් හෝ වැඩි ගණනක් සඳහා වෙනස්වීම් තිබෙන බවයි. පරිපාලිතය කෙරෙහි සමූහයේ පාලනය ලබා ගන්නා විට පරිපාලිතයන් ඒකාබද්ධ කිරීම ආරම්භ කරන අතර පරිපාලිතය කෙරෙහි සමූහයේ පාලනය නැති වන විට එය අවසන් වේ. පරිපාලිතයක වර්ෂය තුළ පත් කරගත් හෝ අපහරණය කළ වත්කම් බැරකම්, ආදායම් සහ වියදම් සමූහය පාලනය ලබා ගන්නා දින සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර එය පරිපාලිතය පිළිබඳ සමූහයේ පාලනය අවසන් වන දිනය දක්වා වේ.

ලාභය හෝ පාඩුව සහ වෙනත් විස්තීර්ණ ආදායමේ (OCI) එක් එක් සංරචක සමූහයේ මව් සමාගමේ කොටස් හිමිකරුවන් හා සුළු කොටස් හිමිකරුවන් සඳහා ආයෝජනය කෙරේ. එහිදී සුළු කොටස් හිමිකරුවන්ගේ ඌනතා ශේෂයක් තිබුණ ද එසේ සිදු කෙරේ. පිරිපාලිතයන්ගෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම සඳහා අවශ්‍ය විටෙක පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම සිදු කෙරේ.

ඒකාබද්ධ කිරීමේදී සාමාජිකයන් හා සමූහයක් අතර ගනුදෙනුවලට අදාලව සියළු අන්තර් සමූහ වත්කම් හා බැරකම් ස්කන්ධය, ආදායම්, වියදම් සහ මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන් ඉවත් කෙරේ. පාලන අහිමිවීමක් නොමැතිව පරිපාලිත හිමිකම් අයිතියක වෙනස්වීමක් හිමිකම් ගණුදෙනුවක් ලෙස ගිණුම්ගත කෙරේ.

පරිපාලිතය පිළිබඳ පාලනය සමූහයට අහිමි වේ නම් එහිදී අදාල වත්කම් (කීර්ති නාමය ඇතුළත්ව) සුළු කොටස් හිමිකරුවන්ගේ අයිතීන් සහ හිමිකම් පිළිබඳ වෙනත් සංරචක හඳුනා නොගන්නා අතර ලැබීමක් හෝ අලාභයක් යන ඕනෑම ප්‍රතිඵලයක් ලාභයේ හෝ පාඩුවෙහි හඳුනා ගනී. ඕනෑම රඳවා ගත් ආයෝජනයක් සාධාරණ අගයට හඳුනා ගනී.

පරිපාලිතයන් හි මූල්‍ය ප්‍රකාශන සංගත ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනිමින් මවු සමාගම පරිදි එකම වාර්තා කරන කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරනු ලැබේ.

ඒකාබද්ධ කිරීමේ කාර්යය සඳහා ඡන්දයදීමේ අයිතිය හා පරිපාලිත සමාගම් රඳවා ගැනීමේ පාලනය පිළිබඳ ප්‍රධානත්වය සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම සතු වන බැවින් සීමාසහිත අන්ටෙ ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම හා සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම එහි පරිපාලිතයන් ලෙස සලකනු ලැබේ.

### 2.1.3 ජංගම / ජංගම නොවන වර්ගීකරණය

ජංගම / ජංගම නොවන වර්ගීකරණය මත පදනම් ව සමූහය වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කරයි.

වත්කමක් ජංගම වත්කමක් වන්නේ,

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි වීම හෝ විකිණීම හෝ පරිභෝජනය අපේක්ෂා කළ විට
- මූලිකව වෙළඳාම සඳහා පවත්වන විට
- වාර්තාකරන කාල පරිච්ඡේදයෙන් පසු මාස දොළහක් ඇතුළත උපලබ්ධි වීම සඳහා අපේක්ෂා කළ විට හෝ
- මුදල් හා මුදල් සමාන ශේෂ වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක්වත් හුවමාරු කර ගැනීම හෝ වගකීමක් පියවීම සඳහා භාවිතා කිරීම සීමා නොකලහොත් වෙනත් සියලු වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කෙරේ.

වගකීමක් ජංගම වන්නේ,

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී නිරවුල් කිරීම සඳහා අපේක්ෂා කළ විට,
- මූලික වශයෙන් වෙළඳාම් කාර්යය සඳහා ඇතිවීම
- වාර්තා කරන කාල පරිච්ඡේදයෙන් පසු මාස 12 ක් ඇතුළත නිරවුල් කළ යුතු විට හෝ
- වාර්තා කරන කාල පරිච්ඡේදයෙන් පසු අවම වශයෙන් මාස 12ක් සඳහා මුදල් හෝ අනෙක් වත්කම් මාරු කිරීම මගින් වගකීම නිරවුල් කිරීම විලම්බනය කිරීම සඳහා වාර්තාකරණ දිනයට හිමිකමක් නොමැති විට

වෙනත් සියලු වගකීම් ජංගම නොවන ලෙස සමූහය වර්ගීකරණය කරයි.

විලම්භිත බදු වත්කම් හා වගකීම් ජංගම නොවන වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ.

### 2.2 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන්.

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල වාර්තා කරන ලද ප්‍රමාණයන් යොදාගැනීමේදී බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීම සඳහා කළමනාකරණයට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සමූහයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අත්‍යාවශ්‍ය වේ.

කෙසේ වුවද මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතභාවය අනාගත කාල පරිච්ඡේදයන් තුළ දී බලපාන වත්කමේ හෝ වගකීමේ ධාරණ අගය සඳහා ප්‍රමාණවත් ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵලයක් ලැබීමට ඉවහල් වේ.

ඇස්තමේන්තු හා දක්වන ලද උපකල්පනයන් යාවත්කාලීන වන පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය හා කිසියම් අනාගත කාල පරිච්ඡේදයක් බලපායි නම් ගිණුම්කරන ඇස්තමේන්තු සංශෝධන වලදී හඳුනා ගනු ලැබේ.

අවදානම් හා අවිනිශ්චිතතාවයන් සඳහා සමූහයේ අනාවරණයට අදාළ වන අනෙකුත් හෙළිදරව් කිරීම් ඇතුලත් වන්නේ,

- මූල්‍ය උපකරණ අවදානම් කළමණාකරණය හා ප්‍රතිපත්ති - සටහන් 29
  සංවේදිතා විශ්ලේෂණ හෙළිදරව් කිරීම් - සටහන් 24

**විනිශ්චයන්**

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියවලියේදී, පහත සඳහන් විනිස්වයන් කළමණාකරණය විසින් සිදුකර ඇති අතර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන් මත ඒවායේ වඩාත් වැදගත් බලපෑමක් ඇත.

**අළුත් කිරීම් හා අවසන් කිරීමේ විකල්පයන් සමග ගිවිසුම්වල කල්බදු කාලය තීරණය කිරීම - සමූහය බදුගන්නා ලෙස**

කල් බදු කාල සීමාව අවලංගු කළ නොහැකි කාල සීමාව ලෙස සමූහය තීරණය කරනුයේ, කල් බදු කාලය දීර්ඝ කිරීමේ වකල්පයක් මගින් ආවරණය වන ඕනෑම කාල පරිච්ඡේදයක් සමග එය ක්‍රියාත්මක කිරීම සාධාරණ යැයි නිශ්චිත නම් හෝ කල්බදු ක්‍රමය අවසන් කළ හැකි විකල්පයක් මගින් ආවරණය වන යම් කාල සීමාවක් සමග එය ක්‍රියාත්මක නොකිරීමට සාධාරණ වේ නම්ය.

සමාගම සතුව දීර්ඝ කිරීම් හා අවසන් කිරීමේ විකල්ප ඇතුලත් කල්බදු ගිවිසුම් කිහිපයක් ඇත.කල්බදු අලුත් කිරීම හෝ අවසන් කිරීම සඳහා වන විකල්පය උපයෝගි කර ගන්නේද, නැද්ද යන තක්සේරු කිරීමේදී සමූහය විනිස්වය අදාළ කර ගනී. එනම් දීර්ග කිරීම හෝ අවසන් කිරීම සඳහා ආර්ථික අනුබලයන් ඇති කරන සියලු අදාළ කරුණු සැලකිල්ලට ගනී. ආරම්භ කිරීමේ දිනයෙන් පසුව, එහි පාලනය තුළ සහ අලුත් කිරීම හා අවසන් කිරීම සඳහා විකල්පය සිදු කිරීම හෝ සිදු නොකිරීම සඳහා එහි හැකියාවට බලපාන වැදගත් සිදුවීමක් හෝ සිදු වීමක වෙනසක් ඇත්තේ නම් සමූහය කල් බදු සීමාව නැවත තක්සේරු කරයි. උදා :- සැලකිය යුතු කල් බදු වැඩි දියුණු කිරීම් හෝ කල් බදු වත්කම් සැලකිය යුතු ලෙස වෙනස් කිරීම.)

තවද අවසන් කිරීමේ විකල්පයන් විසින් අනාවරණය කරන කාල පරිච්ඡේදයන් කල් බදු කාලසීමාවේ කොටසක් ලෙස ඇතුලත් කර ඇත්තේ ඒවා ක්‍රියාත්මක නොකිරීමට සාධාරණ ලෙස සහතික වූ විට පමණි.

**දේපල කල්බදු වර්ගීකරණය - සමූහය බදු කරු ලෙස**

සමූහය එහි ආයෝජන දේපල කළඹ තුළ වාණිජ දේපල කල්බදු ඇතුලත් වී ඇත. වැඩපිළිවෙලෙහි කරුණු සහ කොන්දේසි පිළිබඳ ඇගයීමත් පදනම්ව සමූහය තීරණය කර ඇත. එනම් වාණිජ දේපලෙහි ආර්ථික ජීව කාලයේ ප්‍රධාන කොටසක් සමන්විත නොවන කල්බදු කාලසීමාව හා සැලකිය යුතු ලෙස වානිජ දේපල වල සාධාරණ වටිනාකමට ප්‍රමාණවත් නොවන අවම කල් බදු ගෙවීම් වල වර්තමාන වටිනාකම. එය මෙම දේපල වල හිමිකාරිත්වයට අදාළ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස රඳවාගෙන ඇති අතර මෙහෙයුම් කල් බදු ලෙස ගිවිසුම් සඳහා ගිණුම් සැලකිය යුතු ලෙස රඳවා ගනී.

**දේපළ, පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය**

එක් එක් වාර්තාකරණ දිනයට දේපල, පිරියත හා උපකරණවල අවශේෂ වටිනාකම් ප්‍රයෝජනවත් ජීව කාල හා ක්ෂය කිරීම් ක්‍රම සමාගම හා සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම වටිනාකම්, ඇස්තමේන්තු කිරීම රේටයන් ක්‍රම පිළිබඳ කළමනාකරණයේ විනිශ්චයන් සිදු කරන අතර, ඒවා අවිනිශ්චිතතාවයන්ට යටත් වේ.

**ඇස්තමේන්තු හා උපකල්පනයන්**

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් හා වගකීම්වල ධාරණ අගය සඳහා ප්‍රමාණාත්මක ගැලපීමක් ඇතිවීමේ සැලකිය යුතු අවදානමක් ඇති වාර්තා කරන දිනයට අනාගතය සහ අනෙකුත් ප්‍රධාන ප්‍රභවයන් තක්සේරු කිරීමේ අවිනිශ්චිතතාවයන් පිළිබඳ ප්‍රධාන උපකල්පන පහත විස්තර කෙරේ. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට තිබෙන පරාමිතීන් සමූහය එහි උපකල්පන හා ඇස්තමේන්තු පදනම් කර ගනී. අනාගත සංවර්ධනයන් පිළිබඳ තත්ත්වයන් හා උපකල්පන පවතින් අතර කෙසේ වුව ද, සමූහයේ පාලනයෙන් බැහැරව පැන නගින වෙළඳපල වෙනස්වීම් හෝ සැලකිල්ලට ගත යුතු තත්ත්වයක් හේතුවෙන් වෙනස් විය හැක. එම වෙනස්වීම් සිදුවන විට වෙනස්වීම් උපකල්පයන් හි නිරූපණය වේ.

**කල් බදු/ වර්ධක ණය ගැනීම් අනුපාතයන් ඇස්තමේන්තු කිරීම.**

කල්බදු තුල ගම්‍ය පොලී අනුපාතය සමූහයට පහසුවෙන් තීරණය කළ නොහැක. එබැවින් කල් බදු වගකීම් ගණනය කිරීම් සඳහා වර්ධක ණය ගැනීම් අනුපාතය (IBR) භාවිත කරයි. වර්ධක ණය ගැනුම් අනුපාතය යනු සමාන කාල සීමාවක් තුළ ණය ලබා ගැනිම සඳහා සමූහය ගෙවිය යුතු පොලී අනුපාතය වන අතර ඒ හා සමාන ආරක්ෂාවක් සහිතව සමාන ආර්ථික පරිසරයක භාවිතා කිරීමේ අයිතියට සමාන වටිනාකමක් ඇති වත්කමක් ලබා ගැනිමට අවශ්‍ය අරමුදල් වේ. එම නිසා සමූහය විසින් ගෙවිය යුතු දේ වර්ධක ණය ගැනීම් අනුපාතය මගින් පිළිබිඹු වන අතර එය නිරීක්ෂණය කළ හැකි ආයතනයක් නොමැතිවීම (එනම් මූල්‍ය ගනුදෙනු සඳහා ඇතුළත් නොවන පරිපාලිතයන් සඳහා) හෝ කල්බදු නියමයන් යන කොන්දේසි පිළිබිඹු වන පරිදි ඒවා ගැළපිය යුතු විටදී (උදාහරණයක් ලෙස කල්බදු අනුබද්ධ ක්‍රියාකාරී මුදල්වල නොමැති විට යෙදවුම් භාවිත කරමින් වර්ධක ණය ගැනීම් අනුපාතය ඇස්තමේන්තු කරයි. (වෙළඳපොළ පොලී අනුපාත වැනි) සහ යම් නිශ්චිත ඇස්තමේන්තු සිදු කිරීමට අවශ්‍ය වේ. (පරිපාලිතයන්ගේ අසමාන වූ ණය ශ්‍රේණිගත කිරීම වැනි)

**දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය**

සමූහයේ හා සමාගමේ ඉඩම් හා ගොඩනැගිලි සාධාරණ අගයට නිරූපණය වේ. ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කිරීම සඳහා ස්වාධීන තක්සේරු ප්‍රවීණයන් සමූහය විසින් යොදා ගනී.

**ලැබිය යුතු වෙළඳ ශේෂ හා ගිවිසුම්ගත වත්කම්වල අපේක්ෂිත ණය පාඩු සඳහා ප්‍රතිපාදනය**

ලැබිය යුතු වෙළඳ ශේෂ හා ගිවිසුම් වත්කම් සඳහා අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම සඳහා සමූහය විසින් ප්‍රතිපාදන ගණිත න්‍යායක් භාවිත කරයි. ප්‍රතිපාදන අනුපාත පදනම් වන්නේ ගෙවිය යුතු දින මත ය.

ප්‍රතිපාදන න්‍යාය සමූහයේ ඓතිහාසිකව නිරීක්ෂණය කරන ලද පැහැර හැරී අනුපාතය මත මූලිකව පදනම් වේ. ඉදිරි දැක්ම තොරතුරු සමඟ ඓතිහාසික ණය පාඩු ගැලපීම් කිරීම සඳහා සමූහය විසින් ගණිත න්‍යාය ක්‍රමාංකනය කරනු ලැබේ. සෑම වාර්තාකරන දිනයකට ම ඓතිහාසිකව නිරීක්ෂණය කරන ලද පැහැර හැරී අනුපාත යාවත්කාලීන කරන ලද අතර, ඉදිරි දැක්ම ඇස්තමේන්තුවල ඇති වෙනස්කම් විශ්ලේෂණය කරනු ලැබේ.

ඓතිහාසිකව නිරීක්ෂණය කරන ලද පැහැර හැරී අනුපාත, ආර්ථික තත්ත්වයන් පිළිබඳ අනාවැකිය සහ අපේක්ෂිත ණය පාඩු අතර සහසම්බන්ධතාවය පිලිබඳ තක්සේරු කිරීම වැදගත් ඇස්තමේන්තුවකි. තත්ත්වයන් හි වෙනස්කම් සහ ආර්ථික කරුණු පිළිබඳ අනාවැකි සඳහා අපේක්ෂිත ණය පාඩු සඳහා ප්‍රමාණය සංවේදී වේ. සමූහයේ ඓතිහාසික ණය පාඩු අත්දැකීම් සහ ආර්ථික කරුණු පිළිබඳ අනාවැකි අනාගතයේදී පාරිභෝගිකයාගේ සත්‍ය පැහැර හැරීමක් ද නියෝජනය නොකරනු ඇත.

**වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්ල සාධාරණ අගය**

මූල්‍ය වත්කම්වල සාධාරණ අගය නිරීක්ෂණය කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලෙස විශ්ලේෂණය කෙරෙන අතර ඒ සඳහා නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ මිලක් නොමැති තක්සේරු කිරීමේ ක්‍රම උපයෝගී කරගනිමින් තීරණය කරනු ලැබේ. වෙනත් විස්තීර්ණ ආදායම මගින් මූල්‍ය වත්කම් සාධාරණ අගයට තක්සේරු කිරීම මූල්‍ය ප්‍රකාශනවල සටහන් 31 හි සවිස්තරාත්මකව විස්තර කෙරේ.

විකුණුම් සිදු කිරීමේදී භාවිතා කරන යෙදවුම්වල වැදගත්කම පිළිබිඹු කරන සාධාරණ වටිනාකම් අනුපිළිවෙල භාවිතා කරමින් සමූහයේ සාධාරණ වටිනාකම් ගණනය කරනු ලැබේ. සාධාරණ වටිනාකම් අනුපිළිවෙල මූල්‍ය ප්‍රකාශවල සටහන් 31හි දැක්වේ.

**නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය හා ඒවායේ බැඳීම් පිළිබඳ වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරු යොදා ගනිමින් තීරණය කරනු ලැබේ. වට්ටම් අනුපාත, ඉදිරි වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පන ආයුගණක තක්සේරුවට ඇතුළත් වේ. මෙම සැලසුම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. සියළු උපකල්පනයන් එක් එක් වාර්තා කරන දිනයට සමායෝජනය කරනු ලැබේ.

අදාල වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ අපේක්ෂිත කාලයට අනුරූප කල් පිරීම සමග ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල පොලී අනුපාතය සලකා බලයි. ප්‍රසිද්ධියේ ලබා ගත හැකි මරණ වගු මත මරණ අනුපාතය ඉදිරි වැටුප් වැඩිවීම්, සමාගමේ අපේක්ෂිත ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය පදනම් වේ.

## 2.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 2.3.1 විදේශ මූල්‍ය පරිවර්තනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමූහයේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් වේ. විදේශ මුදල් ගනුදෙනුවේ දිනයේ ක්‍රියාකාරිත්වය මුදල් අනුපාත නියමය අනුවය. විදේශ මුදල්වලින් නම් කර ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයට විනිශ්චය තීරණයේ ක්‍රියාකාරී මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලැබේ. සියලු වෙනස්කම් ලාභ හෝ පාඩු සඳහා ගනු ලැබේ. විදේශ මුදල් වර්ගයක ඓතිහාසික පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය නොවන විෂයයන් මූලික ගනුදෙනු සිදුකරන දිනට විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ.  සියළු විනිමය විචලනයන් ලාභ හෝ පාඩු ප්‍රකාශයට අය කරනු ලැබේ.

### 2.3.2 බදු අය කිරීම්.

**ප්‍රවර්ථන බදු**

ප්‍රවර්ථන බදු ඉකුත් කළ පරිච්ඡේද සඳහා ප්‍රවර්ථන ආදායම් බදු වත්කම් සහ වගකීම් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අය කිරීමට හෝ ගෙවීමට අපේක්ෂිත මුදලට ගණනය කරනු ලැබේ. සමාගම ක්‍රියාත්මක වන හා බදු ආදායම උපදවන රටෙහි පනවා ඇති හෝ වාර්තාකරණ දිනයට නිත්‍ය ලෙස පනවනු ලබන වටිනාකම ගණනය කිරීම සඳහා බදු අනුපාත හා බදු නීති යොදාගනු ලැබේ.

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ හා එයට කරන ලද සංශෝධනවල විධිවිධානවල අනුකූලව බදු කාර්යය සඳහා ගැලපීම් කරන ලද පරිදි වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය මත පදනම් ව බදු සඳහා ප්‍රතිපාදනය කරනු ලැබේ. සියලු මෙහෙයුම් සමාගම් 28%ක ආදායම් බදු ගෙවීමට වගකිව යුතු ය.

**විලම්භිත බදු**

බැරකම් ක්‍රමය භාවිතා කරමින් වාර්තා කරන දිනයට වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර ඇතිවන සියලු තාවකාලික වෙනස්කම් හා මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා එහි ධාරණ අගයන් සඳහා විලම්භිත ආදායම් බදු දක්වා ඇත.

පහත සඳහන් කරුණු හැර, සියලු තාවකාලික බදු වෙනස්කම් සඳහා විලම්භිත ආදායම් බදු වගකීම් හඳුනාගනු ලැබේ.

- ව්‍යාපාර සම්බන්ධතාවයක් නොවන ගනුදෙනුවකදී වත්කමක හෝ වගකීමක මූලික හඳුනා ගැනීමෙන් පැන නගින විලම්භිත ආදායම් බදු සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට හෝ පාඩුවට බලපෑමක් නොවන විට; සහ

- තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය කිරීමේ වේලාව පාලනය කළ හැකි අවස්ථාවන් හිදී හැර පරිපාලිතයන්, ආශ්‍රිතයන් සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජන හා සම්බන්ධ බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් සහ අනාගතයේදී තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය නොවෙනු ඇත.

සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් භාවිතා නොකළ බදු බැර, හා භාවිතා නොකළ බදු පාඩු සඳහා යම් දුරකට විලම්භිත ආදායම් බදු වත්කම් හඳුනා ගනී. අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලට එරෙහිව බදු අය කළ යුතු ලාභ තිබිය හැකි අතර ඉදිරියට ගෙන එන භාවිතා නොකළ බදු බැර හා භාවිතා නොකළ බදු පාඩු පහත කරුණු හැර තිබිය හැකිය.

- ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයකළ හැකි ලාභයට හෝ පාඩුවට බල නොපාන ගනුදෙනුවකදී වත්කමක හෝ වගකීමක ආරම්භක හඳුනා ගැනීමෙන් පැන නගින අඩු කළ හැකි තාවකාලික වෙනස්කමට අදාළ විලම්භිත ආදායම් බදු වත්කමක් ඇති වූ විට, සහ

- පරිපාලිත, ආශ්‍රිත සමාගම්වල ආයෝජන හා බද්ධ ව්‍යාපාරවල පොලී, විලම්භිත බදු වත්කම් සම්බන්ධිත අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළව අනාගතයේදී ප්‍රතිවර්තනය වන තාවකාලික වෙනස්කම් සහ උපයෝජනය කළ හැකි තාවකාලික වෙනස්කම්වලට එරෙහි බදු අය කළ හැකි ලාභ පමණක් යම් දුරකට හඳුනා ගැනේ. වි

විලම්භිත බදු වත්කම්වල ධාරණ අගයන් එක්සත් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරන විලම්භිත බදු සියල්ල හෝ ඉන් කොටසක් උපයෝගී කර ගැනීමට සෑහෙන තරම් බදු අයකර ගත හැකි නොවන පමණට අඩු කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් හා වගකීම් මනිනු ලබන්නේ බදු වත්කම් උපලබ්ධි වන හෝ බදු බැරකම් නිරවුල් කරනු ලබන අවස්ථාවන් හිදී හෝ වාර්තාකරණ දිනයට ක්‍රියාත්මක වන හෝ පසුකාලීනව පනවනු ලබන හෝ නිත්‍ය වශයෙන් පනවනු ලබන අනුපාතිකයන් (සහ බදු නීති) අනුව වේ.

වෙනත් විස්තීර්ණ ආදායමේ හෝ සෘජුවම ස්කන්ධයේ පාදක වූ සම්බන්ධිත ගනුදෙනුව සඳහා වූ විෂයයන්ට අදාළව විලම්භිත බදු හඳුනා ගනී.

විලම්භිත බදු වත්කම් හා වගකීම් හිලව් කෙරෙනුයේ, විලම්භිත බදු වත්කම් විලම්භිත බදු වගකීම්වලට එරෙහිව විලම්බිත බදු වත්කම් හිලව් කිරීමට නීතිමය වශයෙන් බලාත්මක වූ අයිතියක් ඇත්තේ නම් හා විලම්භිත බදු එකම බදු අයකළ හැකි ආයතනයන් සම්බන්ධයෙන් වන විට හා සමාන බදු අධිකාරියක් ඇති විට ය.

**විකුණුම් බදු**

විකුණුම් හෝ සේවාවන් මිලට ගැනීමේදී ඇති විකුණුම් බද්ද බදු බලධාරීන්ගෙන් අය කර ගත නොහැකි වූ විට හැර ආදායම් වියදම් සහ වත්කම් විකුණුම් බද්දෙහි ශුද්ධ මුදල ලෙස හඳුනා ගැනේ. එහි විකුණුම් බද්ද වත්කමේ පිරිවැයෝ කොටසක් ලෙස හෝ ඇතුළත් කර ඇති විකුණුම් බද්ද සමග සඳහන් කර ඇති සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු වියදම් අයිතමයන්ගෙන් කොටසක් ලෙස හඳුනා ගැනේ. බදු බලධාරීන් සම්බන්ධයෙන් අය කරගත යුතු හා ගෙවිය යුතු විකුණුම් බදු මුදල වාර්තාකරන දිනයේ ලැබිය යුතු හා ගෙවිය යුතු හා ගෙවිය යුතු කොටසක් ලෙස ඇතුළත් කර ඇත.

### 2.3.3 ණය ගැනීම් පිරිවැය

වත්කමක අත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ණය ගැනීම් පිරිවැය ආරෝපණය කළ හැකි ය. එය අරමුණු කළ භාවිතය, හෝ විකණීම සඳහා සූදානම්වීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍යයෙන් ම ගතයුතු වන අතර අදාළ වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනික කෙරේ. අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් අස්තිත්වයක් දරණ පොලිය හා වෙනත් පිරිවැයවලින් ණය ගැනීම් පිරිවැය සමන්විත වේ.

### 2.3.4 පාරිභෝගිකයන් සමග ගිවිසුම්වලින් ආදායම

විදුලි බලය සැපයීම හා විදුලි මීටර් විකිණීමේ ව්‍යාපාරයෙහි සමූහය යෙදී සිටී. පාරිභෝගිකයන් සමග ගිවිසුම්වලින් ලැබෙන ආදායම භාණ්ඩ හෝ සේවා පිළිබඳ පාලනය පාරිභෝගිකයාට මාරු කළ විට, එම භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුවක් වශයෙන් සමූහය හිමිකම් ලැබීමට අපේක්ෂා කරන සලකා බැලීම පිළිබිඹු කරන මුදලකට හඳුනා ගැනේ. එහි ආදායම් වැඩ පිළිවෙලෙහි ප්‍රධාන ලෙස සමූහය විසින් සාමාන්‍යයෙන් නිගමනය කරයි.

පාරිභෝගිකයාට විදුලි බලය සපයන නියමිත වේලාවේදී ම විදුලි බලය සැපයීමට ආදායම හඳුනා ගනී.

විදුලි මීටර් විකුණුම්වලින් ආදායම තනි කාර්ය සාධන වගකීමක් විය යුතු බව සාමාන්‍යයෙන් අපේක්ෂා කෙරෙන අතර වත්කමේ පාලනය පාරිභෝගිකයා වෙත මාරු කරන අවස්ථාවේ සාමාන්‍යයෙන් උපකරණය භාරදීමේදී එය හඳුනා ගැනේ.

ගනුදෙනු මිලෙන් කොටසක් වෙන් කළ යුතු වෙනම කාර්ය සාධන බැඳීම් වන කොන්ත්‍රාත්තුවේ වෙනත් පොරොන්දු තිබේ ද යන්න සමූහය සලකා බලයි. (උදා:- වගකීම්) උපකරණය විකිණීම සඳහා ගනුදෙනු මුදල තීරණය කිරීමේ දී විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ බලපෑම, වැදගත් මූල්‍ය සංරචකවල පැවැත්ම, මුදල් නොවන ප්‍රතිෂ්ඨාව සහ පාරිභෝගිකයාට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව (තිබේ නම්) සමූහය සලකා බලයි.

- **විචල්‍ය ප්‍රතිශ්ඨාව**

කොන්ත්‍රාත්තුවක් සලකා බැලීමේදී විචල්‍ය ප්‍රමාණයක් ඇතුළත් නම්, භාණ්ඩ /සේවා පාරිභෝගිකයා වෙත මාරු කිරීම සහා හුවමාරුවක් වශයෙන් සමූහය විසින් සලකා බැලිය යුතු ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. විචල්‍ය ප්‍රතිශ්ඨාව කොන්ත්‍රාත්තුව ආරම්භයේදී ඇස්තමේන්තු කරන අතර විචල්‍ය ප්‍රතිශ්ඨාව සමග සම්බන්ධිත අවිනිශ්චිතතාව පසුව විසඳන විට හඳුනාගත් සමුච්චිත ආදායමේ සැලකිය යුතු ආදායම් ආපසු හැරවීමක් සිදු නොවීමට ඉඩ ඇති තෙක් එය සීමා කර ඇත.

- **වැදගත් මූල්‍ය සංරචකය**

සැලකිය යුතු මූල්‍යකරණ සංරචකයක් කොන්ත්‍රාත්තුව ආරම්භයේදී අපේක්ෂා කරන්නේ නම් එමගින් පොරොන්දු භාණ්ඩ හා සේවා පාරිභෝගිකයාට මාරු කිරීම හා එම භාණ්ඩ හා සේවා සඳහා වර්ෂයක් හෝ ඊට අඩු වන කාල පරිච්ඡේදයක් අතර අපේක්ෂිත ප්‍රතිශ්ඨා ප්‍රමාණය සමූහය විසින් ගලපනු නොලැබේ.

- **කොන්ත්‍රාත් ශේෂ**
- **කොන්ත්‍රාත් වත්කම්**

කොන්ත්‍රාත් වත්කමක් යනු පාරිභෝගිකයා වෙත මාරු කරනු ලබන භාණ්ඩ හෝ සේවාවන් සඳහා සලකා බැලීමේ අයිතියයි. පාරිභෝගිකයා ප්‍රතිශ්ඨාවට පෙර හෝ නියමිත ගෙවීමට පෙර භාණ්ඩ හෝ සේවා පාරිභෝගිකයා වෙත මාරු කිරීමෙන් සමූහය ක්‍රියා කරන්නේ නම් උපයාගත් ප්‍රතිශ්ඨාව සඳහා කොන්දේසි සහිත කොන්ත්‍රාත් වත්කමක් හඳුනා ගැනේ.

- **ලැබිය යුතු වෙළඳ ශේෂ**

කොන්දේසි විරහිතව ප්‍රතිශ්ඨාවේ ප්‍රචාරණයකට සමූහයට ඇති අයිතිය ලැබිය යුතු ශේෂ නියෝජනය කරයි. (එනම්, ප්‍රතිශ්ඨාව ගෙවීමට පෙර කාලය ගත කිරීම අනිවාර්ය වේ.)

- **කොන්ත්‍රාත් වගකීම්**

කොන්ත්‍රාත් වගකීමක් යනු පාරිභෝගිකයෙකුගෙන් සමූහය ලද ප්‍රතිශ්ඨාව හෝ සලකා බැලිය යුතු මුදලක් සඳහා පාරිභෝගිකයා වෙත භාණ්ඩ හෝ සේවා මාරු කිරීමේ වගකීමයි. පාරිභෝගිකයාට භාණ්ඩ හෝ සේවා සමූහය විසින් මාරු කිරීමට පෙර පාරිභෝගිකයා ප්‍රතිශ්ඨාව ගෙවන්නේ නම් ගෙවීම සිදු කරන විට හෝ ගෙවිය යුතු වීම (පළමු පැමිණෙන අවස්ථාවේ දී) කොන්ත්‍රාත් වගකිමක් හඳුනාගැනේ. කොන්ත්‍රාත්තුව යටතේ කාර්ය සාධන වගකීම් සමූහය ක්‍රියාත්මක කරන විට කොන්ත්‍රාත් වගකීම් ආදායම ලෙස හඳුනා ගනී.

- **මූල්‍ය ආදායම**

මූල්‍ය ආදායම, එකතු කිරීමේ හැකියාව ගැන සැකයක් ඇත්නම් මිස පොලී උපචිත ලෙස හඳුනා ගැනේ.

- **ලාභාංශ**

ගෙවීම ලබා ගැනීම සඳහා සමූහයට තිබෙන අයිතිය ස්ථාපිත වූ පසු ආදායම හඳුනා ගැනේ.

- **වෙනත් ආදායම**

වෙනත් ආදායම උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

- **පාරිභෝගික දායකය මත විලම්භිත ආදායම**

නව සේවා සම්බන්ධතා ස්ථාපිත කිරීම සඳහා ස්ථාපනය කර අති වත්කම්වල පිරිවැය අඩු කිරීම සඳහා පාරිභෝගිකයන්ගෙන් දායකත්වය විලම්භිත වගකීම් ලෙස හඳුනා ගැනේ. නව සේවා සම්බන්ධතා වර්ෂ 20 ක කාලයක් තුළ ක්ෂය කරනු ලැබේ. අනුරූප පාරිභෝගික දායකත්වය ඒ සමාන වර්ෂ 20 ක කාල පරිච්ඡේදයක් තුළ ලාභයට හෝ පාඩුවට ක්‍රමක්ෂය කරනු ලැබේ.

**2.3.5 අස්පෘශ්‍ය වත්කම්**

- **පරිගණක මෘදුකාංග**

නිශ්චිත මෘදුකාංග ලබා ගැනීම සහ භාවිතා කිරීම සඳහා වන පිරිවැය පදනම් කරගෙන අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනික කෙරේ. මෙම පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය වන වර්ෂ 5 තුළ ක්‍රමක්ෂය කෙරේ. පරිගණක මෘදුකාංග වැඩසටහන් පවත්වා ගැනීම සඳහා සම්බන්ධ පිරිවැය දරනු ලබන වියදමක් ලෙස හඳුනා ගැනේ.

- **තාක්ෂණික දැනුම**

තාක්ෂණික දැනුම ආරම්භකව පිරිවැයට ගණනය කරනු ලැබේ. වර්ෂ 15 ක ගිවිසුම්ගත කාල පරිච්ඡේදය තුළ මෙම පිරිවැය ක්‍රමක්ෂය කරනු ලැබේ.

**2.3.6 වෙළඳ තොගය**

සෙමින් චලනය වන හා යල්පැන ගිය අයිතමයන් සඳහා නියමිත වෙන් කිරීම් සිදු කිරීමෙන්පසු පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු මුදලට වෙළඳ තොගය දක්වා ඇත. සාමාන්‍ය ව්‍යාපාරයේ දී ශුද්ධ උපලබ්ධි අගය යනු ඇස්තමේන්තුගත විකුණුම් මිල වන අතර එය සම්පූර්ණ කිරීමේ පිරිවැය හා විකිණීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැයට අඩු ය.

පහත සඳහන් පිරිවැය සූත්‍ර යොදා ගනිමින්, වෙළඳ තොගය වර්තමාන ස්ථානයට හා තත්ත්වයන්ට ගෙන ඒමේදී දරන ලද පිරිවැය ගිණුම්ගත කෙරේ.

| | | |
|---|---|---|
| මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ | - | බර තැබූ සාමාන්‍ය පදනම මත තථ්‍ය පිරිවැයට |
| මාර්ගස්ථ බඩු හා වෙනත් තොග | - | තථ්‍ය පිරිවැයට |
| අමුද්‍රව්‍ය | - | බර තැබූ සාමාන්‍යය පදනම මත තථ්‍ය පිරිවැයට |
| නිමි භාණ්ඩ හා කෙරීගෙන යන වැඩ | - | නිෂ්පාදිත නිෂ්පාදනය කිරීමේ දී සෘජුද්‍රව්‍ය හා සෘජු ශ්‍රමය පිරිවැයට හා සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් කරගෙන ස්ථාවර හා විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය සඳහා සුදුසු අනුපාතයකට |
| මාර්ගස්ථ භාණ්ඩ | - | තථ්‍ය පිරිවැයට |

**2.3.7 මුදල් හා කෙටිකාලීන තැන්පතු**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා කෙටිකාලීන තැන්පතු බැංකුවේ හා අතැති මුදල් සහ මාස 03ක් හෝ ඊට අඩු කාලයක් තුළ කල් පිරෙන කෙටිකාලීන තැන්පතුවලින් සමන්විත වන අතර ඒවා වටිනාකම වෙනස්වීමේ ඉතා සුළු අවදානමකට යටත් වේ.

සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉහත නිර්වචනය කරන ලද පරිදි මුදල් හා කෙටි කාලීන තැන්පතුවලින් සමූහයේ මුදල් කළමනාකරණයේ පූර්ණ කොටසක් වශයෙන් සැලකෙන ගෙවිය යුතු බැංකු අයිරා අඩු කළ මුදල් හා මුදල් සමාන ශේෂවලින් සමන්විත වේ.

### 2.3.8 දේපල පිරියත හා උපකරණ

- **පිරියත ආකෘතිය**

සමූහය විසින් සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හැර දේපල, පිරියත හා උපකරණ සඳහා පිරිවැය ආකෘතිය යොදා ගනී. එවැනි දේපල සමුච්චිත ක්ෂය හා ඕනෑ ම හානිකරණ පාඩුවක් අඩු කළ අනුෂාංගික වියදමක් සහිත මිල දී ගැනීම් හෝ ඉදිකිරීම් පිරිවැයට වාර්තා කරයි.

- **ප්‍රත්‍යාගණන ආකෘතිය**

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලිවල සමස්ථ පන්තිය සඳහා ම ප්‍රත්‍යාගණන ආකෘතිය සමූහය විසින් යොදා ගනු ලැබේ. ඕනෑ ම පසු සමුච්චිත ක්ෂය සහ පසු සමුච්ජිත හානිකරණ පාඩු අඩු කරන ලද ප්‍රත්‍යාගණන දිනයට ඒවායේ සාධාරණ අගය වශයෙන් එම දේපල ධාරණය කරනු ලැබේ. ධාරණ අගයන් වාර්තාකරන දිනයට සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ව වෙනස් නොවන බවට තහවුරු කර කර ගැනීම සඳහා සමූහයේ සින්නක්කර ඉඩම් ගොඩනැගිලි වර්ෂ 3කට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.වත්කමක් ප්‍රත්‍යාගණනයේ දී ධාරණ අගයේ ඇති ඕනෑ ම වැඩිවීමක් වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගන්නා අතර ප්‍රාග්ධන සංචිතය යටතේ ස්කන්ධයේ සමුච්චිත වේ. නැතහොත් ලාභ හෝ පාඩු සඳහා අය කෙරෙන එම වත්කමට අදාළව පෙර ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය සහා යොදා ගැනේ. මෙහිදී පෙර ලියා හැරීම් යම් දුරක් සඳහා ආදායම ලෙස අඩුවීම හඳුනා ගැනේ.

ධාරණ අගයේ ඕනෑ ම අඩුවීමක් ලාභ හෝ පාඩු සඳහා වියදමක් ලෙස හඳුනා ගැනේ. නැතහොත් එම වත්කමට අදාළ ප්‍රාග්ධන සංචිතයේ පවත්නා ඕනෑ ම බැර ශේෂයක් සඳහා යම් දුරකට වෙනත් විස්තීර්ණ ආදායමේ හර කරනු ලැබේ. වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගන්නා ලද අඩුවීම ප්‍රාග්ධන සංචිත යටතේ හිමකම්වල සමුච්චිත ප්‍රමාණය අඩු කරයි. වත්කමක් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයේ ඉතිරිවන ඕනෑ ම ශේෂයක් වත්කමෙන් ඉවත්වීම හෝ අපහරණය මත රඳවාගත් ඉපැයුම් සඳහා සෘජුවම මාරු කෙරේ.

- **පසුව සිදුවන පිරිවැය**

දේපලක, පිරියතක හා උපකරණ විෂයයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පසුව සිදුවන පිරිවැය එහි ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට අත්වීමට ඇති හැකියාව මත එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනීම මත එම විෂයයේ ධාරණ අගයට හඳුනා ගැනේ. දේපල, පිරියත හා උපකරණවල එදිනෙදා සේවා කටයුතුවල පිරිවැය දරන ලද පරිදි ලාභ හෝ පාඩුවලට අය කෙරේ.

- **හඳුනාගත් වත්කම් පොත්වලින් ඉවත් කිරීම (De. recognition)**

දේපල, පිරියත හා උපකරණ විෂයයක ධාරණ අගය බැහැර කිරීමේදී හෝ එහි යොදා ගැනීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැතිවීම මත පොත්වලින් ඉවත් කෙරේ. දේපල, පිරියත හා උපකරණ විෂයයන් පොත්වලින් ඉවත් කිරීමේදී පැන නගින ලාභය හෝ පාඩුව එම විෂයය පොත්වලින් ඉවත් කිරීමේදී ලාභ හෝ පාඩුවලට ඇතුළත් කෙරේ.

දේපළ පිරියත හා උපකරණ විෂයයකදී ධාරණ අගයේදී ආදේශන පිරිවැය හඳුනා ගැනීමේදී ආදේශනය කරන කොටසේ ඉතිරිවන ධාරණ මුදල පොත්වලින් ඉවත් කෙරේ. ප්‍රධාන පරීක්ෂණ පිරිවැය ප්‍රාග්ධනිත කෙරේ. එවැනි එක් එක් ප්‍රාග්ධනිතයකදී පරීක්ෂණවල පූර්ව පිරිවැයේ ඉතිරි ධාරණ මුදල ඉවත් කෙරේ.

- **ක්ෂය කිරීම**

වත්කම් භාවිතයට ගත් දිනයේ සිට අපහරණය කරන දිනය දක්වා ක්ෂය වීම සඳහා සමූහය විසින් ලබා ගැනීමට අපේක්ෂිත වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභවල ආකාරය මත පදනම් වූ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් වීම කාලයට ඇතුළත් වන කාල පරිච්ඡේදයන් සඳහා සරල මාර්ග ක්‍රමය මත පදනම් වූ පහත සඳහන් අනුපාතයන්ට සමූහය විසින් ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමට අපේක්ෂා කෙරේ. ඉඩම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය නොකෙරේ.

විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති හෝ වත්කම ඉවත් කරන දිනට වත්කමක ක්ෂයවීම් නියමිත දිනට පෙර අවසන් වේ. වත්කම සම්පූර්ණයෙන් ක්ෂය නොවන්නේ නම් වත්කම නිෂ්කාර්ය හෝ සක්‍රිය භාවිතයෙන් තොර වන විට ක්ෂය වීම අවසන් නොවේ.

සමූහය විසින් භාවිතා කරන ලද ප්‍රධාන වාර්ෂික ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| **යටිතල පහසුකම් සැපයීම** | |
| උපපොළවල්, උඩු රැහැන් සහ පළාත් පාලන ආයතන හා ලංකා විදුලි බලමණ්ඩලයෙන් | |
| ලබාගන්නා ලද සේවා රැහැන් | 10% |
| උපපොළවල්, උඩු රැහැන් සහ ලංවිස විසින් ඉදිකරන ලද සේවා රැහැන් | 4%.5% |
| මෝටර් වාහන | 5% .- 20% |
| පරිගණක | 20% -. 33 . 1/3% |
| කාර්යාල උපකරණ | 15% . - 33 . 1/3% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% . - 33 . 1/3% |

**2.3.9 මූල්‍ය උපකරණ**

මූල්‍ය උපකරණයක් යනු එක් ආයතනයක මූල්‍ය වත්කමක් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීමක් හෝ හිමිකම් උපකරණයක් ඇති කරන ඕනෑම ගිවිසුමක් වේ.

**2.3.9.1 මූල්‍ය වත්කම්**

- **මූලික හඳුනා ගැනිම හා මිනුම්කරණය**

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබන්නේ පසුව මිනිනු ලබන ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීර්ණ ආදායම (OCI) මගින් සාධාරණ අගයට හා ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට වේ.

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය රඳා පවතින්නේ මූල්‍ය වත්කම්වල ගිවිසුගමිත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා සමූහයේ ව්‍යාපාරයේ ආකෘති අගය සැලකිය යුතු මූල්‍යකරණ අංගයක් අඩංගු නොවන ලැබිය යුතු වෙළඳ ශේෂ හෝ ඒ සඳහා සමූහය ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් යොදා ගැනීම හැරුණු විට සමූහය මුලින් ම මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ ඒහි සාධාරණ වටිනාකමට අමතරව මූල්‍ය වත්කමක ලාභයක් හෝ අලාභයක් ගනුදෙනු පිරිවැයක් මගින් සාධාරණ වටිනාකමක් නොමැති මූල්‍ය වත්කමකදී ය. ලැබිය යුතු වෙළඳ ශේෂවල සැලකිය යුතු මූල්‍යකරණ අංගයක් අඩංගු නොවේ.

මූල්‍ය ත්කමක් වර්ගීකරණය කිරීමට හෝ ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීර්ණ ආදායම මගනි සාධාරණ අගයට මැනීම සඳහා මුදල් ප්‍රවාහයක් ඉහළ නංවා ගැනීමට අවශ්‍ය වන අතර ඒවා ගෙවිය යුතු ප්‍රධාන මුදල මත "තනිකරම මූලික මුදල හා පොළිය ගෙවීම් (SPPI) වේ. මෙම තක්සේරුව " SPPI" ලෙස සඳහන් වන අතර එය උපකරණ මට්ටමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා සමූහයේ ව්‍යාපාර ආකෘතිය, මුදල් ප්‍රවාහයන් උත්පාදනය කිරීම සඳහා මූල්‍ය වත්කම් කෙසේ කළමනාකරණය කෙරේ ද යන්න අදහස් කෙරේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම, මූල්‍ය වත්කම් විකිණීම හෝ යන දෙක ම නිසා මුදලු ප්‍රවාහය සිදු වනු ඇතැයි ව්‍යාපාර ආකෘතිය තීරණය කරයි. වෙළඳපල තුළ නියාමනය හෝ සම්මුතිය මගින් (නිතිපතා වෙළඳම්) ස්ථාපිත කළ රාමුවක් තුළ වත්කම් භාරදීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම වෙළඳ දිනයේ දී හඳුනා ගැනේ. (එනම් වත්කම් මිලදී ගැනීමට හෝ විකිණීම සමූහය බැඳී සිටින දිනය)

- **පසු මිනුම්කරණය**

පසු මිනුම්කරණය සඳහා වර්ග 4ක් යටතේ මූල්‍ය වත්කම් විශ්ලේෂණය කෙරේ.

- ⋆ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට (ණය උපකරණ)
- ⋆ වෙනත් විස්තීර්ණ ආදායම මගින් සමුච්චිත ලාභ හා පාඩු (ණය උපකරණ) ප්‍රතිචක්‍රීයකරණය සමග මූල්‍ය වත්කම් සාධාරණ අගයට

- සමුච්චිත ලාභ හා පාඩු ප්‍රතිවර්ගීකරණයකින් තොරව වෙනත් විස්තීර්ණ ආදායම සාධාරණ වටිනාකමකින් නම් කරන ලද මූල්‍ය වත්කම් (හිමිකම් ලක්ෂණ)
- ලාභ හෝ පාඩු මගින් මූල්‍ය වත්කම් සාධාරණ අගයට

**මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය (ණය උපකරණ)**

මෙම වර්ෂය සමූහයට වඩාත් අදාළ වේ. පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම් සමූහයේ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණින් මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ පවත්වනු ලැබේ. සහ
- ගෙවිය යුතු මූලික මුදල සහ ගෙවිය යුතු මූලික මුදල මත පොළිය වන මුදල් ප්‍රවාහයන්ට මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන් හි ලබා දෙයි.

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් සඵල පොලී අනුපාත (EIR) ක්‍රමය යොදා ගනිමින් පසුව මනිනු ලබන අතර හානිකරණය සඳහා යටත් වේ. වත්කම ඉවත් කිරීම හෝ වෙනස් කිරීම හෝ හානිකරණය කිරීම සිදු කිරීමේදී වාසි හෝ පාඩු ලාභ හෝ අලාභවල හඳුනා ගැනේ.

ක්‍රමක්ෂය පිරිවැයට වන සමූහයේ වෙළඳ වත්කම්වල මුදල් හා කෙටිකාලීන තැන්පතු වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ සහ වෙනත් මූල්‍ය වත්කම් ඇතුළත් වේ.

**ශුද්ධ වත්කම්වල සාධාරණ අගය වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළින් දැක්වීම (හිමිකම් උපකරණ)**

වනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට නම් කරන ලද මූල්‍ය වත්කම් (හිමිකම් උපකරණ) ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති 32- මූල්‍ය උපකරණ ඉදිරිපත් කිරීම හා වෙළඳාම සඳහා පවත්වා නොගැනීම යටතේ කොටස්වල අර්ථ දැක්වීම සපුරාලන විට, මූලික හඳුනා ගැනීම මත සමූහයට තම කොටස් ආයෝජන වෙනත් විස්තීස්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කරන ලද කොටස් උපකරණ ලෙස ආපසු හැරවිය නොහැකි ලෙස වර්ගීකරණය කිරීම සඳහා තෝරා ගත හැකි ය. උපකරණයෙන් උපකරණය පදනම මත වර්ගීකරණය තිරණය කරයි.

මෙම මූල්‍ය වත්කම් මත වාසි හා පාඩු ලාභ හෝ අලාභවලට ප්‍රතිවර්ගීකරණය නොවේ. මූල්‍ය වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස අයකර ගැනීම ලෙස එයින් ලැබෙන ආදායමෙන් සමූහය ප්‍රතිලාභ ලබන විට හැර, ගෙවීමේ අයිතිය ස්ථාපිත කර ඇති විට, ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ වෙනත් ආදායම ලෙස ලාභාංශ සඳහා ගන්නා අතර එවැනි වාසි වෙනත් විස්තීරණ ආදායමේ වාර්තා කෙරේ. වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට නම් කරන ලද හිමිකම් උපකරණ හානිකරණ තක්සේරුවට යටත් නොවේ.

මෙම වර්ගීකරණය යටතේ එහි ලැයිස්තුගත නොකළ කොටස් ආයෝජන ආපසු හැරවිය නොහැකි ලෙස වර්ගීකරණය කිරීමට සමූහය තෝරා ගනී.

- **ඉවත් කිරීම.**

මූල්‍ය වත්කමක් හෙවත් අදාළ වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයකින් කොටසක් මූලිකව ඉවත් කරනුයේ,

- වත්කමෙන් මුදල් ප්‍රවාහයක් ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත්වී ඇති අවස්ථාවක

- සමූහය විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය පැවරීමට හෝ ලැබී තිබෙන මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව පරික්‍රමණ (pass through) වැඩපිළිවෙලක් යටතේ තෙවන පාර්ශවයකට සම්පූර්ණයෙන් ගෙවීමට බැඳීමක් කර ගෙන තිබෙන විට පහත සඳහන් දෙකෙන් එකක්, (අ) සමූහය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කිරීම හෝ (ආ) සමූහය විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර නොමැති හෝ සැලකිය යුතු ලෙස රඳවා ගෙන නොමැතිව වත්කම් පාලනය මාරු කිරීම.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීම සඳහා සමූහය සිය අයිතිය පැවරූවිට හෝ පරික්‍රමණ (pass through) වැඩ පිළිවෙලකට එළඹී ඇති විට එය තක්සේරු කරන්නේ සහ එය කොතරම් දුරකට හිමිකාරිත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ රඳවාගෙන ඇත් ද යන්නයි.

වත්කම්වල සියලු ආදායම් සහ විපාක සැලකිය යුතු ලෙස මාරු කර හෝ රඳවාගෙන නොමැති විට හෝ වත්කම් පාලනය මාරුකර නොමැති විට මාරු කළ වත්කම එහි අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට හඳුනා ගැනීම සමූහය අඛණ්ඩ සිදු කෙරේ. එහිදී සමූහය එහි සම්බන්ධිත බැඳියාවන් ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව මනිනු ලබන්නේ සමූහය විසින් රඳවාගෙන තිබෙන අයිතිවාසිකම් හා බැඳියාවන් පිළිබිඹු වන ආකාරයකට ය. මාරු කරන ලද වත්කම් සම්බන්ධයෙන් වූ ඇප සහතිකයක ස්වරූපය ගන්නා වූ අඛණ්ඩ සහභාගිත්වය මනිනු ලබන්නේ වත්කමේ මුල් වාරණ අගයක් සමූහයකට ගෙවීමට නියමිත විය හැකි උපරිම මුදලක් යන දෙකෙන් අඩු අගයකට ය.

- **මූල්‍ය වත්කම් හානිකරණය**

අපේක්ෂිත ණය පාඩු සඳහා :* සමූහය පාඩුදීමනා හඳුනාගනී.
- ක්‍රමක්ෂය පිරිවැයට මනිනි ලද මූල්‍ය වත්කම්
- වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණයආයෝජන සහ
- කොන්ත්‍රාත් වත්කම්

පහත සඳහන් මාස 12 ක අපේක්ෂිත ණය පාඩුවලට මනින ලද අවස්ථා හැර සමූහය විසින් පාඩු දීමනාව ජීවිත කාලය තුළ අපේක්ෂිත ණය පාඩු මුදලට සමාන මුදලකින් මනිනු ලැබේ.
- වාරතාකරණ දිනයට අඩු ණය අවදානමක් ඇතිවීමට තීරණය කරන ණය සුරැකුම්
- මූලික හඳුනාගැනීමේ සිට සැලකිය යුතු ලෙස ණය අවදානම වැඩි නොවූ වෙනත් ණය සුරැකුම් සහ බැංකු ශේෂ (එනම්, මූල්‍ය උපකරණයේ අපේක්ෂිත කාලයට වැඩියෙන් සිදුවන පැහැර හැරී අවදානම)

ලැබිය යුතු වෙළඳ ශේෂ සඳහා වන පාඩු දීමනාව සැම විටම මනිනු ලබන්නේ අපේක්ෂිත ණය පාඩු (ECLS) වල සම්පූර්ණ කාලයට සමාන ප්‍රමාණයට ය.

මූල්‍ය වත්කමක ණය අවදානම එහි මූලික හඳුනාගැනීමේ සිට සැලකිය යුතු ලෙස වැඩි වී ඇති බව තීරණය කිරීමේ දී හා අපේක්ෂිත ණය පාඩු ඇස්තමේන්තු කිරීමේදී අදාළ හා අධික පිරිවැය හා පරිශ්‍රමය නොමැතිව ලබා ගත හැකි සාධාරණ හා සහයෝගාත්මක තොරතුරු සමාගම සලකා බලයි. මෙහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු හා විශ්ලේෂණ ඇතුළත් වන අතර එහි සමාගමේ ඓතිහාසික පළපුරුද්ද පදනම් ව හා දන්වන ලද ණය තක්සේරුව හා ඉදිරිය දකින තොරතුරු ඇතුළත් ය.

පැහැර හැරිය හැකි අවදානම් සහිත මූල්‍ය වත්කමක් සමාගම පහත අවස්ථාවල දී සලකා බලයි.

- ණය ගැනුම්කරු ඔහුගේ ණය වගකීම් සම්පූර්ණයෙන් සමාගමට ගෙවිය නොහැකි වීම සමාගම විසින් සුරැකුම් (තිබේ නම්) උපලබ්ධි කිරීම වැනි කාර්යයන්ගෙන් ආධාර කිරීමෙන් තොරව හෝ
- මූල්‍ය වත්කම දින 90කට වැඩි කාලයක් දෙතුන් වූ විට

සම්පූර්ණ ජීව කාලය අපේක්ෂිත ණය පාඩු යනු මූල්‍ය උපකරණයක අපේක්ෂිත ජීව කාලය පුරාවට සිදු විය හැකි සියලු අතපසුවීම්වල ප්‍රතිඵලයක් වන අපේක්ෂිත ණය පාඩු ය.

- **අපේක්ෂිත ණය පාඩු ගිණුම්කරණය**

අපේක්ෂිත ණය පාඩු යනු ණය පාඩු පිළිබඳ විය හැකි බර තැබූ ඇස්තමේන්තුවකි. සියලු මුදල් ඌනතාවල වර්තමාන අගය ලෙස ණය පාඩු මනිනු ලැබේ. (එනම් ගිවිසුමට අනුකූලව ආයතනයේ ලැබිය යුතු මුදල් ප්‍රවාහ සහ සමාගම අපේක්ෂා කරන ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් හි වෙනසයි.)

අපේක්ෂිත ණය පාඩු මූල්‍ය වත්කමේ සඵල පොලී අනුපාතයට වට්ටම් කෙරේ.

- **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අපේක්ෂිත ණය පාඩු සඳහා වෙන් කිරීම ඉදිරිපත් කිරීම**

ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් සඳහා පාඩු දීමනා වත්කම්වල දළ ධාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට පෙන්වනු ලබන ණය සුරැකුම් සඳහා පාඩු දීමනාව ලාභ හෝ පාඩුවලට අය කරන අතර වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනා ගනු ලැබේ.

**ලියා හැරීම**

සමාගම මූල්‍ය වත්කමක් සම්පූර්ණයෙන් හෝ එහි කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් සමාගමට නොමැති විට, මූල්‍ය වත්කමක දළ ධාරණ අගය ලියා හරිනු ලැබේ. තනි පාරිභෝකයන් සඳහා, සමාන වත්කම් වල අය කිරීම් පිළිබඳ ඓතිහාසික පළපුරුද්ද මත පදනම්ව ලැබිය යුතු දින 360 ක් පසු වූ මූල්‍ය වත්කමකදී දළ ධාරණ අගය ලියා හැරීමේ ප්‍රතිපත්තියක් සමාගමට ඇත. ඒකාබද්ධ පාරිභෝගිකයන් සඳහා, අයකිරීමේ සාධාරණ අපේක්ෂාවන් තිබේද යන්න මත පදනම්ව කාලය හා ලියා හැරීමේ මුදල සම්බන්ධයෙන් තක්සේරුවක් සමාගම විසින් සිදු කරනු ලබයි. ලියා හරින ලද මුදලෙන් කිසිදු සැලකිය යුතු අය කිරීමක් සමාගම අපේක්ෂ නොකෙරේ. කෙසේ වුවද ලැබිය යුතු මුදල් අය සඳහා සමාගම් ප්‍රතිපත්ති වලට අනුකූල වීම සඳහා ලියා හරින ලද මූල්‍ය වත්කම් තවමත් බලාත්මකව අයකර ගැනීමේ කාර්යයන් සඳහා යටත් වේ.

**2.3.9.2 මූල්‍ය වගකීම්**

**මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය**

මූල්‍ය වගකීම් මූලික හඳුනා ගැනීමේදී වර්ගීකරණය කරනු ලබන්නේ ලාභ හෝ පාඩු, ණය හා ණය ගැනීම්, වෙනත් මූල්‍ය වගකීම් මගින් සාධාරණ අගයට මූල්‍ය වගකීම් ලෙස හෝ අදාළ පරිදි සඵල ඉදිරි රැකුමක ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කළ ව්‍යුත්පන්න ලෙසට ය.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන්  සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර, ණය සහ ණය ගැනීම් හා වෙනත් මූල්‍ය වගකීම්වලදී සෘජුවම ආරෝපණය කළ හැකි ශුද්ධ ගනුදෙනු පිරිවැයට ය.

වාර්තා කරන දිනයට සමූහයේ මූල්‍ය වගකීම් තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ සහ බැංකු අයිරාවක් ඇතුළත් වේ.

**පසු මිනුම්කරණය**

පහත පරිදි මූල්‍ය වගකීම්වල මිනුම්කරණය ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

**ණය හා ණය ගැනීම්**

මූලික හඳුනා ගැනීමෙන් පසු, සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගැනීම මගින් පොලී සහිත ණය සහ ණය ගැනීම් පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලැබේ. ලාභ හෝ පාඩුවල වාසි හා පාඩු හඳුනා ගනු ලබන්නේ වගකීම් ඉවත් කරන ටව් හා එසේ ම ක්‍රමක්ෂය ක්‍රියාවලියේ සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) මගිනි.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමේ ගාස්තු හෝ පිරිවැයට අදාළ සඵල පොලී අනුපාත ක්‍රමයේ වැදගත් කොටසක් වන කිසියම් වට්ටම් හා අධිමිල සැලකිල්ලට ගැනීමෙනි. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැයෙහි ඇතුළත් ය.

**ඉවත් කිරීම (De - recognition)**

වගකීමක් යටතේ බැඳීමක දී මූල්‍ය වගකීමක් ඉවත් කරනු ලබන්නේ, එම වගකීම් ඉටු වූ විට හෝ අවලංගු වූ විට එහි කල් ඉකුත් වූ විට ය. පවත්නා මූල්‍ය බැඳීමක් සැලකිය යුතු වෙනස් නියමයක් වන එම ණය දෙන්නාගෙන්ම ප්‍රතිස්ථාපනය වුවහොත් හෝ පවත්නා බැඳීම සැලකිය යුතු ලෙස විකරණයක් වුවහොත් එවැනි හුවමාරුවක් හෝ විකරණයක් මුල් වගකීමේ හඳුනා ගැනීම ඉවත් කරනු ලැබීමත් හා නව වගකීමක් හඳුනා ගැනීමක් වශයෙන් සලකන අතර අදාළ ධාරණ අයන්වල වෙනස ලාභ හෝ පාඩුවල හඳුනාගනු ලැබේ.

### 2.3.9.4 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් මුදල් ප්‍රමාණයන් හිලව් කිරීමට දැනට බලාත්මක කළ හැකි නීතිමය අයිතියක් තිබෙන විට හා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට හා සමගාමීව වගකීම් පියවීමට අභිප්‍රායක් තිබෙන විට පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරන අතර ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ.

### 2.3.9.5 සාධාරණ අගය මිනුම්කරණය

සාධාරණ වටිනාගම යනු මිනුම් දිනයකදී වෙළඳපොළ සහභාගි වන්නන් අතර විධිමත් ගනුදෙනුවක දී වත්කමක් විකිණීම සඳහා ලැබිය යුතු හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීම පදනම වන්නේ වත්කම විකිණීම හෝ වගකීම පැවරීම යන ගනුදෙනුව සිදු වේ යන උපකල්පනය මත ය.

- වත්කම් හෝ වගකීම් සඳහා වන ප්‍රධාන වෙළඳපොලේ හෝ
- ප්‍රධාන වෙළඳපොළක් නොමැති වීම, වත්කම් හෝ වගකීම් සඳහා වඩාත් වාසිදායක වෙළඳපොළක.

ප්‍රධාන හෝ වඩාත් ම වාසිදායක වෙළඳපොළ සමූහයට ප්‍රවේශ විය යුතු ය.

වෙළඳපොළ සහභාගී වන්නන් ඔවුන්ගේ ආර්ථික යහපත වෙනුවෙන් ක්‍රියා කරයි යැයි උපකල්පනය කරමින් වත්කම් හෝ වගකීම් මිල නියම කිරීමේදී වෙළඳපොල සහභාගී වන්නන් භාවිතා කරනු ඇත යන උපකල්පන භාවිතා කරමින් වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මනිනු ලැබේ.

මූල්‍යමය නොවන වත්කමක සාධාරණ අගය මැනීම, වත්කම එහි ඉහළම සහ හොඳම භාවිතයෙන් භාවිතා කිරීමෙන් හෝ වත්කම එහි ඉහළම සහ හොඳ ම භාවිතයට භාවිතා කරන වෙනත් වෙළඳපොළ සහභාගි වන්නකුට ඇති හැකියාව සැලකිල්ලට ගනී.

අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතය උපරිම කිරීමෙන් සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීමෙන් සුදුසු අවස්ථාවන් හිදී සහ සාධාරණ වටිනාකම මැනීමට ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි බැවින් සමූහය විසින් තක්සේරු කරන ක්‍රමවේදයක් භාවිතා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ වටිනාකම මනින හෝ අනාවරණය කරන සියලුම වත්කම් හා වගකීම් සමස්තයක් ලෙස සාධාරණ අගය මැනීමට වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව පහත විස්තර කර ඇති සාධාරණ අගය අනුපිළිවෙල තුළ වර්ගීකරණය කර ඇත.

මට්ටම් 1 : හඳුනාගත හැකි වත්කම් හෝ වගකීම් සඳහා ක්‍රියාකාරී වෙළඳපොළක ප්‍රකාශිත වෙළඳපොළ මිල (ගැලපීම් නොකළ)

මට්ටම් 2 : සාධාරණ අගය මැනීම සඳහා අවම මට්ටමේ යෙදවුම් සඳහා සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි තක්සේරු ශිල්පීය ක්‍රම

මට්ටම් 3 : සාධාරණ අගය මැනීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් සඳහා සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ නොහැකි තක්සේරු ශිල්පීය ක්‍රම

පුනරාවර්තන පදනමක් මත, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ලද වත්කම් හා වගකීම් සඳහා එක් එක් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ වර්ගීකරණය නැවත තක්සේරු කිරීමෙන් අනුපිළිවෙලහි මට්ටම් අතර මාරුවීම් සිදුවී ඇත්දැයි සමූහය තීරණය කරයි. (සමස්ථයක් වශයෙන් සාධාරණ අගය මිනුම්කරණය සඳහා වැදගත්වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම් ව)

ඉඩම් හා ගොඩනැගිලි, කොටස් ආයෝජනයන් වැනි පුනරාවර්ථන සාධාරණ අගය මිනුම්කිරීම සඳහා ප්‍රතිපත්ති හා පරිපාටි සමූහයේ කළමනාකරණය කරයි.

ඉඩම් හා ගොඩනැගිලි සහ මිල ප්‍රකාශිත නොවන මූල්‍ය වත්කම් වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් මැදිහත් වේ. වෙළඳපොළ දැනුම, ප්‍රසිද්ධිය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගන්නේ ද යන්න තෝරා ගැනීමේ නිර්ණායකට ඇතුළත් වේ. තක්සේරු ශිල්පීය ක්‍රම හා එක් එක් කාර්යයට යොදා ගන්නා යෙදවුම් සහිතව සමූහයේ බාහිර තක්සේරුකරු සමග සාකච්ඡාවලින් පසුව කළමනාකරණය විසින් තීරණය කරයි.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව යළි මිනුම්කරණය හෝ යළි තක්සේරු කිරීම අවශ්‍ය වන වත්කම්වල වටිනාකම්වල සංචලනයන් කළමනාකරණය විසින් එක් එක් වාර්තාකරන දිනයට විශ්ලේෂණය කරයි. මෙම විශ්ලේෂණය සඳහා තක්සේරුකරණ ගණනය කිරීම්වල තොරතුරු ගිවිසුම් සහ අදාළ වෙනත් ලියකිලිවලට එකඟවීමෙන් කළමනාකරණය නවතම තක්සේරුව සඳහා යොදන ප්‍රධාන යෙදවුම් පරීක්ෂා කරයි.

එසේ ම කළමනාකරණය සමූහයේ බාහිර තක්සේරුකරු සමග සංයෝජිතව වෙනස් කිරීම සාධාරණ ද යන්න තීරණය කිරීම සඳහා එක් එක් වත්කමේ සාධාරණ අගයෙහි වෙනස් කිරීම අදාළ බාහිර ප්‍රභවයන් සමග සසඳා බලයි.

සාධාරණ අගය හෙළිදරව් කිරීම් කාර්යය සඳහා වත්කමේ හෝ වගකීමේ ස්වභාවය, ලක්ෂණ හා අවදානම් සහ ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගයේ අනුපිළිවෙල මට්ටම මත පදනම්ව වත්කම් හා බැරකම්වල පන්තිය සමූහය විසින් තීරණය කරයි.

### 2.3.10 ආයෝජන දේපල

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලිවලින් ආයෝජිත දේපල සමන්විත වේ. ආරම්භකව ආයෝජන දේපලක් එහි පිරිවැයට මනිනු ලැබේ. මිලදී ගත් ආයෝජන දේපල පිරිවැය, එහි මිලදී ගැනීම් මිල සහ කිසියම් සෘජුව ආරෝපණය කළ හැකි වියදමකින් සමන්විත වේ. ස්ව ඉදිකිරීම් ආයෝජන දේපලෙහි පිරිවැය එම ඉදිකිරීම හෝ සංවර්ධනය සම්පූර්ණ කළ දිනයට වන පිරිවැය වේ.

ආයෝජන දේපල සඳහා පිරිවැය ආකෘතිය යොදා ගනී. ඒ අනුව ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කළ ඉඩම කිසියම් සමුච්චිත හානිකරණ පාඩු අඩු කළ පිරිවැයට දක්වා ඇත. ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කළ ගොඩනැගිලි කිසියම් සමුච්චිත ක්‍ෂය සහ කිසියම් හානිකරණ පාඩු අඩු කළ පිරිවැයට දක්වා ඇත.

**ක්‍ෂය**

ආයෝජන දේපල ලෙස සලකන ලද ඉඩම් මත ක්ෂය ප්‍රතිපාදනයක් සිදු නොකෙරේ.
සමූහයේ අනෙකුත් ආයෝජන දේපල සඳහා සරල රේඛිය ක්‍රමය මත වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයට අදාළ සංගත පදනම මත ක්‍ෂය කෙරේ.

ගොඩනැගිලි - වර්ෂ 40

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩ හා සේව නිෂ්පාදනය හා සැපයුම සඳහා හෝ පරිපාලන කටයුතු සඳහා සමූහය තුළ සමාගම් විසින් යොදාගෙන ඇති දේපල, දේපල පියරිත හා උපකරණ ලෙස සැලකෙන අතර එම දේපල අයත් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපල ලෙස එම දේපල සැලකේ.

### 2.3.11 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමාන බැඳීමක් (නෛතික හෝ නිර්මාණාත්මක) ඇති විට ප්‍රතිපාදන හඳුනා ගනී. වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමත් අවශ්‍ය විය හැකි අතර, වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාස දායක තක්සේරුවක් කළ හැකි ය. යම් හෝ සියලු ප්‍රතිපාදන ප්‍රතිපූර්ණය කිරීම සමූහය අපේක්ෂා කරන විට උදාහරණයක් ලෙස රක්ෂණ ගිවිසුමක් යටතේ, ප්‍රතිපූර්ණය වෙන ම වත්කමක් ලෙස හඳුනා ගෙන ඇති නමුත් ප්‍රතිපූර්ණය කිරීම එය සැබැවින් ම නිශ්චිත වූ විට පමණි. ඕනෑ ම ප්‍රතිපාදනයකට අදාළ වියදම ඕනෑ ම ප්‍රතිපූර්ණයක් අඩු කළ ලාභ හෝ පාඩුවල ඉදිරිපත් කරනු ලැබේ.

මුදල්වල කාල වටිනාකමෙහි බලපෑම ප්‍රමාණාත්මක නම් වගකීම් සඳහා විශේෂිත අවදානම් සුදුසු අවස්ථාවන් හිදී පිළිබිඹු වන ප්‍රවර්ථන බදු පෙර අනුපාතයන් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් භාවිතා කරන විට කාලය ගත වීම හේතුවෙන් ප්‍රතිපාදන වැඩිවීම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

**වගකීම් ප්‍රතිපාදන**

සමාගම චාරිත්‍රානුකූල ව්‍යාපාරික ප්‍රතිපත්තිවලට අනුකූලව අඩුපාඩු පිළිබඳ සාමාන්‍ය අලුත්වැඩියා සඳහා වගකීම් සපයයි. මෙම සහතික කිරීම් ආකාරයේ වගකීම් සඳහා ප්‍රතිපාදන, නිෂ්පාදිතය විකිණීමේදී හඳුනා ගැනේ. වගකීම් පිළිබඳ ආරම්භක ඇස්තමේන්තුව ආශ්‍රිත පිරිවැය වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

### 2.13.12 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

**නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

සේවක අර්ථසාධක අරමුදල් දායකයට හා සේවක භාරකාර අරමුදල් දායකයට අදාල ව්‍යවස්ථා හා රෙගුලාසිවලට අනුකූලව සේවකයන් හිමිකම් ලබා ඇත. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දළ පඩිනඩිවලින් පිළිවෙලින් 15% ක් හා 3% ක් සමාගම දායකත්වය සපයයි. මෙම පිරිවැය ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ ඇතුළත් වේ.

**නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික**

ස්වාධීන ආයුගණක උපදේශය සහිතව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් වූ පාරිතෝෂිකය පිළිබඳ ගිවිසුම්ගත විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය සමූහය විසින් ගණනය කරනු ලැබේ.

ඊළග නිත්‍ය ආයුගණක තක්සේරුව ලැබීමට පෙර, ඕනෑ ම කාලපරිච්ඡේදයක් සඳහා ගාස්තුව තීරණය කිරීමේ කාර්යය සඳහා සුදුසුකම්ලත් ආයුගණකයන් විසින් සපයනු ලබන දළ ඇස්තමේන්තුවක් භාවිතා කෙරේ.
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ පිරිවැය ප්‍රතික්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදාගනිමින් තීරණය කරනු ලැබේ. ශුද්ධ පොලිය හැර (සමූහයට අදාල නොවේ) ආයුගණකය වාසි හා පාඩුවලින් සමන්විත යළි මිනුම් කිරීම, වෙනත් විස්තීර්ණ ආදායම මගින් රඳවා ගත් ඉපැයුම්වලට අනුරූප හර හෝ බැර සමග එවා සිදු වන කාල පරිච්ඡේදයේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය වහාම හඳුනා ගනු ලැබේ. යළි මිනුම්කිරීම පසු කාල පරිච්ඡේදයන් සඳහා ලාභ හෝ පාඩුවලට යළි විශ්ලේෂණය කරනු ලැබේ.

ශුද්ධ පොළිය, ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම සඳහා වට්ටම් අනුපාතය යොදා ගනිමින් ගණනය කරනු ලැබේ. සමූහය විසින් ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ "විකුණුම් පිරිවැය" හා "පරිපාලන වියදම්" යටතේ ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල පහත වෙනස්වීම් හඳුනා ගනු ලැබේ.

- සේවා පිරිවැය, ප්‍රවර්ථන සේවා පිරිවැය, ඉකුත් සේවා පිරිවැය කප්පාදු කිරීම සහ සාමාන්‍ය නොවන නිරවුල් කිරීම් පිළිබඳ වාසි හා පාඩුවලින් සමන්විත වේ.
- ශුද්ධ පොලී වියදම හෝ ආදායම

කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව, අඛණ්ඩ සේවා කාලය වර්ෂ 5ක් සම්පූර්ණ වූ පසු පමණක් මෙම වගකීම පැනනගී. පාරිතෝෂික වගකීම සඳහා බාහිරව මූල්‍යයනය කරනු නොලැබේ.

### 2.3.13 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් හානිකරණය වී තිබෙන බවට කිසියම් ඇඟවීමක් තිබේ දැයි වාර්තා කරන සෑම දිනකටම සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් සිදුකිරීමට අවශ්‍ය වූ විට, සමූහය විසින් අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක නැවත අයකර ගත හැකි මුදල වනුයේ, වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ (CGU) සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩුකර ලැබෙන අගයත් ප්‍රයෝජ්‍ය අගයත් යන දෙකින් වැඩි අගයටය. වත්කම මුදල් ගලා ඒම ජනනය වන්නේ නම් මිස ඒවා වෙනත් වත්කම්වලින් හෝ වත්කම් සමූහයකින් විශාල ලෙස ස්වාධීන වේ. වත්කමක ධාරණ අගය හෝ මුදල් එම වත්කම හානිකරණය වුවක් ලෙස සලකා එහි නැවත අයකර ගත හැකි අගය දක්වා අඩු කරනු ලැබේ. ප්‍රයෝජ්‍ය අගය තක්සේරු කිරීමේ දී මුදලේ කාලීන අගයේ වත්මන් වෙළඳපොළ තක්සේරුව සහ වත්කමට සුවිශේෂී අවදානම් පිළිබිඹු වන බදු ගෙවීමට පෙර වට්ටම් අනුපාතයක් උපයෝගී කර ගෙන ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන අගය දක්වා වට්ටම් කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩුකළ සාධාරණ අගය තීරණය කිරීමේදී මෑත වෙළඳපොළ ගනුදෙනු තිබේ නම් ඒවා සැලකිල්ලට ගනී.

හඳුනා ගත හැකි එවැනි ගනුදෙනු නොවේ නම්, උචිත තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලැබේ. තක්සේරු ගුණාකාරයන් පොදුවේ වෙළඳාම් වන පරිපාලිතයන් හෝ වෙනත් ලබාගත හැකි සාධාරණ අගය දර්ශකයන් සඳහා මිල ප්‍රකාශිත කොටස් මිල මඟින් මෙම ගණනය කිරීම් තහවුරු කෙරේ.

පෙර ප්‍රත්‍යාගණනය කර එම ප්‍රත්‍යාගණනය වෙනත් විස්තීර්ණ ආදායම් වලට ඇතුළත්ව ඇති දේපළක් හැර අඛණ්ඩ මෙහෙයුම් වල හානිකරණ පාඩු ඉන්වෙන්ට්‍රි මත හානිකරණය ඇතුළත්ව හානිකරණය වූ වත්කමේ ක්‍රියාකාරිත්වය සහිත එම වියදම් වර්ගයන් ලාභ හෝ පාඩු යටතේ හඳුනා ගනී. මෙම අවස්ථාවේ දී, කිසියම් පූර්ව ප්‍රත්‍යාගණනයක මුදල දක්වා වෙනත් විස්තීර්ණ ආදායමේ හානිකරණයද හඳුනා ගනී.

කීර්තිනාමය හැර, වෙනත් වත්කම් සඳහා පෙර හඳුනා ගනු ලැබූ හානිකරණ පාඩු තවදුරටත් නොතිබෙන බවට හෝ අඩු වී තිබෙන බවට කිසියම් ඇඟවීමක් තිබේදැයි සෑම වාර්තා කරන දිනකටම තක්සේරුවක් කරනු ලැබේ. එවැනි ඇඟවීමක් තිබේ නම්, වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ අයකරගත හැකි මුදල සමූහය විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. පෙර කාල පරිච්ඡේදයන් සඳහා හඳුනා ගන්නා ලද හානිකරණ පාඩු තක්සේරු කරනුයේ, එක් එක් වාර්තාකරණ දිනයට පාඩුව අඩු වූ බවට හෝ තවදුරටත් පවත්නා බවට කිසියම් ඇඟවීම් සඳහාය. අයකර ගත හැකි මුදල තීරණය කිරීම සඳහා යොදා ගන්නා ඇස්තමේන්තුවල වෙනසක් තිබුණහොත් හානිකරණ පාඩුවක් ප්‍රතිවර්තනය කෙරේ. පෙර වර්ෂ වලදී වත්කම සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් හඳුනාගෙන තිබුණේ නම්, ක්ෂය අඩු වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකර ගැනීමේ අගය ඉක්මවා නොයන තෙක් හෝ තීරණය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයන තෙක් ප්‍රතිවර්තනය සීමා වේ.

ප්‍රත්‍යාගණිත අගයට වත්කම ඉදිරියට ගෙන නොගියහොත් එවැනි ප්‍රතිවර්තනයක් ලාභ හෝ පාඩු වල හඳුනා ගනු ලබන අතර ප්‍රතිවර්තනය ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ.

### 2.3.14 කල් බදු

සමූහය, ගිවිසුම ආරම්භයේදී ම ගිවිසුමක් ද, කල් බදු සමන්විත ද යන්න තක්සේරු කරයි. එනම් සලකා බැලීම සඳහා හඳුනාගත් වත්කමක් යම් කාලයක් සඳහා පාලනය කිරීමේ අයිතිය ගිවිසුම මගින් ලබා දෙන්නේ නම් ය.

#### සමූහය බදු ගන්නා ලෙස

කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම්වල කල්බදු හැර සෙසු සියලුම කල්බදු සඳහා සමූහය තනි පිළිගැනීමක් සහ ප්‍රවේශයක් භාවිතා කරයි. කල්බදු ගෙවීම් සිදු කිරීම සඳහා කල්බදු වගකීම සඳහා පාදක වූ වත්කම් භාවිතා කිරීමේ අයිතිය නියෝජනය කරන වත්කම් භාවිතා කිරීමේ අයිතිය සමූහය විසින් හඳුනා ගනී.

**වත්කම් භාවිතා කිරීමේ අයිතිය**

කල්බදු ආරම්භ වන දිනයේදී (එනම් පාදක වූ වත්කම භාවිතය සඳහා තිබෙන දිනය) වත්කම් භාවිතා කිරීමේ අයිතිය සමූහය හඳුනා ගනී. සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩුකල පිරිවැයට වත්කම් භාවිතා කිරීමේ අයිතිය ගණනය කරන අතර කල්බදු වගකීම පිළිබඳ කිසියම් යළි ගණනය කිරීමක් සඳහා ගැලපීම් කරනු ලැබේ. හඳුනාගන්නා ලද කල්බදු වගකීම් මුදල, දරණ ලද ආරම්භක සෘජු පිරිවැය සහ ලැබී ඇති බදු දීමනා අඩුකල ආරම්භක දිනයේ දී හෝ ඊට පෙර සිදුකරන ලද වත්කම් භාවිතා කිරීමේ අයිතියෙහි ඇතුළත් වේ. වත්කම් භාවිතා කිරීමේ අයිතිය පහත දැක්වෙන පරිදි කල්බදු කාල සිමාවේ කෙටි කාලයට වඩා වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයට සරල රේඛීය පදනමක් මත ක්ෂය කරනු ලැබේ.

- ඉඩම් හා ගොඩනැගිලි වර්ෂ 2-4 දක්වා

කල්බදු වත්කම්වල හිමිකාරිත්වය කල්බදු කාල සිමාව අවසානයේ දී සමූහයට පැවරුවහොත් හෝ පිරිවැය මිලදී ගැනීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරයි නම් වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය භාවිතා කර ක්ෂය ගණනය කරනු ලැබේ.

වත්කම් භාවිතා කිරීමේ අයිතිය ද හානිකරණයට යටත් වේ. මූල්‍ය නොවන වත්කම් හානිකරණයේ ගිණුම් ප්‍රතිපත්තියට යොමු වේ.

**කල්බදු වගකීම්**

කල්බදු ආරම්භක දිනයේදී කල්බදු කාල සීමාව සඳහා ගෙවිය යුතු කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට ගණනය කරන ලද කල්බදු වගකීම් සමූහය විසින් හඳුනා ගනී. කල්බදු ගෙවීම් යම් කිසි ලැබිය යුතු කල්බදුදීමනා අඩු කළ ස්ථාවර ගෙවීම්වල (ද්‍රව්‍යයක් ස්ථාවර ගෙවීම් ඇතුළුව) ඇතුලත් වේ.

කල්බදු ගෙවීම්වල වර්තමාන අගය ගණනය කිරීමේදී  කල්බදු සඳහා ගම්‍යවන පොලී අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නිසා කල්බදු ආරම්භ කල දිනයේදී සමූහය සිය වර්ධක ණය ගැනීම් අනුපාතය භාවිතා කරයි. ආරම්භක දිනයෙන් පසුව, පොලී අනුපාතය එකතු වීම සහ කල්බදු ගෙවීම් සඳහා අඩුකිරීම් පිළිබිඹු කිරීම සඳහා කල්බදු වගකීම්වල ප්‍රමාණය වැඩිකරනු ලැබේ.මීට අමතරව වෙනස් කිරීමක් තිබේ නම් කල් බදු සීමාවේ වෙනසක්, කල්බදු ගෙවීම්වල වෙනසක් හෝ පාදක වූ වත්කම මිලදී ගැනීම සඳහා විකල්පයක් තක්සේරු වේ . වෙනසක් තිබේ නම් කල්බදුවල වගකීම්වල ධාරණ අගය යළි ගණනය කරනු ලැබේ.

සමූහයේ කල්බදු වගකීම් තුළ පොලී සහිත ණය සහ ණය ගැනීම් ඇතුළත් වේ. (සටහන් 22 බලන්න.)

**සමූහය බදු කරු ලෙස**

සමූහය විසින් වත්කමක හිමිකාරිත්වය සඳහා ආනුශංගික වන සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සමූහය විසින් මාරු නොකරන කල් බදු මෙහෙයුම් කල් බදු ලෙස වර්ගීකරණය කෙරේ. ලැබෙන කුලී ආදායම කල්බදු කාල සීමාව තුළ සරල රේඛීය පදනම මත ගිණුම්ගත කරන අතර එහි මෙහෙයුම් ස්වභාවය හේතුවෙන් ලාභ හෝ පාඩු ප්‍රකාශනයෙන් ආදායමේ ඇතුළත් කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු ගිවිසුමක් ඇති කර ගැනීමේ දි දරන ලද මූලික සෘජු පිරිවැය කල්බදු ක්‍රමයට බදු දී ඇති වත්කමේ ධාරණ මුදලට එකතු කරන අතර කුලී ආදායමට සමාන පදනමක් මත කල්බදු කාල සීමාව තුළ හඳුනා ගැනේ.

**2.3.15 රජයේ ප්‍රදාන**

ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් තිබෙන විට හා සියලු අදාල කොන්දේසිවලට අනුකූල වන බවට තහවුරුවක් තිබෙන විට රජයේ ප්‍රදාන හඳුනා ගනී. ප්‍රදානය වියදම් අයිතමයකට අදාල වන විට හිලව් කිරීමට අදහස් කරන අදාල පිරිවැය වියදම් කරන කාල සීමාවන් තුළ ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ලෙස හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමකට අදාල වූ විට එය අදාල වත්කමේ අපේක්ෂිත ජීව කාලයට ආදායම ලෙස සමාන මුදල්වලින් හඳුනා ගැනේ.

විලම්භිත ආදායම ලෙස ප්‍රදානය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමූහය විසින් ඉදිරිපත් කරන අතර, එම ලාභ හෝ පාඩුවල ක්‍රමානුකූල පදනමක් මත හා ධාරිත්‍ර පදනමක් මත වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලය තුළ හඳුනා ගනී.

## 3. ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම හා හෙළිදරව් කිරීම්
**නව හා සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථ නිරූපනයන්**

සමූහය විසින් ශ්‍රී ලං මු වා ප්‍ර 16 සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති - 23 පළමු වරට යොදා ගෙන ඇත. මෙම නව ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනස්වීම්වල ස්වභාවය හා බලපෑම පහත විස්තර කෙරේ.

වෙනත් සංශෝධන හා අර්ථ නිරූපනයන් කිහිපයක් 2019 වර්ෂයේ පළමු වරට යොදා ගත් නමුත් එය සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට බලපෑමක් නොවේ. නිකුත් කරන ලද කිසිඳු ප්‍රමිතියක්, අර්ථ නිරූපනයක් හෝ සංශෝධනයක් සමූහය කලින් අනුගමනය කර නොතිබූ අතර තවමත් එයින් බලපෑමක් නොවේ.

**ශ්‍රීලංමූවාප්‍ර 16 - කල්බදු**

ශ්‍රීලංමූවාප්‍ර 17 කල්බදු අභිබවා  ශ්‍රීලංමූවාප්‍ර 16 ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 4 (IFRIC) විධිවිධානයක කල්බදු ඇතුළත් ද යන්න තීරණය කිරීම SIC - 15 මෙහෙයුම් කල්බදු - දීමනා සහ SIC - 27 කල්බදු වත්කමක නෛතික ආකෘතිය ඇතුළත් වන ගනුදෙනු ඇගයීම කල්බදු හඳුනාගැනීම, ගණනය කිරීම, ඉදිරිපත් කිරීම හා කල්බදු හෙළිදරව් කිරීම සඳහා හඳුනාගැනීම, මූලධර්ම ප්‍රමිතියේ සකස් කරන අතර බදු කරුවන් විසින් බොහෝ කල්බදු ශේෂ පත්‍රයේ හඳුනා ගැනීම සඳහා අවශ්‍ය වේ.

ශ්‍රීලංමූවාප්‍ර 16 යටතේ බදු කරු ගිණුම්කරණය වර්තමාන ශ්‍රීලංමූවාප්‍ර 17 යටතේ ගිණුම්කරණයෙන් සැලකිය යුතු ලෙස වෙනස් නොවේ. සමාන වර්ගීකරණ මූලධර්මය ශ්‍රීලංමූවාප්‍ර 17 යොදා ගනිමින් සියලු කල්බදු බදු කරුවන් අඛණ්ඩව වර්ගීකරණය කරන අතර මෙහෙයුම් කල්බදු හා මූල්‍ය කල්බදු යන වර්ග දෙක අතර වෙනස වර්ගීකරණය කෙරේ. එක් බැහැරවීමක් වන ශ්‍රීලංමූවාප්‍ර 16 න් අතරමැදි බදුකරු උප කල් බදු දීම වර්ගීකරණය අවශ්‍ය වන්නේ පාදක වත්කම සඳහා යොමු කිරීමට වඩා ප්‍රධාන කල්බදුවලින් පැන නගින වත්කම භාවිතා කිරීමේ අයිතියට යොමු කරමිනි. කෙසේ වුව ද මෙම වෙනස්වීම උප කල් බදු පිළිබඳ සමූහයේ වර්ගීකරණයට බලපෑමක් නොවේ. එබැවින් බදු කරු වන සමූහය සඳහා ශ්‍රීලංමූවාප්‍ර 16 බලපෑමක් නො කරයි.

2019 ජනවාරි 01 ආරම්භක යොදා ගැනීමේ දිනය සමග අනුගමනය කරන විකරණ අතීතානුයෝගී ක්‍රමය (odified strospechive ethod) යොදා ගනිමින් සමාගම ශ්‍රීලංමූවාප්‍ර 16 අනුගමනය කර ඇත. 2019 ජනවාරි 01 දිනට ගිවිසුමක් හෝ කල්බදු තිබේ ද යන්න නැවත තක්සේරු නොකිරීමට ප්‍රායෝගික උපයෝගිතා මාරුවීම යොදා ගැනීම (Transtion Practical Expedient) සඳහා සමාගම තෝරා ගෙන ඇත. ඒ වෙනුවට ශ්‍රීලංමූවාප්‍ර 17 යොදාගනිමින් සමාගම කල්බදු ලෙස පෙර හඳුනාගත් ගිවිස්මු සඳහා පමණක් ප්‍රමිතිය යොදා ගත් අතර ආරම්භක යොදා ගැනීම් දිනයේදී ජාමුවාප්‍ර 4 යොදාගෙන ඇත.

විවිධ ශාඛා සඳහා සමාගම සතුව කල්බදු කොන්ත්‍රාත් ඇත. ශ්‍රීලංමූවාප්‍ර 16 යොදා ගැනීමට පෙර, මූල්‍ය කල්බදු වත්කමක් ද හෝ මෙහෙයුම් කල්බදු වත්කමක් ද යන්න ආරම්භක දිනයේදී එහි එක් එක් (බදු ගන්නා ලෙස) සමාගම විසින් විශ්ලේෂණය කරන ලදී.

කෙටිකාලීන කල්බදු (කල් බදු කාලය මාස 12 හෝ ඊට අඩු කාලයන් සහිත කල්බදු) සහ අඩු වටිනාකම් සහිත කල්බදු වත්කම් හැර, සියලුම කල් බදු සඳහා තනි හඳුනා ගැනීමක් හා මිනුම්කරණ ප්‍රවේශයක් ශ්‍රීලංමූවාප්‍ර 16 අනුගමනය කිරීම මත සමාගම යොදා ගන්නා ලදී. සමාගම විසින් යොදා ගෙන ඇති විශේෂිත මාරුවීම් අවශ්‍යතා හා ප්‍රායෝගික ක්‍රියාමාර්ග ප්‍රමිතියෙන් සලසා ඇත.

**මෙහෙයුම් කල් බදු ලෙස පෙර ගිණුම්ගත කරන ලද කල්බදු**

කෙටිකාලීන කල්බදු (මාස 12 හෝ ඊට අඩු කල්බදු කාලයක් සහිත කල් බදු) සහ අඩු වටිනාකම් සහිත කල්බදු වත්කම් හැර මෙහෙයුම් කල්බදු ලෙස පෙර වර්ගීකරණය ලද එම කල්බදු සඳහා වත්කම් භාවිත කිරීමේ අයිතිය සහ කල්බදු වගකීම් සමාගම විසින් හඳුනාගෙන ඇත. ආරම්භක යොදා ගැනීම් දිනයේදී වර්ධක ණය ගැනීම් අනුපාතය භාවිතය හැර සැමවිටම ප්‍රමිතිය යොදා ගන්නා බැවින් ධාරණ මුදල මත පදනම් ව වත්කම් භාවිත කිරීමේ අයිතිය හඳුනාගන්නා ලදී.

සමහර කල් බදුවලදී යම්කිසි කලින් ගෙවන ලද හා පෙර හඳුනා ගන්නා ලද උපචිත කල් බදු ගෙවීම් සඳහා ගලපන ලද කල් බදු වගකීම්වලට සමාන මුදලක් මත පදනම් ව වත්කම් භාවිත කිරීමේ අයිතිය හඳුනා ගන්නා ලදී. ආරම්භක යොදා ගැනීමේ දිනයේදී වර්ධක ණය ගැනීම් අනුපාතය යොදා ගෙන වට්ටම් කරන ලද ඉතිරි කල්බදු ගෙවීම්වල වර්තමාන අගය මත පදනම් ව කල් බ දු වගකීම් හඳුනා ගනී.

සමූහය විසින් පහත සඳහන් ලබා ගත හැකි ප්‍රායෝගික ක්‍රියාමාර්ග ද අනුගමනය කරනු ලබයි.

- සාධාරණ සමාන ගුණාංග සහිතව කල් බදු කළඹ සඳහා තනි වට්ටම් අනුපාතයක් යොදා ගනී.
- ආරම්භක යොදා ගනීම් දිනයට පෙර, කල්බදු භාරදූර ද යන්න තක්සේරු කිරීම මත රඳා පවතී.
- ආරම්භක යොදා ගැනීම් දිනයේ සිට මාස 12ක් ඇතුළත අවසන් වන කල්බදු කාල සීමාව සහිත කල් බදු සඳහා කෙටි කාලීන කල් බදු බැහැරවීම් යොදා ගැනේ.
- ආරම්භක යොදා ගැනිම් දිනයට වත්කම් භාවිත කිරීමේ අයිතිය මිනුම්කරණයෙන් ආරම්භක සෘජු පිරිවැය ඉවත් කෙරේ.
- කල්බදු කාලය දීර්ඝ කිරීම හෝ අවසන් කිරීම සඳහා විකල්පයක් ගිවිසුමේ අඩංගු වු කල්බදු කාල සීමාව තීරණය කිරීම සඳහා පසු විපරම භාවිතා කෙරේ.

ඉහත කරුණු පදනම් කරගෙන 2019 ජනවාරි 01 දිනට,

- වත්කම් භාවිතා කිරීමේ අයිතිය හි රු. මිලියන 212,508 ක් (සමාගම) හඳුනා ගෙන ඇති අතර ඒවා "වත්කම් භාවිතා කිරීමේ අයිතිය" තුළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇත.

අතිරේක කල් බදු වගකීම් රු. මිලියන 212,508 ක් (පොලී සහිත ණය සහ ණය ගැනීම් තුළ ඇතුළත් කර ඇත.) හඳුනාගෙන ඇත.

**IFRIC අර්ථ නිරූපණය 23- ආදායම් බදු ගෙවීම් පිළිබඳ අවිනිශ්චිතතාවයන්**

ශ්‍රී ලං ගි ප්‍ර 12 යොදා ගැනිමට බලපාන අවිනිශ්චිතතතාවය ඇතුළත් බදු ගණනය කිරීමේදී ආදායම් බදු සඳහා ගිණුම්කරණයට අර්ථ නිරූපණය දක්වයි. එය ශ්‍රී ල ගි ප්‍ර ආදායම් බදු සඳහා ගිණුම්කරණයට අර්ථ නිරූපණය දක්වයි. එය ශ්‍රී ලං ගි ප්‍ර 12 විෂය පථයෙන් බාහිරව බදු හෝ ගාස්තු සඳහා අදාළ නොවන අතර එසේ ම අවිනිශ්චිත බදු ගණනය කිරීම ආශ්‍රිත පොලී සහ දඩවලට අදාළ නියමයන් ද විශේෂයෙන් ඇතුළත් නොවේ. අර්ථ නිරූපණය පහත සඳහන් කරුණුවලට විශේෂිතව යොමු කෙරේ.

- අස්ථිරත්වයක් විසින් වෙන ම අවිනිශ්චිත බදු ගණනය කිරීම් සැලකිල්ලට ගනු ලැබේ ද?
- බදු අධිකාරීන් විසින් බදු ගණනය කිරීම් පරීක්ෂා කිරීම පිළිබඳ අස්ථිරත්වයක් විසින් උපකල්පනය සිදු කෙරේ ද?
- බදු අයකළ හැකි ලාභය, (බදු පාඩු) බදු පදනම්, භාවිතා නොකළ බදු පාඩු, භාවිතා නොකළ බදු බැර හා බදු අනුපාත අස්ථිත්වයක් විසින් කෙසේ තීරණය කෙරේ ද?
- සාධක හා තත්ත්වයන්වල වෙනස්කම් අස්ථිත්වයක් විසින් කෙසේ සලකා බලනු ලැබේ ද?

එක් එක් අවිනිශ්චිත බදු ගණනය කිරීම් වෙන ම හෝ එකක් හෝ වැඩි ගණනක වෙනත් බදු ගණනය කිරීම් සමග සැලකිල්ලට ගැනීම සහ අවිනිශ්චිත තාවය පිළිබඳ යෝජනාව පුරෝකථනය කිරීමේ ප්‍රවේශය භාවිතා කිරීම සිදුවේද යන්න සමූහය තීරණය කරයි.

අර්ථ නිරූපණය යොදා ගැනීමේදී එම බදු ගණනය කිරීම් බදු අධිකාරීන් විසින් අභියෝගයට ලක්කරන විට කිසියම් අවිනිශ්චිත බදු තත්ත්වයන් ඇති ද යන්න සමූහය සැලකිල්ලට ගනී. බදු අධිකාරීන් විසින් එහි බදු ගණනය කිරීම් (පරිපාලිතයන් ද ඇතුළත් ව) පිළිගනු ලැබිය හැකි එහි බදු අනුකූලතාවය මත පදනම් ව සමූහය තීරණය කරනු ලැබේ. අර්ථ නිරූපණයෙන් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට බලපෑමක් ඇති නොවේ.

**3.1 සංසන්දනාත්මක තොරතුරු**

පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම උසස් ඉදිරිපත් කිරීමක් සඳහා හා ඒවා ප්‍රවර්තන වර්ෂය සමග අනුකූල වීම සඳහා සංශෝධනය කර ඇත. එහෙත් සමාගමේ හා සමූහයේ ප්‍රතිඵල සඳහා කිසිදු වෙනස්වීමක් සඳහා ඒවා හේතු නොවී ය.

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | **2019** | 2018 | **2019** | 2018 |
| | | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| **4** | **ආදායම** | | | | |
| | කර්මාන්ත | **4,554,172** | 4,429,734 | **4,554,172** | 4,429,734 |
| | හෝටල් | **1,153,342** | 1,173,299 | **1,153,342** | 1,173,299 |
| | ගෘහස්ත | **12,978,108** | 12,049,541 | **12,978,108** | 12,049,541 |
| | වාණිජ | **13,671,689** | 13,186,571 | **13,671,689** | 13,186,571 |
| | වීථි ආලෝකකරණය | **4,297** | 6,553 | **4,297** | 6,553 |
| | ආගමික ස්ථාන | **92,016** | 88,245 | **92,016** | 88,245 |
| | තාවකාලික සම්බන්ධතා | **6,933** | 9,946 | **6,933** | 9,946 |
| | මීටර් විකුණුම් | **1,250,373** | 883,201 | **-** | - |
| | විදුලි බලය විකුණුම් | **33,710,930** | 31,827,090 | **32,460,557** | 30,943,889 |
| **5** | **වෙනත් මෙහෙයුම් ආදායම** | | | | |
| | පාරිභෝගික දායකය ක්‍රමක්ෂය කිරීම | **381,033** | 362,256 | **381,033** | 362,256 |
| | රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | **5,813** | 5,562 | **5,813** | 5,562 |
| | පාරිභෝගිකයන්ගෙන් අයකර ගැනීම් | **363,969** | 360,025 | **363,969** | 360,025 |
| | දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීම/ බැහැර කිරීම මත වන ලාභ/ (පාඩු) | **(20,257)** | (14,655) | **(20,257)** | (14,655) |
| | විවිධ ආදායම් | **9,198** | 3,436 | **7,815** | 2,842 |
| | ලාභාංශ ආදායම | **1,993,636** | 1,165,881 | **1,993,636** | 1,169,326 |
| | | **2,733,393** | 1,882,505 | **2,732,010** | 1,885,355 |
| **6** | **ශුද්ධ මූල්‍ය ආදායම** | | | | |
| | **මූල්‍ය ආදායම** | | | | |
| | සේවක ණය පොලී සහ පාරිභෝගිකයන් සඳහා දුන් සහනදායී ණය මත පොලී | **23,550** | 60,916 | **23,432** | 60,536 |
| | කාලීන තැන්පතු මත පොලී | **1,517,813** | 1,271,180 | **1,513,110** | 1,265,426 |
| | රජයේ සුරැකුම් මත පොලී | **-** | 458 | **-** | - |
| | | **1,541,363** | 1,332,554 | **1,536,542** | 1,325,962 |
| | **මූල්‍ය පිරිවැය** | | | | |
| | පාරිභෝගික තැන්පතු මත පොලී වියදම | **78,331** | 13,680 | **78,331** | 13,680 |
| | බැංකු අයිරා මත පොලී වියදම හා බැංකු ගාස්තු | **19,565** | 6,627 | **2,621** | 2,746 |
| | කල් බදු පොලී | **15,472** | - | **15,472** | - |
| | ජා.ඉ.බැ. සූර්ය බල සංග්‍රාමය ණය යෝජනා ක්‍රමයේ වගකීම වෙනුවෙන් පොලිය සඳහා ප්‍රතිපාදන | **48,834** | 40,318 | **48,834** | 40,318 |
| | | **162,203** | 60,624 | **145,259** | 56,744 |

## 7 බදුවලට පෙර ලාභය

පහත සඳහන් ආයතමයන් ඇතුළත්ව සියලු වියදම් අය කිරීමෙන් පසුව බදු පෙර ලාභය දක්වා ඇත.

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2019** | 2018 | **2019** | 2018 |
| | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| **ආදායම** | | | | |
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | **1,441** | 4,034 | **1,441** | 3,999 |
| විගණන ගාස්තු | **2,800** | 3,152 | **2,500** | 2,700 |
| ක්ෂය - දේපල, පිරියත හා උපකරණ | **892,193** | 896,603 | **865,273** | 872,398 |
| ක්ෂය - වත්කම් භාවිතා කිරීමේ අයිතිය | **-** | - | **67,120** | - |
| ක්‍රමක්ෂය - අස්පෘෂ්‍ය වත්කම් | **12,392** | 16,756 | **12,392** | 14,923 |
| ආයෝජන දේපල මත ක්ෂය | **-** | - | **3,309** | 1,817 |
| පරිත්‍යාග හා දායක | **320** | 1,548 | **-** | - |
| මහජන සම්බන්ධතා හා ප්‍රචාරණය | **39,947** | 28,457 | **39,947** | 28,457 |
| යල්පැනගිය හා සෙමින් චලනය වන වෙළඳ තොග හානිකරණය | **74,115** | 49,898 | **74,115** | 49,898 |
| ලැබිය යුතු වෙළඳ ශේෂ හානිකරණය | **562,230** | (2,026) | **562,230** | 3,710 |
| සේවක පිරිවැය (සටහන් 7.1) | **3,258,693** | 3,188,212 | **3,220,282** | 3,178,961 |

### 7.1 සේවක පිරිවැය

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් හා වේතන | **1,803,483** | 1,787,790 | **1,781,595** | 1,782,941 |
| කාර්ය මණ්ඩලයට අදාළ වෙනත් පිරිවැය | **384,520** | 349,314 | **378,888** | 346,842 |
| ප්‍රසාද දීමනා | **216,466** | 222,143 | **214,603** | 221,746 |
| අතිකාල දීමනා | **392,558** | 388,090 | **388,218** | 387,740 |
| සේවක අර්ථසාධක අරමුදල් දායකය (EPF) | **249,771** | 248,081 | **247,120** | 247,423 |
| සේවක භාර අරමුදල් දායකය (ETF) | **49,985** | 49,893 | **49,411** | 49,752 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් (පාරිතෝෂිත) | **161,910** | 142,901 | **16,447** | 142,517 |
| | **3,258,693** | 3,188,212 | **3,220,282** | 3,178,961 |

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | **2019** | 2018 | **2019** | 2018 |
| | | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| **8** | **ආදායම් බදු වියදම** | | | | |
| | **ප්‍රවර්තන ආදායම් බදු වියදම** | | | | |
| | වර්ෂය සඳහා ලාභය මත බදු (සටහන් 8.1) | **715,543** | 644,202 | **704,212** | 644,202 |
| | පෙර වර්ෂයට අදාළව (අධි) ඌණ බදු ප්‍රතිපාදන | **(49,955)** | (18) | **(49,955)** | - |
| | වර්ෂය සඳහා බදු අය කිරීම (ප්‍රතිවර්තිත) | **598,925** | (408,055) | **586,713** | (396,779) |
| | **ප්‍රවර්තන ආදායම් බදු වියදම් (ප්‍රතිවර්තිත)** | **1,264,513** | 236,129 | **1,240,993** | 247,423 |

**8.1** **ආදායම් බදු.**

ආදායම් බදු වියදම් ප්‍රධාන සංරචක පහත පරිදි වේ.

| | 2019 | 2018 | 2019 | 2018 |
|---|---|---|---|---|
| බදු පෙර ලාභය | **3,999,758** | 3,173,831 | **3,927,792** | 3,217,304 |
| වෙනත් ආදායම් ප්‍රභවයන් | **(3,915,394)** | (2,863,923) | **(3,911,212)** | (2,857,545) |
| ඉඩ දිය හැකි අයිතම එකතුව | **(1,116,116)** | (921,988) | **(1,089,021)** | (858,351) |
| ඉඩ දිය නොහැකි අයිතම එකතුව | **1,717,610** | 1,142,687 | **1,684,128** | 1,114,841 |
| **ව්‍යාපාර ලාභය** | **685,859** | 530,606 | **611,687** | 616,249 |
| **වෙනත් ආදායම් ප්‍රභවයන්** | | | | |
| පොලී ආදායම් | **1,540,724** | 1,332,341 | **1,536,542** | 1,325,962 |
| බදු අයකළ යුතු පාරිභෝගික දායක ආදායම | **366,830** | 358,509 | **366,830** | 358,509 |
| **ව්‍යාපාරවලින් ව්‍යවස්ථාපිත ආදායම** | **2,593,412** | 2,221,456 | **2,515,059** | 2,300,720 |
| *අඩු කළා* | | | | |
| වර්ෂය තුළ උපයෝජනය කළ බදු පාඩුව | **(37,901)** | (6,336) | **-** | - |
| **බදු අය කළ යුතු ආදායම** | **2,555,511** | 2,215,119 | **2,515,059** | 2,300,720 |
| බදු අනුපාතය | **28%** | 28% | **28%** | 28% |
| **වර්ෂය සඳහා ලාභය මත බදු** | **715,543** | 644,202 | **704,217** | 644,202 |

**8.2** විලම්භිත බදු වියදම් / (ප්‍රතිවර්තිත)

| | 2019 | 2018 | 2019 | 2018 |
|---|---|---|---|---|
| තාවකාලික වෙනස්කම් ආරම්භය හා ප්‍රතිවර්තනය | **545,940** | (232,549) | **533,967** | (221,273) |
| **විලම්භිත බදු වියදම බෙදෙන ආකාරය** | | | | |
| වියදම හඳුනාගන්නේ, | | | | |
| ලාභ හෝ පාඩු | **598,925** | (408,055) | **586,731** | (396,779) |
| වෙනත් විස්තීර්ණ ආදායම | **(52,985)** | 175,506 | **(52,765)** | 175,506 |
| | **545,940** | (232,549) | **533,967** | (221,273) |

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | **2019** | 2018 | **2019** | 2018 |
| | | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| **8** | **ආදායම් බදු වියදම (සම්බන්ධිතයි)** | | | | |
| **8.3** | **විලම්බිත බදු වගකීම** | | | | |
| | වර්ෂයේ ආරම්භක ශේෂය | **573,810** | 806,359 | **583,733** | 805,005 |
| | තාවකාලික වෙනස්කම් ආරම්භය (පරිවර්තනය) | | | | |
| | ලාභ හෝ පාඩුවල හඳුනාගැනීම | **598,925** | (408,055) | **586,731** | (396,779) |
| | වෙනත් විස්තීර්ණ ආදායම් හඳුනාගැනීම | **(52,985)** | 175,506 | **(52,765)** | 175,506 |
| | වර්ෂ අවසාන ශේෂය | **1,119,750** | 573,810 | **1,117,700** | 583,733 |
| | පහත සඳහන් දේවලට අදාළව අවසාන විලම්භිත බදු වත්කම්, වගකීම් | | | | |
| | **විලම්භිත බදු වගකීම** | | | | |
| | බදු කාර්ය සඳහා වේගවත් කරන ලද ක්ෂය | **1,186,963** | 552,990 | **1,184,077** | 550,492 |
| | වත්කම් භාවිතා කිරීමේ අයිතිය | **3,150** | | **1,039** | |
| | ප්‍රත්‍යාගණනය මත බලපෑම | **745,385** | 745,385 | **745,385** | 745,385 |
| | වෙනත් විස්තීර්ණ ආදායම් සාධාරණ අගය - මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම | **53,693** | 98,112 | **53,693** | 98,112 |
| | | **1,989,191** | 1,396,487 | **1,984,194** | 1,393,990 |
| | **විලම්භිත බදු වත්කම** | | | | |
| | පාරිභෝගික දායකය මත විලම්භිත ආදායම | **(160,104)** | (280,331) | **(160,104)** | (280,331) |
| | සේවක ප්‍රතාලාභ වගකීම | **(320,370)** | (283,496) | **(319,603)** | (283,016) |
| | යල්පැන ගිය හා සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන | **(78,519)** | (99,271) | **(78,519)** | (99,271) |
| | අනාගත බදු අයකළ හැකි ආදායමට සාපේක්ෂව ලබා ගත හැකි බදු පාඩු | **-** | (10,612) | **-** | - |
| | වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ හානිකරණය සඳහා ප්‍රතිපාදන | **(310,449)** | (148,967) | **(308,269)** | (147,639) |
| | | **(869,441)** | (822,677) | **(866,495)** | (810,257) |
| | | **1,119,750** | 573,810 | **1,117,700** | 583,733 |

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව 2019 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන 28%ක බදු අනුපාතයට විලම්භිත බදු ගණනය කරන ලදී.

**8.4** 2007/2008 තක්සේරු වර්ෂය සඳහා නිකුත් කරනලද තක්සේරු දැන්වීමට එරෙහිව කරන ලද අභියාචනා පෙත්සමක් නිරවුල් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග 2009 දෙසැම්බර් 22 දින පවත්වන සාකච්ඡාව පරිදි පහත සඳහන් පදනම යටතේ පාරිභෝගික දායක සඳහා බදු අය කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකඟ වන ලදී.

- 2007/2008 තක්සේරු වර්ෂයේ සිට ඉදිරියට, ප්‍රාග්ධන දීමනා අනුපාතයට අනුරූප වන පරිදි පාරිභෝගික දායකය බදු වලට යටත් වනු ඇත.

- 2007/2008 තක්සේරු වර්ෂය ආරම්භයට තිබෙන පාරිභෝගික වර්ෂ 20 ක කාලයක් සඳහා ක්‍රමක්ෂය ගිණුම්කරණ පදනම මත බදු අය කෙරේ.

ඒ අනුව අදාළ කාල පරිච්චේදයන් සඳහා සමාගම විසින් 2007/08 සිට 2017/18 දක්වා අදාළ වන ප්‍රාග්ධන දීමනා පදනම් ව පාරිතෝෂික දායකය සඳහා බදු අය කෙරේ.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හඳුන්වාදීමත් සමග 2009/12/22 දිනැති ඉහත තීරණයට අදාළත්වයක් නොමැත.

එබැවින්, 2018/19 සිට ඉදිරියට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 21 වගන්තියේ විධිවිධාන අනුගමනය කරමින් ආදායම් ප්‍රකාශයන් හඳුනාගත් ආදායම සපරිදි බදුවලට යටත් වනු ඇත. ඒ අනුව, පාරිභෝගික දායකය ගිණුම්කරණ ක්‍රමක්ෂය පදනම මත වර්ෂ 20 ක කාලයක් සඳහා බදුවලට යටත් වේ.

## 9 කොටසකට මූලික ඉපැයුම

**9.1** වර්ෂය තුළ නිකුත් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ බර තැබූ සාමාන්‍යය මගින් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වර්ෂයට අදාළ ශුද්ධ ලාභය බෙදීම මගින් කොටසකට මූලික ඉපැයුම ගණනය කරනු ලැබේ.

**9.2** කොටසකට මූලික ඉපැයුම ගණනය කිරීමේදී, ආදායම හා යොදා ගන්නා ලද දත්ත පදහත සඳහන් දත්තවලින් නිරූපණය වේ.

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2019** **රු. 000** | 2018 රු. 000 | **2019** **රු. 000** | 2018 රු. 000 |
| ලවය සඳහා යොදාගත් අගය | | | | |
| සාමාන්‍ය කොටස් හිමියන්ට වර්ෂයට අදාළ ශුද්ධ ලාභය | **2,720,852** | 2,946,320 | **2,686,799** | 2.969.879 |
| හරය ලෙස යොදාගත් සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | | | | |
| වර්තමාන සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | **114,507** | 114,507 | **114,507** | 114.507 |
| **කොටසකට මූලික ඉපැයුම** | **23.76** | 25.73 | **23.46** | 25.94 |

## 10 දේපල, පිරියත හා උපකරණ

### 10.1 සමූහය

| | සින්නක්කර ඉඩම් එකතුව | සින්නක්කර ගොඩනැඟිලි | මෝටර් වාහන | පරිගණක | කාර්යාල උපකරණ | පිරියත හා යන්ත්‍රෝපකරණ | යටිතල පහසුකම් සැපයීම | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ***පිරිවැය / සාධාරණ අගය*** | | | | | | | | | |
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 2,835,857 | 906,667 | 1,456,955 | 358,898 | 435,758 | 151,912 | 22,454,165 | 884,541 | 29,484,752 |
| එකතු කිරීම් | 12,738 | 67,153 | 5,978 | 13,507 | 74,728 | 12,726 | 1,072,413 | 1,232,171 | 2,491,415 |
| මාරු කිරීම් | - | - | - | - | - | - | - | (1,118,216) | (1,118,216) |
| අපහරණය කිරීම් | - | (2,116) | (6671) | - | - | - | (79,303) | (3,377) | (91,467) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,848,595** | **971,704** | **1,456,262** | **372,405** | **510,486** | **164,638** | **23,447,275** | **995,119** | **30,766,476** |
| ***ක්ෂය*** | | | | | | | | | |
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | - | 34,652 | 834,229 | 296,662 | 364,353 | 76,367 | 14,710,301 | - | 16,316,565 |
| වර්ෂය සඳහා ක්ෂය | - | 29,579 | 133,890 | 24,947 | 53,421 | 18,363 | 635,301 | - | 895,501 |
| අපහරණය කිරීම් / ගැලපීම් | - | (101) | (6,671) | - | - | - | (52,539) | - | (59,312) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **64,130** | **968,119** | **321,609** | **417,774** | **94,730** | **15,293,063** | **-** | **17,152,755** |
| **ලියා හැරි අගය** | | | | | | | | | |
| **- 2019 දෙසැම්බර් 31 දිනට** | **2,848,595** | **907,574** | **488,143** | **50,796** | **92,712** | **69,908** | **8,154,212** | **995,119** | **13613,721** |
| - 2018 දෙසැම්බර් 31 දිනට | 2,835,857 | 872,014 | 622,725 | 62,236 | 71,405 | 75,545 | 7,743,863 | 884,541 | 13,168,188 |

10 දේපල, පිරියත හා උපකරණ

10.2 සමාගම

| | සින්නක්කර ඉඩම් | සින්නක්කර ගොඩනැඟිලි | මෝටර් වාහන | පරිගණක | කාර්යාල උපකරණ | යටිතල පහසුකම් සැපයීම | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ***පිරිවැය/ සාධාරණ අගය*** | | | | | | | | |
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 2,807,328 | 725,984 | 1,358,864 | 355,877 | 496,195 | 22,454,163 | 884,569 | 29,082,980 |
| එකතු කිරීම් | 12,738 | 67,153 | 5,978 | 13,507 | 74,112 | 1,072,413 | 1,175,233 | 2,421,135 |
| මාරු කිරීම් | - | - | - | - | - | - | (1,118,216) | (1,118,216) |
| තැන්පතු | - | (2,116) | (6,671) | - | - | (79,303) | (3,377) | (91,467) |
| **2019 දෙසැම්බරර් 31 දිනට ශේෂය** | **2,820,066** | **791,021** | **1,358,171** | **369,384** | **570,307** | **23,447,273** | **938,209** | **30,294,432** |
| ***ක්ෂය*** | | | | | | | | |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 28,602 | 811,017 | 294,477 | 363,395 | 14,710,302 | - | 16,207,792 |
